අධිකරණ කටයුතු විෂයයෙහි සිංහලය භාවිත කළ යුතුයයි පවසත්ම, මේ ප්‍රතිෂ්ඨාපිත ආයතනයේ දුක්ගන්නා රාලලා සිංහලෙන් නඩු ඇසීමට තරම්, ඇපැල් උසාවියේ ඇපැල් නඩු ඇසීමට තරම් සිංහලය දියුණු නැතැයි කොදුරනු ඇසේ. පහළ උසාවිවල සාක්කි සිංහලෙන් ඇසුවත්, භරස්ප්‍රශ්න සිංහලෙන් ඇසුවත්, අභියාචනා අධිකරණයේ දී සිංහලෙන් තර්ක කිරීමට තරම් හෙළ බස අපොහොසත්යයි, ප්‍රමාණවත් නොවේ යයි මොවුහු තර්ක කරති. ඉංගිරිසි ගැත්තවුන් ඉදිරිපත් කරන තර්ක අතුරින් දුප්පත්ම නිවටතම තර්කය මෙය බව නොකියා බැරිය. ඉංගිරිසියේ හා එහි ගැත්තවුන්ගේ හෙලුව හෙළිකරන අන්කිසි කියමනක් නැති තරමිය. හෙළයේ හර බර ගතිය, සවිශක්තිය, ගැඹුර හා සරලත්වය, සුබ නම්‍ය භාවය හා මට සිලිවි බව, හෙළ බස වහරන්නෝ හොඳින් දනිති. එය නොදන්නවුන්, එය අකැමැත්තවුන්, හෙළයේ දුබල කම් ගැන කියන කබල් කතාවලට පිළිතුරු දීමට මේ නොතැනි. බුදුදහමේ ගැඹුරුම දර්ශනය—අභිධර්මය—ලියා තැබීමට තරම් හෙළ බස සමත් වී නම්, බෙදුම් නඩුවක ඉඩම් කොටසක් අයිතිවිය යුත්තේ කවරෙකුට දැයි විනිශ්චය කොට ගරු විනිශ්චයකාර තුමෙකුට නඩු නීන්දුවක් ලීවීමට තරම් එය අපොහොසත් දැයි සිංහල නොදත් මේ ඉංගිරිසි පණ්ඩිතයින් අවබෝධ කට යුතුය.

අධිකරණයේ සිංහල භාවිතය ගැන සඳහන් කරන්ම, මේ ඉංගිරිසි විද්‍යාලවල ආදී ශිෂ්‍ය සංගම් කාරයින් මට විරුද්ධව නගන චෝදනාවක් නම්, එය මගේ වාසිය සැලසෙන දෙයක් බවය. මෙයද, සිංහලට බය මේ කලු සුදු පෙලැන්තියේ තර්ක ශූන්‍යත්වය හෙලි කරන තවත් බොල් කියමනකි. මා අධිකරණ—නීති වෘත්තියේ සංශෝධන ගැන සඳහන් කරනුයේ, මහජන පීඩාවක්ව පවත්නා එය පොදු ජන සේවයක් බවට පත්කළ යුතුයයි යෝජනා කරනුයේ මගේ මඩිය පුරවා ගැනීමේ වෙනුවෙන් නොවේ. මේ හරයක් නැති චෝදනාව යලිත් වරක් පසුගියදා පාර්ලිමේන්තුවේ දී ද මතු කරන ලදී. ඉංගිරිසි කලු සුද්දන්ගේ ප්‍රතිෂ්ඨාපිත ආයතනයේ අග්‍ර පුරෝහිත අග්‍රාමාත්‍ය ඩඩ්ලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පෞද්ගලික මන්ත්‍රීන්ගේ කෙටුම්පත් පනත්

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

සේනානායක මහතාගේ මුවින් ම මේ චෝදනාත්මක අභියෝගය පසුගියදා නිකුත් විණි. අධිකරණයේ පමණක් නොව පාර්ලිමේන්තුවේ පවා සිංහලට තැනක් නැති බවත් පෙන්නුම් කර දුන් අවස්ථාවේදී ගරු ඩඩ්ලි සේනානායක මහතා කිවේ කුමක්ද?.....

"ගරු ඩඩ්ලි සේනානායක: මොකටද මේ බොරු? ..... උසාවියේ භාෂාව ගැන පනතක් අපේ ආණ්ඩුව නොවෙයි ගෙනාවෙ. තමා අවංක ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා නම් උසාවියේ කටයුතු ප්‍රතික්ෂේප කරන්ට ඕනෑ. අවංකභාවය ඔප්පු කරන්න ඕනෑ එහෙමයි ....." [1966 අගෝස්තු 19 හැන්සාඩ් වාර්තාවේ 58 වැනි තීරුව]

මට චෝදනා කළේ එසේ යි.

ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමතිසහ අග්‍රාමාත්‍යතුමාගේත් රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இரா ஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

I rise to a point of Order. According to the Standing Orders—

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා. (දොම්පෙ)

(திரு. எப். ஆர். டயஸ் பாண்டாரநாயக்க —தொம்பே)

(Mr. F. R. Dias Bandaranaike—Dompe)

දෙමළෙන් කියන්න.

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

The Standing Orders are in English.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.

(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)

(Mr. F. R. Dias Bandaranaike)

දෙමළෙනුත් තියෙනවා.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ කෙටුම්පත් පනත්

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

I leave that for you to do.

Standing Order 51 (1) states that any private Member desiring to introduce a Bill shall apply to the House for leave to do so, stating at the same time the objects and leading features of such Bill.

The hon. Member cannot, at this stage, make a Second Reading speech.

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

The hon. Member should make his speech as short as possible.

ප්‍රින්ස් ගුණසේකර මයා.

(திரு. பிறின்ஸ் குணசேக்கர)

(Mr. Prins Gunasekera)

ගරු කථානායකතුමනි, තව මිනිත්තු 5 කින් ඉවර කරනවා.

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

ලීහුඩු ලෙස අදහස් ප්‍රකාශ කරන්ට ඕනෑ.

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

My point is that this is not a Debate. If the hon. Member criticizes others, then those others must also have a right to reply. The hon. Member is referring to the Prime Minister but the Prime Minister will have no chance now of replying.

ප්‍රින්ස් ගුණසේකර මයා.

(திரு. பிறின்ஸ் குணசேக்கர)

(Mr. Prins Gunasekera)

කථානායකතුමනි, තව මිනිත්තු පහකින් මේක ඉවර කරන්ට පුළුවන්වෙයි කියල මම හිතනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

මේ වෙලාවට ඔව ඉදිරිපත් කරන්ට බැරි බව ගරු මන්ත්‍රීතුමා දන්නව. මේ පනත සභාව ඉදිරියට ආවාම ඔය සේරම කරුණු කියන්ට ගරු මන්ත්‍රීතුමාට ඉඩක් ලැබෙනව. ඒ නිසා කෙටියෙන්, බොහොම ලුහුඩින් කරුණු ඉදිරිපත් කරන්න.

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

මේක වාදයක් නොවෙයි.

ප්‍රින්ස් ගුණසේකර මයා.

(திரு. பிறின்ஸ் குணசேக்கர)

(Mr. Prins Gunasekera)

මේ සුළු කොටස කියවල, මම වාඩි වෙනව.

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

කරුණාකර කොටින් කියන්න.

ප්‍රින්ස් ගුණසේකර මයා.

(திரு. பிறின்ஸ் குணசேக்கர)

(Mr. Prins Gunasekera)

"හෙදයි අගමැතිතුමනි, ඔප්පු කර බලමු, අප දෙදෙනාගේ අවංකභාවය. මා උසාවියේ කටයුතු ප්‍රතික්ෂේප කළ විට උසාවියේ වැඩ සිංහලෙන් කෙරෙනවාද? අගමැතිතුමා කියන විදියට මා උසාවියේ කටයුතු ප්‍රතික්ෂේප කළ විට උසාවියෙන් ඉංගිරිසිය තුරන් වෙනවාද? නීතිඥ වෘත්තියේ අවශ්‍ය වෙනස්කම් සිදු වෙනවාද? නීති විද්‍යාලය නොමිළයේ නීති අධ්‍යාපනය සපයනවාද? නඩු කියන දුප්පතුන්ට රජයේ නීති ආධාර සැපයෙනවාද? මේ හැම යහපතකටම අවතිරයක්ව පවතින්නේ රජයේ නීති ආධාර සැපයිය යුතුයයි, නීති වෘත්තිය සංශෝධනය කළ යුතුයයි, පෙරකදෝරු අධිනීතිඥ හේදය තුරන් කළ යුතුයයි, අධිකරණයේ සිංහල භාවිතය කළ යුතුයයි උද්ඝෝෂණය කරන මා දැයි —මා උසාවියේ වැඩ කිරීමදැයි—අගමැතිතුමා ගෙන් ප්‍රශ්න කරනු කැමැත්තෙමි. මොකටද මේ බොරු, අගමැතිතුමනි? ඔබත්, ඔබ නායකත්වය දරන ඉංගිරිසි සමාජයත්—ඉංගිරිසියෙන් සිතන, ඉංගිරිසියෙන් කථා කරන, ඉංගිරිසියෙන් කන බොන අඳින පළඳින, යන එන, නටන පණින, නිදන විට සිහින පවා ඉංගිරිසියෙන් දකින, අධිරාජ්‍ය සුගයේ

ප්‍රතිෂ්ඨාපිත පිරමීඩයේ පදනම—සොලවන සිංහල භාෂා ප්‍රශ්නයට බියෙන් මෙවැනි අනන්මනක් දෙඩවීම දැන්වත් නතර කළ යුතුය.

අගමැතිතුමා කරන මේ අභියෝග කථාවට පිළිතුරු දීමට මම ඉදිරිපත් වෙමි."

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

ඔය සේරම මේ වෙලාවට කියන්න බැරි බව මන්ත්‍රීතුමා දැනගන්ට ඕනෑ. කාරණා සේරම ඉදිරිපත් කළොත් අනිත් පැත්තෙනුත් කථා කරන්ට සිදු වෙනව. මිනිත්තු 5කින් කොටින් කියනව කිව්ව නිසා මම මෙච්චර වෙලා මන්ත්‍රීතුමාට ඉඩ දුන්න.

ප්‍රින්ස් ගුණසේකර මයා.

(திரு. பிறின்ஸ் குணசேக்கர)

(Mr. Prins Gunasekera)

තව එක ඡේදයයි, තිබෙන්නෙ.

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

ඒක හරි නැහැ. හරි නැති එකකට ඉඩ දෙන්ට බැහැ. සේරම ඒව මෙතැන ඉදිරිපත් කරන්ට බෑ. ඔව ඉදිරිපත් කළොත් අනිත් පැත්තෙන් උත්තර දෙන්ට සිදු වෙනව. එසින් ප්‍රශ්න හුඟක් ඇති වන නිසා—

ප්‍රින්ස් ගුණසේකර මයා.

(திரு. பிறின்ஸ் குணசேக்கர)

(Mr. Prins Gunasekera)

කථානායකතුමනි, පරමාර්ථය කියන්ට අවසර දෙන්න. ගරු අගමැතිතුමා කළ අභියෝගය මම පිළිගන්නව. යම්කිසි දවසක මා යෝජනා කර තිබෙන සංශෝධනයන් අනුව නීතිඥ වෘත්තියේ වෙනස්කම් සිදු වෙනව නම් ඊට පස්සෙ එක දවසක්වත් මම නීතිඥ වෘත්තියේ වැඩ නොකරන බවට මේ ගරු සභාවේදි අද මම ප්‍රතිඥා දෙනව. [බාධාකිරීම්] ඇරත් කථානායකතුමනි, මගේ අවංකකමවත්, අගමැතිතුමාගෙ අවංකකමවත් ගැන මොකටද මෙතැන විවාදයක්?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

වුටමනා කරන්නෙ, පොදු යහපත සඳහා ඒ පක්ෂයෙ නායකයන් ක්‍රියා කරනව නම්, මේ පැත්තෙ ඉන්න අයත් පොදු යහපත සඳහා ක්‍රියා කරනව නම්—

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කරුණාකර මා කියන එක තේරුම් ගන්න. ලංකාවෙ හැම තැනම තියෙන ප්‍රශ්න මේකට ඇතුළත් නැහැ. මේ පනත ඉදිරිපත් කිරීමෙ අදහස් කොටින් කියන්ට ඕනෑ. මේ පනතෙ තිබෙන අදහස් විතරයි, ප්‍රකාශ කරන්ට පුළුවන්. ඊට පස්සෙ විවාදය සඳහා පනත සභාව ඉදිරියට තැබුවාම ඕනෑ හැටියට කථා කරන්ට ඉඩ දෙනව. එම නිසා කරුණාකර වාඩි වෙන්න.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ඔබතුමා සමඟ මේ වගෙ වචන හුවමාරුවක් කර ගන්නෙ නැතිව මට මෙතැන කවදාවත් කථා කරන්ට ලැබිල නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කරුණාකර ඒ වචනය අස් කරගන්ට ඕනෑ. ඒ මොකද, මම කොයි වෙලාවෙත් වැඩ කරන්නෙ ස්ථාවර නීති අනුවයි.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

මම—

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කරුණාකර මම කියන එකට ඇහුම්කන් දෙන්න. එහෙම වැරැද්දක් තිබෙනව නම් මම සෑම වෙලාවෙදීම ඉඩ දී තිබෙනව මේ සභා ගර්භයෙදි හරි මගේ කාමරයට ඇවිත් හරි ඕනෑ වෙලාවක කථා කරන්ට. නීත්‍යනුකූලවයි මම මේ සභාවෙ වැඩ ගෙන යන්ට හදන්නෙ. මගේ කල්පනාවෙ හැටියට අද හබරාදූව මන්ත්‍රීතුමාට ඉඩ දුන්න වැඩියි.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

හොඳයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කරුණාකර මා කියන එක අහල වාඩි වෙන්න.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

කථානායකතුමනි, පණත්වල පරමාර්ථය කියවන්නම්. එහෙම නැත්නම් චෝදනා කරාවි, පණත් ඉදිරිපත් කළාට පරමාර්ථය කිව්වෙ නැහැ කියල. මම මූලික විප්පණියක් හැටියටයි මෙතෙක් කථා කළේ. ඒ නිසා පරමාර්ථය කියවන්නම්.

නීතිඥ වෘත්තිය පිළිබඳවයි මා පළමු වැනි පණත ඉදිරිපත් කරන්නෙ. එහි නම "නිදහස් නීති අධ්‍යාපන හා නීති වෘත්තිය (විශේෂ විධිවිධාන) පනත" යන්නයි.

නොම්මර 1 පරමාර්ථය: වෛද්‍ය වෘත්තිය, ඉංජිනේරු වෘත්තිය, කාර්මික විද්‍යා හා කලා උපාධි පුහුණුව සහ වෙනත් වෘත්තීන් පුහුණු කිරීමේ හා ඒ පිළිබඳ උසස් අධ්‍යාපනයේදී මෙන්ම නීති වෘත්තිය පුහුණු කිරීමේදීද නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය අනුව ගාස්තු අය නොකොට නොමිළයේ ඒ නීති අධ්‍යාපනයත් නීති විද්‍යාල යෙන් ලබා දීමට මං සැලසීමයි.

2. නීති අධ්‍යාපනය දුප්පත් බුද්ධිමත් තරුණයින්ට පහසුවෙන් ලද හැකි වෘත්තියක් බවට පත් කිරීම.

3. නීති විද්‍යාලයෙන් හා නීති අධ්‍යාපන බල මණ්ඩලයෙන් දැනට නීති ශිෂ්‍යයන් ගෙන් අය කරන ගාස්තු තහනම් කිරීම.

4. නීති අධ්‍යාපන කටයුතු නීති අධ්‍යාපන මණ්ඩලය කෙරෙහි තව දුරටත් පවරා නොකඩවා ගෙන යාම.

5. පෙරකදෝරුවන් හා අධිනීතිඥයන් අතර දැනට පවත්නා භේදය තුරන් කර එම් එකම නීතිඥ වෘත්තියක් ඇති කිරීම.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පෞද්ගලික මන්ත්‍රීන්ගේ කෙටුම්පත් පනත්

මෙයින් අදහස් කරන්නේ දැනට පව තින අධිනීතිඥ සහ පෙරකදෝරු පරතරය නැති කර ඒ වෙනුවට එකම නීතිඥ වෘත් තියක් ඇති කිරීමයි.

6. නඩු කියන්නන් විසින් දැරිය යුතු අධික වියදම් එමගින් අඩු කිරීම.

ගරු කථානායකතුමනි, පළමුවන පනත් කෙටුම්පතේ සාරාංශය මේ විධියට මා ඉදි රිපත් කරනවා. මා මේ ගරු සභාව වෙත ඉදිරිපත් කරන මේ පනතට පක්ෂභේද යෙන් තොරව පොදු යහපත තකා තමුන් නාන්සේලා හැම දෙනාගේම ආධාරය ලැබෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

එම්. තෙන්නකෝන් මයා.

(திரு. எம். தென்னகோன்)

(Mr. M. Tennakoon)

විසින් සම්මත කරන ලදී.

ஆமோதித்தார்.

Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත ඊට අනුකූලව පළමුවර කියවන ලදින් මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා, 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ කෙටුම්පත් පණත අධිකරණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් වෙත පවරන ලදී.

விஞ்ஞ விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது. இதன் படி மசோதா முதன்முறை மதிப்பிடப்பட்டு, அது அச்சிடப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

நிலையற் கட்டளை 51(4) இன் படி அறிக்கை செய்யப் படுதற்காக நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசிக்கு மசோதா சாட்டப்பட்டது.

Question put, and agreed to.

Bill accordingly read the First time and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 51 (4) to the Parliamentary Secretary to the Minister of Justice, for report.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

පෞද්ගලික මන්ත්‍රීන්ගේ කෙටුම්පත් පනත්

රජයේ නීති ආධාර පනත් කෙටුම්පත

ප්‍රින්ස් ගුණසේකර මයා.

(திரு. பிறின்ஸ் குணசேக்கர)

(Mr. Prins Gunasekera)

ගරු කථානායකතුමනි, පනත් කෙටුම් පතේ මුඛ්‍යාර්ථයන් පමණක් කියවා වාඩි වීමටයි මා අදහස් කරන්නෙ. පළමු වෙන්ම තිබෙන්නේ පනත් කෙටුම්පතේ නාමයයි. එහි පරමාර්ථ මේවායි:

1. අපරාධ නඩු සඳහා වර්තමාන නීති පති දෙපාර්තමේන්තුව වැනි වූ විත්ති පක්ෂය සඳහා වූ දෙපාර්තමේන්තුවක් පිහිටුවීම හා පවත්වාගෙන යාම.

3. සිවිල් නඩු සඳහා සිවිල් පැමිණිලි දෙපාර්තමේන්තුවක් හා වගඋත්තරකාර සිවිල් විත්තිකාර දෙපාර්තමේන්තුවක් පිහිටුවීම හා පවත්වාගෙන යාම.

4. නඩු යන්නන්ගේ අර්ථ පහසුව සඳහා රජයේ ආධාර සැපයීම.

5. වඩා ඉක්මනින් සහ අඩු වියදමකින් වඩාත් ප්‍රතිඵලදායී වන අයුරින් අධිකරණ සේවයක් ඇති කිරීම.

6. නීති උසාවි සහ රජයේ සංස්ථාවන් ඉදිරියේ පෙනී සිටින පුද්ගලයන් අතර දුප්පත් පොහොසත් භේදයක් නොමැතිව සමානාත්මතාව ආරක්ෂා කිරීම සඳහා ගාස්තු ගෙවීමට බැරි පුළුවන්කම උඩ කිසිම කරදරයක් නොසිදු වන පරිදි පොදුවේ රජයෙන් ආධාර ලබා දීම.

7. දුප්පත්කම නිසාම යුක්තිය ඉටු වීමට ඇති බාධකයන් ඉවත් කිරීමට අත්‍යවශ්‍ය වෙනත් පියවර ගැනීම.

8. ඒ ඒ උසාවි හා අධිකරණ සංස්ථාවන් සඳහා නීතිඥ මණ්ඩල පිහිටුවා පෞද්ගලික නීතිඥයන්ට අය කළ හැකි ගාස්තු මාලාවක් නියම කිරීම හා ඒ ගාස්තු අය කරන ක්‍රමය නීතියෙන් නියම කිරීම.

මේ පනත් කෙටුම්පතටත් පක්ෂ භේදයෙන් තොරව පොදු සාමාන්‍ය ජනතාවගේ යහපත තකා ගරු මන්ත්‍රීන් හැම දෙනාගේම ආධාරය ලැබෙයයි බලා පොරොත්තු වෙනවා.

බී. වයි. තුඩාවේ මයා. (මාතර)
(திரு. பி. வை. துடாவ—மாத்தறை)
(Mr. B. Y. Tudawe—Matara)

විසින් සභික කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින් මුද්‍රණය කිරීමට නියෝග කරන ලදි.

වාර්තා කිරීම සඳහා, 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ කෙටුම්පත් පණත අධිකරණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් වෙත පවරන ලදි.

விஷ்ணு விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி மசோதா முதன்முறை மதிப்பிடப்பட்டு அது அச்சிடப்படவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

நிலையற்கட்டளை 51(4) இன்படி அறிக்கை செய்யப் படுதற்காக நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசிக்கு மசோதா சாட்டப்பட்டது.

Question put, and agreed to.

Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 51 (4), to the Parliamentary Secretary to the Minister of Justice, for report.

නියෝජ්‍ය කථානායකතුමා කෙරෙහි විශ්වාස භංගය

உபசபாநாயகர் மீது நம்பிக்கையின்மை

No Confidence in Mr. Deputy Speaker

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

With regard to the Debate on this Motion, I should like to ask hon. Members to keep to the terms of the Motion; that is, to deal with the Ruling of the Deputy-Speaker. Please keep that in mind, and do not go outside the Motion.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

The Motion also refers to the conduct of the Deputy Speaker.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Yes, his conduct in making this Ruling. Please keep within the terms of the Motion.

It is also agreed that the Debate will conclude at 4.30 P.M. and a Division taken.

පූ. භා. 10.35

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

ගරු කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වය විසින් මේ ගරු සභාවේ නියෝජ්‍ය කථානායකතුමා කෙරෙහි විශ්වාස භංගත්වය ප්‍රකාශ කිරීමේ මෙම යෝජනාව ඉදිරිපත් කිරීමේ ගෞරවය මට හිමි කිරීම ගැන මගේ සතුට ප්‍රකාශ කරන අතර පොදුවේ ඉදිරිපත් කර තිබෙන මෙම යෝජනාව මම දැන් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නම්. යෝජනාව මෙයයි:

"(1) අගමැතිතුමා විසින් විවාදයකට මුලින් සතුට ප්‍රකාශ කර තිබියදීත්, ඇල්. වී. පොඩිඅප්පුහාමි මහතා හෙවත් දොඩම්පෙ මුදලාලි මරාදැමීම සම්බන්ධයෙන් ආණ්ඩුවේ කල් ක්‍රියාව පිළිබඳව විරුද්ධ පක්ෂය විසින් ඉදිරිපත් කළ ආණ්ඩුව කෙරෙහි විශ්වාස භංගය ප්‍රකාශ කිරීමේ යෝජනාව සාකච්ඡා කිරීම රීති විරෝධියයි 1966 සැප්තැම්බර් මස 24 වැනි දින නියෝජ්‍ය කථානායකතුමා විසින් තීරණය කොට එනයින් විරුද්ධ පක්ෂයේ නීත්‍යනුකූල අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කොට එකී යෝජනාව විවාද කිරීමෙන් වැළකී සිටීමට ආණ්ඩුව විසින් දරණ ලද ප්‍රකාශිත හා බියසුළු ප්‍රයත්නයට ආධාර කළ නිසාත්;

(2) නියෝජ්‍ය කථානායකතුමාගේ මෙම තීරණය, ස්ථාවර නියෝගවලට, පූර්වාදර්ශයනට හා මන්ත්‍රී මණ්ඩලයේ ව්‍යවහාරයන්ට වෙනස් වන බැවිනුත්, පොදු වැදගත්කමින් යුත් කරුණු රාශියක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මන්ත්‍රීවරුන්ට ඇති අයිතිවාසිකම් නොනිසි ලෙස සීමා කරන නිසාත්, රජයට අහිතකර හෝ රජය දුෂ්කරතාවයකට පැමිණ විය හැකි කරුණු රාශියක් මන්ත්‍රී මණ්ඩලයේදී විවාදවීම වැළැක්වීමේ ව්‍යාජ හේතුවක් පහසුවෙන් ආණ්ඩුවට සලසා දෙන නිසාත්;

තවද, නියෝජ්‍ය කථානායකතුමා 1966 සැප්තැම්බර් මස 24 වැනි දින එළඹි තම තීරණය උල්ලංඝනය කරමින් 1966 සැප්තැම්බර් මස 26 වැනි දින මන්ත්‍රී

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

මණ්ඩලය කල් තැබීමේදී, දැනට විභාගවෙමින් පවතින කුමන්ත්‍රණ නඩුවේ ප්‍රාථමික මහේස්ත්‍රාත් නඩු විභාගයේ විත්තියේ අධිනීතිඥයකුගේ පැවැත්ම හා ප්‍රකාශන පිළිබඳව අහිතකර ලෙස විවේචනය කිරීමට දෙනියායේ ගරු මන්ත්‍රීවරයාට ඉඩදුන් නිසාත් ;

තවද, ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නියෝජ්‍ය කථානායකතුමාගේ පැවැත්ම පක්ෂග්‍රාහී හා නොගැළපෙන බැවිනුත්, මුලසුන දරණ තැනැත්තෙකුගෙන් අපේක්ෂිත ස්වාධීනත්වයට පටහැනි බැවිනුත් ;

නියෝජ්‍ය කථානායකතුමා කෙරෙහි මෙම මන්ත්‍රී මණ්ඩලය විශ්වාසය නොතබයි."

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවෙ මුලසුන දරණ කෙනෙකු පිළිබඳව විශ්වාස භංගත්වය ප්‍රකාශ කිරීමේ යෝජනාවක් ඉදිරිපත් කළ යුත්තේ සැහැල්ලු සිතකින් හෝ යම් කිසි පටු දේශපාලන වාසියක් බලාපොරොත්තුවෙන් හෝ ඒ සඳහා කරුණු නැතිව හෝ නොවෙයි. එවැනි විශ්වාස භංගත්වයක් ප්‍රකාශ කළ යුතු තත්ත්වයක් ඇති වීමට නම්, විශෙෂයෙන් මේ ගරු සභාවට මහජන ඡන්දයෙන් තේරී පත් වී සිටින ගරු මන්ත්‍රීවරුන්ගෙ අයිතිවාසිකම්වලට පහර වදින අදහසින් යම් කිසි ක්‍රියාවක් කළාය කියන චෝදනාවක් හෝ එසේ නැත්නම් පක්ෂග්‍රාහී පිළිවෙළකට—දේශපාලන චේතනාවක් තිබුණත් නැතත්—දේශපාලන වාසියක් හෝ අවාසියක් වන පරිදි ක්‍රියා කළාය කියන චෝදනාවක් හෝ එසේත් නැත්නම් මෙම ගරු සභාව පිළිබඳව රටේ තිබෙන විශ්වාසය නැති කිරීමට හෝ අඩු වී යාමට හේතු වන පරිදි යම් කිසි ක්‍රියාවක් කළාය කියන චෝදනාවක් තිබිය යුතුයි. ඒ කරුණු සිතේ තබා ගෙනයි මම මේ යෝජනාව ඉදිරිපත් කරන්නෙ.

ඒ එක්කම මවිසින් පළමුකොටම මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනව. නියෝජ්‍ය කථානායක නිලය දරණ හලාවත ගරු මන්ත්‍රීතුමා (ෂර්ලි කොරෙයා මයා.) විරුද්ධ පාර්ශ්වයේ කාගේත් ආදරයටත් සැලකිල්ලටත් භාජන වී සිටි කෙනකු බව මතක් කළ යුතුයි. එපමණක් නොවෙයි, ඇතැම් අවස්ථාවලදී—තමුන්නාන්සෙ දැන් හොබවන ඔය ආසනය දරණ අවස්ථාවල—නියෝජ්‍ය කථානායකතුමා පිළිබඳව ප්‍රශංසාව පළ කිරීමටද අපට සිදු

වූ අවස්ථා තිබෙනව. නා නා අවස්ථාවලදී ඉතාම යුක්ති සහගතව, යුක්ති ගරුකව ක්‍රියා කළාය කියා එතුමා අපේ ප්‍රශංසාවට භාජන වුණා. අන්න ඒ කාරණයත් සිතේ තබාගෙනයි මම මේ යෝජනාව ඉදිරිපත් කරන්නෙ. එසේ නැතුව හලාවත මන්ත්‍රීතුමා කෙරෙහි පෞද්ගලික දෝෂාරෝපන කිරීමක් වශයෙන් නොවෙයි. එතුමා සමග පෞද්ගලික වශයෙනුත් ඉතාමත් හිතවත් කිට්ටු මිත්‍රත්වයක් තිබෙන මන්ත්‍රීවරුන් කීප දෙනෙක් මේ පැත්තෙත් සිටිනව. ඒ වාගේම නීතිය පිළිබඳව එතුමාගෙ දැනීම ගැනත්, එතුමාගෙ සාමාන්‍ය පරිසරයෙන් ඇති වුණ ගෞරවය ගැනත් බලන විට මම මේ යෝජනාව පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්නේ එය මේ ගරු සභාවෙ සිදු වූ දෙයක් හැටියට සීමා කිරීමෙනුයි.

ගරු කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වය විසින් දොඩම්පෙ මුදලාලි මහතාගේ මරණය පිළිබඳව යෝජනාවක් සාකච්ඡාවට භාජන කිරීමේ අදහසින් කල් දුන්නා. ඒ යෝජනාව න්‍යාය පත්‍රයටත් ඇතුළත් වුණා. ඉන් පසු විරුද්ධ පාර්ශ්වයෙ සිටින පක්ෂ නායකයිනුත් ආණ්ඩු පක්ෂයෙ සිටින පක්ෂ නායකයිනුත් මුණ ගැසී මේ පිළිබඳව දින නියම කර ගැනීමේ සාකච්ඡාවක් තමුන්නාන්සෙගෙ ප්‍රධානත්වයෙන් පවත්වන්නට යෙදුණ. දින නියම කරගැනීම පිළිබඳ සාකච්ඡා මේ ගරු සභාවෙදිත් කීප විටක්ම ඇති වුණා. ඒ කුමන අවස්ථාවකදීවත් මේ යෝජනාව සාකච්ඡා කිරීමට ඉඩ නොලැබෙන බවට කිසිම සංඥාවක් අපට ලැබුණෙ නෑ. මේ ගරු සභාවට එවැනි සංඥාවක් නොලැබුණා පමණක් නොව, ආණ්ඩු පක්ෂයෙ ප්‍රධානියා වශයෙන් කථා කිරීමේ අයිතිය හිමි ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් පවා අපට දැන ගන්න ලැබුණෙ මේ යෝජනාව සාකච්ඡා කිරීමට ඉඩ දීම එතුමා සතුටින් පිළි ගන්න බවයි, බාර ගන්න බවයි. එම නිසා, මේ යෝජනාව මේ සභා ගර්භය තුළදී විවාදයට භාජන කිරීම ආරම්භ වන අවස්ථාවෙදි ඊනි ප්‍රශ්නයක් උඩ එය වළක්වන්නට යන බවට සැකයක් ඇති කරගන්න අපට කිසිම ඉඩක් ලැබුණෙ නෑ. අප විසින් ඉදිරිපත් කර තිබුණු මේ යෝජනාව උසාවියක තීරණයට, විනිශ්චයට බලපාන එකක් වන නිසා එය මේ ගරු සභාවෙදී

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

සාකච්ඡා කරන්න බැරියයි කියන්න පුළුවන් ප්‍රශ්නයක්, ආණ්ඩුවෙන් පත් කර සිටින වර්නන් ජොන්ක්ලස් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළේ මෙවැනි අවස්ථාවකදියි.

වර්නන් ජොන්ක්ලස් ගරු මන්ත්‍රීතුමා එතුමගෙ පුළුවන් ප්‍රශ්නය මතු කළේ කරුණු දෙකක් පදනම් කරගෙනයි. ඉන් පළමු වැනි කරුණ මෙයයි: ආණ්ඩුව පැහැර ගැනීමට තැත් කිරීමේ කුමන්ත්‍රණයක් පිළිබඳ විභාගය දැන් අධිකරණය ඉදිරියෙහි තිබෙන නිසාත් මෙම යෝජනාව සාකච්ඡා කිරීමෙන් කුමන්ත්‍රණය සම්බන්ධයෙන් අත්අඩංගුවේ සිටින අයට හානියක් විය හැකි නිසාත් මෙය සාකච්ඡා නොකළ යුතුය. පත් කළ ගරු මන්ත්‍රීතුමාගෙ දෙවැනි තර්කය මෙසේයි: දොඩම්පෙ මුදලාලිට හෙවත් ඇල්. වී. පොඩිඅප්පුහාමිට අපරාධකාරී කටයුත්තක් සිදු වුණාය යන තීරණයක් තිබෙන නිසා ඊට සම්බන්ධ පොලිස් නිලධාරී මහත්වරුන්ට විරුද්ධව අනාගතයේදී නඩුවක් ඇති විය හැකි බැවින්, මෙම යෝජනාව සාකච්ඡා කිරීමෙන් ඒ නඩුවට බාධාවක් ඇති විය හැකි බැවින්, මෙම යෝජනාව නොකළ යුතුය. මේ තර්ක දෙක අනුව, පත් කළ ගරු මන්ත්‍රීතුමා එතුමගෙ පුළුවන් ප්‍රශ්නය පිළිබඳව කරුණු ඉදිරිපත් කළා. මේ පුළුවන් ප්‍රශ්නය සම්බන්ධයෙන් බෞරුවල ගරු මන්ත්‍රීතුමත් (එම්. අබ්දුල් බකීර් මාකර් මයා.) තර්ක ඉදිරිපත් කළා. නමුත් කිසිම හරයක් නැති ඒ ප්‍රකාශන පිළිබඳව තමුන්නාන්සෙගෙ හෝ මේ ගරු සභාවෙ හෝ කාලය මිඩංගු කිරීමට මම අදහස් නොකරන නිසා ඒ ගරු මන්ත්‍රීතුමාගෙ තර්ක පිළිබඳව මම වචනයක්වත් කියන්න බලාපොරොත්තු වන්නෙ නෑ. ඒ තර්කවලට පිළිතුරු එදා මැද කොළඹ තුන්වැනි ගරු මන්ත්‍රීතුමත් (ජී. ජී. බී. කෙනමන් මයා.) දොම්පෙ ගරු මන්ත්‍රීතුමත් (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) දුන්න. නියෝජ්‍ය කථානායකතුමා එදා පුළුවන් ප්‍රශ්නය පිළිබඳව තීරණයක් දුන්නෙ මේ කරුණු විග්‍රහ කරමිනුයි. ඒ තීරණය පිළිබඳව විග්‍රහයක් කරන්න මට තමුන්නාන්සේගෙන් ඉඩ ලැබෙනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

නියෝජ්‍ය කථානායකතුමාගෙ තීරණයෙ මුල් කොටසින් කියවෙන්නෙ මේ විධියෙ වෙනත් මණ්ඩල මෙවැනි අවස්ථාවලදී කටයුතු කර තිබෙන ආකාරයයි. මුලින්ම එතුමා ඉන්දියාවෙ වංග දේසයෙ මන්ත්‍රණ සභාවෙ ස්ථාවර රීතියක් මතක් කර දුන්න. ඊට පෙර එතුමා අපේ ස්ථාවර රෙගුලාසියකට හුරු වන ආකාරයෙ රෙගුලාසියක් ඉන්දියාවෙ මහජන මන්ත්‍රී මණ්ඩලය වන "ලෝක් සභාවෙ" තිබෙන බව පෙන්වා දුන්න. එසේ පෙන්වා දෙන ලද්දෙ අපේ ස්ථාවර නියෝගවල එන 96 වැන්නෙ 6 වැනි අතුරු කොටසයි. 96 වැනි ස්ථාවර නියෝගය මෙන්න මේ විධියටයි කියැවෙන්නෙ:

"96. මන්ත්‍රී මණ්ඩලය සලකා බලන යම් කරුණක් සම්බන්ධයෙන් කථා කිරීමේදී මතු පළ වන රීති නොපිරිහෙළා පිළිපැදිය යුතුය:—

(vi) අධිකරණ තීන්දුවක් අපේක්ෂා කරනු ලබන කිසිම කරුණක් ගැන කවර මන්ත්‍රීවරයකු විසින් හෝ සඳහන් නොකළ යුතුය."

ගරු කථානායකතුමනි, ඔය ස්ථාවර නියෝගයේ අර්ථය අපි හරියාකාර වටහා ගනිමු. ප්‍රථමයෙන්ම කියා තිබෙන්නේ මේ ස්ථාවර නියෝගය සීමා වී ඇත්තේ මන්ත්‍රීවරුන් මේ ගරු සභාවේදී කරන කථාවලට බවයි. එසේ නැතිව යෝජනා සම්බන්ධව හෝ ප්‍රශ්න සම්බන්ධව හෝ නොවෙයි. 96 වැනි ස්ථාවර නියෝගයේ විශේෂයෙන්ම සඳහන් වන්නේ ගරු මන්ත්‍රීවරුන් විසින් මේ ගරු සභාවේදී කථා කළ යුතු ආකාරය සම්බන්ධවයි. එසේ නැතිව යෝජනාවක් හෝ ප්‍රශ්නයක් පිළිබඳව එම ස්ථාවර නියෝගයේ කිසිවක් සඳහන් වී නැහැ. එමෙන්ම, ඒ අර්ථය ගෙන දෙන වෙනත් ස්ථාවර නියෝගයක් මේ ස්ථාවර නියෝග සංග්‍රහයේ ඇත්තෙත් නැහැ. ප්‍රශ්නයක් අහන්නට හෝ යෝජනාවක් ඉදිරිපත් කරන්නට බැරිය කියා එකම තැනකවත් කියා නැහැ. ඒ කෙසේ වෙතත් එයට අර්ථ විග්‍රහයක් කිරීමේදී එය ඊට වඩා පුළුල් අන්දමට ගන්නවා නම්, එනම්, කථාවකට යම් තහනමක් තිබෙනවා නම් එම තහනමම යෝජනාවක් ඉදිරිපත් කිරීමේදීත් වලංගු බව කියන අදහස පිළිගෙන බැලුවත් එම ස්ථාවර නියෝගයෙන් අදහස් වන්නේ මොකක්ද? එහි අර්ථය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධිකරණ තීන්දුවක් අපේක්ෂාවෙන් තිබෙන කරුණක් ගැන සාකච්ඡා නොකළ යුතුය කියන එකයි. එසේ නම් අධිකරණය ඉදිරියේ ප්‍රශ්නයක් තිබිය යුතුයි; ඒ පිළිබඳව තීන්දුවක් අපේක්ෂා කරන තත්ත්වයකුත් තිබිය යුතුයි. එහෙත්, ගරු කථානායකතුමනි, මෙතන තිබෙන ප්‍රශ්නය මොකක්ද? මට පසුව කථා කරන්නට බලාපොරොත්තුවෙන් සිටින මන්ත්‍රීවරුන් කියනවා ඇත්තේ—කියන්නට උත්සාහ කරනවා ඇත්තේ—මෙතැන එවැනි දෙයක් නොතිබුණු බවයි. ඔවුන් කියන්නට උත්සාහ කරනවා ඇත්තේ අධිකරණය ඉදිරිපිට තීන්දුවක් බලාපොරොත්තු වන ප්‍රශ්නයක් නොතිබුණු බවයි.

මේ සාකච්ඡාවට භාජන වී තිබෙන තීරණය දුන් නියෝජ්‍ය කථානායකතුමාගේ ඒ තීරණයේ තර්කය එකින් එකට සලකා බලන විට මේ කරුණ මීට වඩා පැහැදිලි කරන්නට පුළුවන්කම තිබෙනවා. එතුමා ප්‍රථමයෙන්ම ගෙනා තර්කය මේකයි: මහා බ්‍රිතාන්‍යයේ මන්ත්‍රී මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ කාරක සභාවේ වාර්තාව ගැන සඳහන් කරමින් නියෝජ්‍ය කථානායකතුමා ප්‍රකාශ කළා, "අයර්ලන්තයේ ඇති වූ යම් සිද්ධීන් පිළිබඳව ඊට නිසි අධිකරණය ඉදිරිපිට කටයුතු කර ගෙන යන හෙයින් මම ඒ ගැන යමක් කියන්න අදහස් නොකරමි" කියා රාජාසනයේ කථාවක් කරන්න යෙදුණු මහ රැජිනක විසින් කියා තිබෙනවාව කියා. එතන කියන්නේ කොහොමද? "අයර්ලන්තයේ ඇති වූ යම් සිද්ධීන් පිළිබඳව, එයට නිසි අධිකරණය ඉදිරිපිට කටයුතු කරගෙන යන හෙයින්—ඒ ගැන තීරණයක් බලාපොරොත්තු වන හෙයින්—proceedings are pending—මම ඒ පිළිබඳව යමක් ප්‍රකාශ කිරීමෙන් වළකිමි" කියලයි තියෙන්නෙ. ගරු කථානායකතුමනි, මහ රැජිනට යම් යම් තීන්දු ගැනීමට නානා හේතූන් තිබෙන්නට පුළුවන්. එහෙත්, ඒ අවස්ථාවේදී දේශපාලනමය හේතූන් නිසා හෝ වේවා මහ රැජින ඒ තීරණයට බැස්සත්, ඒ අනුව නිගමනයකට බසින්නට අපට මෙතනින් ඉඩක් තිබෙනවාය කියා මා නම් විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා ඒ නිදර්ශනය පැත්තකින් තබා ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ඊළඟට ඉදිරිපත් කළ නිදර්ශනය ගැන බලමු. ලෝඩ් ජෝන් රසල්ගෙ ප්‍රකාශයක් ඊළඟට ඉදිරිපත් කරනවා. අධිකරණයක් ඉදිරිපිට නඩු විභාගයක් යන අවස්ථාවකදි ඊට අදාලවූ කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම නුසුදුසු දෙයක් යයි රසල් මහතා කියා තිබෙනවා. "අධිකරණයක් ඉදිරිපිට නඩු විභාගයක් යන අවස්ථාවකදි" යන්න විශෙෂයෙන් උපුටා දැක්විය යුතුයි. දොඩම්පෙ මුදලාලි මහතාගේ මරණය පිළිබඳව අධිකරණය ඉදිරිපිට කාට හෝ විරුද්ධව නඩු විභාගයක් එදා තිබුණෙ නැහැ. අපරාධ නඩුවක් එදා තිබුණෙ නැහැ, අදත් නැහැ.

ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර)
(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)
(Mr. Leslie Goonewardene—Panadura)
හෙටත් නැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඉවරයි.

ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)
(கலாநிதி என். எம் பெரேரா—யட்டியாந்தோட்டை)
(Dr. N. M. Perera—Yatiyantota)
ඉවරයි? මුදලාලිත් ඉවරයි, නඩුවත් ඉවරයි; දැන් මිනීමැරුම කර තිබෙන්නෙ ජනේලෙ තමයි.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
එම කරුණුවලින් අර්ථයක් උපුටා ගෙන එය මෙම ප්‍රශ්නයට අදාල වෙන වය කියනව නම්, අදාල වන්ට යම්කිසි ඉඩක් තිබෙනවය කියනව නම්, අපට ඒක පිළිගන්න අමාරුයි.

ඊළඟට බ්‍රිතාන්‍ය මන්ත්‍රී මණ්ඩලයෙ සාකච්ඡා වාර්තාවකින් කරුණු පෙන්වා තිබෙනවා. අයර්ලන්තයෙ පරිපාලනය භාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

දී සිටි උදවිය ඇතැම් කෙනෙකුට විරුද්ධව —ඇතැම් කෙනෙකුට විරුද්ධවය කියන වචන කීපය විශෙෂයෙන් පෙන්වා දෙන්ට කැමතියි—නඩුවක් පැවරීම පිළිබඳව ප්‍රමාද යක් කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු කරන්ට කථානායකතුමා ඉඩ දුන්නෙ නැති බව කියනව. ඇතැම් කෙනෙකුට විරුද්ධව නඩුවක් පැවරීම ප්‍රමාද කිරීම ගැන ප්‍රශ්නයකට ඉඩ නුදුන් බවයි කියා තිබෙන්නෙ. දැන් මම තමුන්නාන්සෙගෙ අවධානය යොමු කරවන්නෙ ඇතැම් කෙනෙකුට විරුද්ධව—against a certain person—කියන වචන කීපයටයි. මොකක් ද මෙම ප්‍රකාශයෙන් මතු වී පෙනෙන නියම අදහස? යම්කිසිවෙක් අධිකරණය ඉදිරියෙ නඩු විභාගයකට ලක් වී සිටිනව. ඔහු පිළිබඳව යුක්තියක් ඉටු කිරීමටයි, රටේ උසාවි තිබෙන්නෙ. අර හේතුව නිසා එම පුද්ගලයා නැතිනම් පුද්ගලයන් පිරිසක් වෙනුවෙන් එම යුක්තිය ඉටු කිරීමට බාධා වේවිය කියන එකයි මේකෙ හරය. ඒ අනුවයි මෙවැනි නීතියක් සකස් කර තිබෙන්නෙ.

දොඩම්පෙ මුදලාලි මහතාගෙ මරණය පිළිබඳව යම් කෙනෙකුට විරුද්ධව නඩුවක් එම අවස්ථාවෙ තිබුණෙ නැහැ. අනාගත යෙදි සොයා ගන්න පුළුවන් වන වැරදිකාර යකු පිළිබඳව යම්කිසි අයුක්තියක් වේවිය කියන හැඟීමෙන් එම කාරණය ගැන සාකච්ඡාවක් පැවැත්වීම තහනම් කිරීම යුක්ති සහගත නොවේ. මා මෙම අවස්ථාවෙදි විශෙෂයෙන් සැලකිල්ලට භාජන කර සිටින්නෙ වර්නන් ජොන්ක්ලස් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ තර්කය පිළිබඳවයි.

අධිකරණය ඉදිරිපිට තිබෙන යම් කාරණයක් ගැන මන්ත්‍රී මණ්ඩලයෙ සාකච්ඡා කිරීම වලක්වන්න අදහස් කරන්නෙ කුමන හේතුවක් නිසාද? මගෙ කල්පනාව අනුව හේතු දෙකක් තිබෙනව. එක හේතුවක් නම් මෙයයි: මෙම ගරු මන්ත්‍රීන්ට මේ මන්ත්‍රණ සභාව තුළ යම් යම් අයිතිවාසිකම් තිබෙනව; ඒ අනුව ඔවුන් කරන ප්‍රකාශ ගැන ඔවුන්ට යම් ආරක්ෂාවක් ලැබෙනව. අන්න ඒ ආරක්ෂාවට, රැකවරණයට මුවාවී පිටස්තර සිටින සාමාන්‍ය පුද්ගලයන්ට දඩුවම් ලබා දෙන ආකාරයෙ ප්‍රකාශන මන්ත්‍රීවරුන් කිරීම වැරදියි කියන පදනමයි, ඒ. මෙතන අපට මෙම රැකවරණය ලැබී තිබෙන්නෙ, තමුන්නාන්සෙගෙ අවසරය ඇතිව මෙහි යම් යම් ප්‍රකාශන කරන්ටයි. නමුත් මේ ගරු සභාවෙ වරප්‍රසාද උල්ලංඝනය කළාය කියන විදියෙ චෝදනාවක් පිට අධිකරණයට යන්ට පුළුවනි. ඒ මිස සාමාන්‍යයෙන් මෙතන කෙරෙන ප්‍රකාශන පිළිබඳව පිටස්තර නඩු විභාගයක් කරන්ට බැහැ. මේ ගරු සභාවේදී පුද්ගලයකු පිළිබඳව හෝ උසාවියක් පිළිබඳව හෝ අපහාස සහගත ප්‍රකාශයක් කළත්, උසාවියට බැණ වැදුණත්, උසාවියකට ගැරහීමේ ප්‍රකාශයක් කළත්, උසාවිය නින්දාවට භාජන වන ආකාරයේ ප්‍රකාශයක් කළත් ඒ ප්‍රකාශය කළ ගරු මන්ත්‍රීවරයාට විරුද්ධව උසාවියේ නඩුවක් පැවරීමට ඉඩක් නැහැ ඒ රැකවරණයේ මුවාවෙන්, ඒ නිදහස, ඒ බලය පාවිච්චි කරමින් කෙනෙකු උසාවිවලට ගැරහීමේ ප්‍රකාශන කරනවා නම් එය අයුක්ති සහගත බව අප පිළිගන්නවා. මේ ගරු සභාවට ඒ නිදහස ලබා දී තිබෙන්නේ මහජනයාගේ පොදු ප්‍රශ්න පිළිබඳව නිදහසේ කථා කිරීමට අයිතියක් තිබිය යුතු නිසයි. නමුත් ඒ අයිතිය නොනිසි ලෙස පාවිච්චි කිරීමට ඉඩක් නොතැබීමේ අදහසින් තමයි අධිකරණය පිළිබඳව මේ සීමාව තිබිය යුතුය කියා ඊති සකස් කර තිබෙන්නෙ.

ගරු කථානායකතුමනි, මේකෙ තවත් පැත්තක් තිබෙනව. ඒක ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ එක මූලික ප්‍රතිපත්තියක්. කලින් තිබුණු දේශපාලන තත්ත්වය හා සසඳා බලන විට සාමාන්‍යයෙන් අධිකරණයත් පරිපාලනයත් නීති සම්පාදනයත් වෙන් කර වෙන් වූ ආයතන වශයෙන් පැවැත්විය යුතුය, මේ කටයුතු එකින් එක නොගැටෙන ආකාරයට ගෙන යා යුතුය යන ප්‍රතිපත්තිය දියුණුව කරා ගත් පියවරක් හැටියට පිළිගන්ට පුළුවන්. ඒ ප්‍රතිපත්තිය මේ සමාජයේ ඉතාමත්ම අලංකාර, ශ්‍රේෂ්ඨ අංගයක් හැටියට ධනේශ්වර දේශපාලනඥයිනුත් ශාස්ත්‍රඥයිනුත් ඉදිරිපත් කරන්නේ වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නමුත් ඇත්ත වශයෙන්ම එහි හරයක් නැති බව අපට කියන්ට සිද්ධ වී තිබෙනවා. ඒ කෙසේ වෙතත් කලින් තිබුණු තත්ත්වය අනුව සසඳා බලන විට එදා තිබුණු අන්දමේ බලපෑම්වලින් තොරව අධිකරණයත් නීති සම්පාදනයත් පරිපාලනයත් ගෙන යාමේ අවශ්‍යතාව පිළිබිඹු කරන මේ ප්‍රතිපත්තිය දියුණුව කරා ගත් පියවරක් හැටියට අප පිළිගන්නවා.

ගරු කථානායකතුමනි, වැඩවසම් යුගයේ දී ඇතැම් රජ දරුවන්, විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයේ ඉතිහාසය දෙස බලන විට ඇතැම් රජ දරුවන් පාර්ලිමේන්තුවටත් අධිකරණයටත් බලපෑම් කරන්ට ඉදිරිපත් වූ බව අපට පෙනෙනවා. එක් රජ දරුවෙක් "ස්ටාර් චේම්බර්" නමින් හැඳින්වෙන උසාවියක් තබාගෙන විශේෂ අධිකරණ බලතල පවරාගෙන, තමන්ට වුවමනා කරන අන්දමේ නඩු තීන්දු ලබා ගැනීමට උත්සාහ කළ බවත් අප දන්නා නිසා —ප්‍රතිපත්තිය ක්‍රියාකරවීමේදී සීමාවන් ඇති නමුත්—ඒ අන්දමේ බලපෑම්වලින් තොරව අධිකරණයත් නීති සම්පාදනයත් පරිපාලනයත් ගෙන යාමේ අවශ්‍යතාව පිළිබිඹු කරන මේ ප්‍රතිපත්තිය දියුණුව කරා ගත් පියවරක් බව අප පිළිගන්නවා. එසින් මතු වන දෙයක් හැටියට තමයි අප පිළිගන්නෙ අපේ අධිකරණයට මේ ගරු සභාව පිළිබඳව යම් විවේචනයක් කරන්ට අයිතියක් නැත, ඒවාගේම විශේෂ තත්ත්වයන් යටතේ හැර උසාවිය සම්බන්ධ යම් යම් කරුණු පිළිබඳව මේ ගරු සභාවේදී සැහැල්ලු අන්දමින් ප්‍රකාශ යන් කිරීමට ඉඩක් නැත යන අදහස. නමුත් මෙහිද සීමාවක් තිබෙනවා. ගරු කථානායකතුමනි මේ මන්ත්‍රණ සභාව තමයි ආණ්ඩුවේ ඉහළම මණ්ඩලය. සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයත් මේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයත් එකතු කරමින් තමයි අපේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව යන ඉහළම මණ්ඩලය ඇති කර තිබෙන්නෙ. එමනිසා මෙතන යම් දෙයක් සම්බන්ධව සාකච්ඡාවක් කරන්ට බැරි නම්, පොදු අයිතිය පිණිස, මහජනතාවගේ සුභසිද්ධිය පිණිස යම් විවේචනයක් කරන්ට ගරු මන්ත්‍රීවරුන්ට අයිතියක් නැත්නම් එයින් මහජන යහපතට විශාල හානියක් ඇති වෙන්න පුළුවන් බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. ඒ නිසා තමයි අධිකරණයේ සිටින විනිශ්චයකාරවරයකු ගැන යම් විවේචනයක් කිරීම අවශ්‍ය වුණොත් මේ ගරු සභාවේ මන්ත්‍රීන්ගෙන් 2/3 ක අත්සන් ඇතිව ඉදිරිපත් කරන යෝජනාවක් අනුව සාකච්ඡා කරන්නට ඉඩ දී තිබෙන්නෙ. එසේ කරන විට අධිකරණයේ වැඩ කටයුතු, ඒ ඒ විනිශ්චයකාරතුමාගේ වැඩ කටයුතු විවේචනයට ලක් වන බව තමුන්නාන්සෙ දන්නවා. එමනිසා යම් ප්‍රශ්නයක් පිළිබඳව නඩු විභාගයක් තිබෙනවාය යන කාරණය නිසා හෝ එසේ නැත්නම් අධිකරණයට ගැරහීමක් ඇති වෙන්ට පුලුවන්ය යන කාරණය නිසා හෝ මේ ගරු සභාවේ සාකච්ඡා වැළැක්වීමේදීත් යම් සීමාවල් තිබෙන බවයි මා මේ අවස්ථාවේදී පෙන්වා දෙන්නට අදහස් කරන්නෙ. ඒ සීමාවල් නිසා තමයි මෙවැනි ප්‍රශ්නයක් ගැන සාකච්ඡා කිරීමට නොහැකිය කියා නියෝජ්‍ය කථානායකතුමා කළ තීරණය ගැන අප විරුද්ධත්වය පාන්ට සිදු වී ඇත්තේ.

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේ දී අප ඇතැම් අවස්ථාවලදී විශේෂ කාරක සභා පත් කරනවා. යම් යම් ප්‍රශ්න පිළිබඳව විශේෂ විභාග පැවැත්වීමට විශේෂ කාරක සභා පත් කරනවා. දැන් මේ හෙට අනිද්දා නැවතත් අර මොරිස් ඔක්ස්fපඩ් කාර් එකක් තැගි දීම ගැන විශේෂ කාරක සභාව නැවතත් රැස්වෙනවා. පසුගිය පාර්ලිමේන්තු වාරයේදී යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට විරුද්ධව විශේෂ කාරක සභාවක් පත් කරන යෝජනාවක් එදා සිටි විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා—වර්තමාන අගමැතිතුමා—ඉදිරිපත් කළා. හිටපු අගමැතිවරයකු ඒ යෝජනාව ඉදිරිපත් කළා. තවත් හිටපු අගමැතිවරයකු ඒ යෝජනාව ස්ථිර කළා. එහෙත් එය හරයක් නැති යෝජනාවක්. ඒ යෝජනාව මෙම ගරු සභාවේදී සාකච්ඡා කරන්නට ඉඩ ලැබුණා. ඒ යෝජනාවේ සඳහන් කරන ලද කාරණය පිළිබඳවද එදාසින් පසු අනාගතයේදී අධිකරණය ඉදිරිපිටට යා හැකිව තිබුණා. එහෙත් අපේ ගරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය කථානායකතුමා කෙරෙහි විශ්වාස භංගය

[බර්නාඩ් සොයිසා මයා.]

නියෝජ්‍ය කථානායකතුමා විසින් මෑතකදී දෙන ලද තීන්දුව වලංගු වෙනවා නම් ඒ යෝජනාව ගැන මෙහිදී සාකච්ඡා කරන්නට ඉඩදිය යුතුව තිබුනේ නැහැ. අනාගතයේදී උසාවියට ඉදිරිපත් වන කාරණයක් සම්බන්ධයෙන් මෙතැන දී විශේෂ කාරක සභාවක් පත් කිරීමේ යෝජනාවක් යටතේ කෙරෙන කථාවලින් ඒ උසාවියට යන පුද්ගලයාට අවාසියක් වන්නට ඉඩ තිබෙනවා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා සම්බන්ධ කාරණය පිළිබඳව සාකච්ඡා කිරීමට නියම වේදිකාව උසාවිය බව එදා අපි කීවා. උසාවියට යන ලෙස අප ඉල්ලා සිටියා. ඇත්තෙන්ම එදා කියන ලද ඒ කරුණු උඩ උසාවියට යන්නට ඉඩ තිබුණා. උසාවියට ගියා නම් ඒ හුඹස් තර්ක සියල්ලම හෙළි වෙනැයි—ඒ යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීවරුන්ගේ හුඹස් තර්ක හෙළිවන බවට—අපට විශ්වාසයක් තිබුණා. කෙසේ හෝ වේවා, උසාවියට යා හැකි කාරණයක් සම්බන්ධයෙන් විශේෂ කාරක සභාවක් පත් කිරීමේ යෝජනාවක් යටතේ මෙහිදී සාකච්ඡා ඇති වුණා. නියෝජ්‍ය කථානායකතුමාගේ තීරණය නිවැරදි නම් පසුව උසාවියට යා හැකි කාරණයක් ගැන අපේ විශේෂ කාරක සභාවක් පත් කිරීමේ යෝජනාවක් ගැන මෙම සභාවේ සාකච්ඡා කිරීම තහනම් වෙනවා. එවැනි තත්ත්වයක් අපට පිළි ගන්ට බැහැ. එසේ බැරි නිසා තමයි විනිශ්චයට භාජන විය හැකි ප්‍රශ්න ගැන වුවත් විශේෂ කාරක සභා පත් කිරීමේ යෝජනා ගැන මෙහි සාකච්ඡා කිරීමට ඉඩ එදත් තිබුනේ. අදත් ඇත්තේ. එදා ඒ කාරණය ඒ විධියට සාකච්ඡා කරන්නට පුළුවන් නම් මෙදා මේ සාකච්ඡාව වැළැක්වීමට කුමන හේතුවක් තිබෙනවාදැයි අප තුළ සැකයක් ඇති වෙනවා.

ගරු කථානායකතුමනි, පොලිසියෙන් සිදු වන අතවරයන් අඩන්තේට්ටම් පිළිබඳව මේ ගරු සභාවේදී නිතර නිතර ප්‍රශ්න මතු වී තිබෙනවා, සාකච්ඡා පැවැත්වී තිබෙනවා. අයවැය ලේඛනයේ කාරක සභා අවස්ථාවේදී පොලීසියේ වැය ශීර්ෂයන් යටතේ කථා කරන ගරු මන්ත්‍රීවරුන්—දෙපාර්ශ්වයේම ගරු මන්ත්‍රීවරුන්—පොලිස් නිලධාරීන් විසින් කරනු ලබන අකටයුතු පිළිබඳව දීර්ඝ වශයෙන් විස්තර කරමින් කථා කර තිබෙනවා. පොලීසියේ අඩන්තේට්ටම් පිළිබඳව විභාග කර බැලීම සඳහා මීට පෙර යෝජනාවක්ද ඉදිරිපත් වුණා. මාතර දිස්ත්‍රික්කයේ පොලිස් අත් අඩංගුවේ සිටි කෙනකු මරණයට පත් වීම ගැන සැකයක් ඇති බවට රාජ්‍ය මන්ත්‍රණ සභා කාලයේදී මොරවක ගරු මන්ත්‍රීවරයා වශයෙන් සිටි වර්තමාන අකුරැස්සේ ගරු මන්ත්‍රීවරයා විසින් විශේෂ උනන්දුවක් දරා ඉදිරිපත් කරන ලද කරුණු නිසා එදා ඒ පිළිබඳව සොයා බැලීම පිණිස එක පුද්ගල කොමිසමක් පත් කොට එහි කොමසාරිස්වරයා වශයෙන් රාජනීතිඥ නඩරාජා මහතා පත් කරන්නට යෙදුණා. ඒ මරණය පිළිබඳව විභාගයක් පවත්වන්නට යෙදුණා. එවැනි විභාගයකින් සොයා ගන්නා කරුණු අනුව යම් පොලිස් නිලධාරියකුට විරුද්ධව නඩුවක් පැවරීමට ඉඩ තිබෙනවාය කියන කාරණය උඩ ඒ සාකච්ඡාව වැළැක්වීමට එදා සිටි කථානායකතුමා ඉදිරිපත් වුණා නම් යුක්තිය ඉෂ්ට කිරීමට එය බාධාවක් වෙනවා.

බ්‍රිතාන්‍ය මන්ත්‍රී මණ්ඩලයේ සිද්ධීන් ගැන කථා කරන නිසා මාද එහි ඇති වූ සිදුවීමක් ගැන මතක් කළ යුතුයි. 1957 දෙවැනිදා දෙසැම්බර් මාසයේ 7 වැනිදා මහා බ්‍රිතාන්‍යයේ එක්තරා සිද්ධියක් ඇති වුණා. "බේ කැෆේප්" නමැති විනෝද ස්ථානයට එදා පොලිස් නිලධාරීන් දෙදෙනකු ඇතුළු වුණා. හාපර් සහ ගන් නමැති මේ දෙදෙනා ඔය බේ කැෆේප් එකට ඇතුළු වුණා. ඇතුළු වන අවස්ථාවේදී එතැන සිටින කීප දෙනෙක් හූ කියන්නට පටන් ගත්තා. හූ කියන්නෙ අපේ රටේ විතරක් නොවෙයි. එහිදී නොයෙක් විධියේ අපහස සහගත කියමන්වලට මේ දෙදෙනා ලක් වුනා. ඒ කැෆේප් එකේ සිටි අය අතර බාල වයස්කාර ගැටවරයන් දෙදෙනෙකුත් සිටියා. මේ ගැටවරයන් පවා අර හූවට සහභාගි වුනා. මේ පොලිස් නිලධාරීන්ට විරුද්ධව නොයෙක් නොයෙක් දේ කිව්ව. ඊට පසු මේ ගැටවරයන් දෙදෙනාගෙන් එක් කෙනෙක්—වෝටර්ස් නමැති ගැටවරයා—රාත්‍රී කාලයේ ගෙදර යන අවස්ථාවේදී මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පොලිස් නිලධාරීන් දෙදෙනාට මුනගැසුනා. ඊට පසු ලේ ගලන තුවාළ රාශියක් ඇතිව වෙනත් අයට මේ ගැටවරයා හමු වුනා. එසේ හමු වුනාම කීවේ අර සිද්ධිය නිසා පලිගැනීමක් වශයෙන් පොලිස් නිලධාරීන් ඔහුට අඩන්තේට්ටම් කළ බවයි. මේ කාරණය පිළිබඳව පොලිසිය විභාගයක් පැවැත්වුවා. පොලිස් විභාගයෙන් පසු එතැනින් එහාට මේ කාරණය ගියේ නැහැ. එසේ නොගිය නිසා ඒ ප්‍රදේශය ඇතුළත් ඡන්දදායක කොට්ඨාශය වෙනුවෙන් මන්ත්‍රණ සභාවේ පෙනී සිටින මන්ත්‍රීවරයා මේ ප්‍රශ්නය පාර්ලිමේන්තුවේ මතු කළා. එසේ මතු කළ අවස්ථාවේදී රජය වෙනුවෙන් සිටි ප්‍රධාන නීති උපදේශක මහත්මයා මේ සම්බන්ධව ප්‍රකාශයක් කළා, මේ කරන චෝදනා පිළිබඳව දැනටමත් විභාගයක් පවත්වා ඒ පොලිස් නිලධාරීන්ට විරුද්ධව නඩු පැවරීමට සාක්ෂි නැති බව පෙනී ගොස් තිබෙන නිසා ඉන් එහාට යමක් කරන්න අපේ බලාපොරොත්තුවක් නැත කියා.

ගරු කථානායකතුමනි, එදා බ්‍රිතාන්‍ය මන්ත්‍රණ සභාව මොකක්ද තීන්දු කළේ? ඒ නීති උපදේශක මහත්මයාගේ තීරණය සෑහෙන්නෙ නැත කීයා තීරණය කළා. ඒ නිගමනයට බැස සාකච්ඡාවකට ඉඩ දුන්නා. ඒ සාකච්ඡාවේදී අර පොලිස් නිලධාරීන් දෙදෙනා ගැන කරුණු කියන්නට ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් වුනා. නමුත් කථානායකතුමා ඉදිරිපත් වෙලා කිව්වෙ නැහැ, අනාගතයේදී මේ දෙදෙනාට විරුද්ධව නඩුවක් ඉදිරිපත් වන්න පුළුවන්, ඒ නිසා සාකච්ඡාවකට ඉඩ දෙන්න බැහැ කියා. එදා ඒ කථානායකතුමා එසේ කියා සාකච්ඡාව තහනම් කළේ නැත කියායි, මා තමුන්නාන්සේට කියන්නෙ. බ්‍රිතාන්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රතිපත්තිය අනුව අපේ වැඩ කටයුතු සකස් කරන්නට ඕනෑය කියන තීරණය තියෙන නිසයි, මා මේ උදාහරණය තමුන්නාන්සේ ඉදිරිපිට තැබුවෙ. එදා ඒ සාකච්ඡාව තහනම් කළේ නැහැ. ඒ සාකච්ඡාවේ ප්‍රතිඵලයක් වශයෙන් නැවත විභාගයක් පැවැත්වීමට විශේෂ කොමිෂන් සභාවක් පත් කළා. ඒ කොමිෂන් සභාවේ තීරණයක් අනුව ඊට පසු යම් යම් කටයුතු සිදු වුණා. ඒ ගැන මම මේ අවස්ථාවේ තමුන්නාන්සේට මතක් කරන්න බලාපොරොත්තු වන්නෙ නැහැ.

වැදගත් කරුණ මෙයයි. මන්ත්‍රීවරුන්ගෙ සිතේ තිබුණු අදහසේ හැටියට ඒ පොලිස් නිලධාරීන් දෙදෙනා වැරදිකරුවන් හැටියටයි, පිළිගත්තෙ. ඒ අනුව තව දුරටත් විභාගයක් වුවමනාය කියන තර්කය ඉදිරිපත් කළා. ඒ තර්කය ඔප්පු කිරීම සඳහා ඉදිරිපත් වුනේ. ඒ සිද්ධිය සම්බන්ධයෙන් අනාගතයේදී නඩුවක් පැවරුනොත් ඒ නඩුවට අදාළ වන කරුණුයි. නමුත් ඒ කිසිවක් තහනම් කළේ නැහැ. මහා රැජිනගේ ප්‍රකාශය, එනම්, "අයර්ලන්තයේ ඇති වන සිද්ධීන් ගැන මම යමක් නොකියමි"යි කියන අදහස එදා මතක් වුනේ නැහැ. යම් ප්‍රශ්නයක් විනිශ්චයට යටහත්ව තිබෙනවා කියන අදහස ඉදිරිපත් කළේ නැහැ. එම නිසා විනිශ්චයට යටහත්ව තිබෙනවාය කියන තර්කය අනුව යමක් තහනම් කිරීමටත් සීමාවන් තිබෙන බව නියෝජ්‍ය කථානායකතුමාට එදා මතක තබා ගන්ට යුතුකමක් තිබුණ.

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ගැන තවදුරටත් කියනවා නම්, නියෝජ්‍ය කථානායකතුමාගේ තීරණයට හේතු දක්වමින් කළ ප්‍රකාශයේ මුල් කොටසේ උදාහරණ සියල්ලක්ම ගෙන බැලුවොත් පෙනී යනවා, "උසාවියකට පැමිණෙන යම් පුද්ගලයකුට අවාසියක් විය හැකිය," කියන අදහස ඒ හැම උදාහරණයකම තිබෙන බව. මම මේ කියවන්නෙ, 1966 සැප්තැම්බර් 24 වැනිදා හැන්සාඩ් වාර්තාවේ 745 වෙනි තීරුවෙන්:

"In Parliamentary Debates 1904, Volume 138, at column 788, a Member had asked leave to move the Adjournment to discuss the failure of the Irish executive to institute prosecutions against a certain person promptly."—[OFFICIAL REPORT, 24th September 1966; Vol. 70, c. 751.]

ඇතැම් පුද්ගලයෙකුට විරුද්ධව නඩුවක් ගත්තෙ නැත කියන කාරණය උඩ ඒ එක නිදර්ශනයක්.

"In the House of Commons Debates 1934-1935, Volume 299, at column 204, a Member had asked leave to move the

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

Adjournment to discuss the loss of two steam ships. The Speaker replied that the matter could not be raised as it was *sub judice* and an inquiry if not already held was about to be held."—[OFFICIAL REPORT, 24th September 1966; Vol. 70, c. 751.]

එතැන විශේෂයෙන්ම නැව් නැතිවීමක් ගැන යම් දෙපාර්තමේන්තුවක් සාකච්ඡාවට භාජන වී තිබෙන අවස්ථාවෙදි, ඒ අයට අවාසියක් වන්ට පුළුවන් කියන අදහසින්.

"In the West Bengal Legislative Assembly Debates, B.L.A., HANSARD 3, pages 22 to 29, the following ruling was made by Mr. Speaker Jalan: "—

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.

(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)

(Mr. F. R. Dias Bandaranaike)

ඒක ලයිබ්‍රරියෙවත් නැහැ.

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்ணாட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

"'As soon as a person is arrested on a criminal charge, the matter becomes *sub judice*.'"—[OFFICIAL REPORT, 24th September 1966; Vol. 70, c. 752.]

"යම් කෙනෙක් පොලිස් අත් අඩංගුවට ගත් වෙලාවෙ සිට". නමුත්, එය බ්‍රිතාන්‍ය ප්‍රතිපත්තියට තරමක් වෙනස් වූ දෙයක්. මක්නිසාද? අර්ස්කින් මේ කියා තිබෙන්නෙ මේ විධියටයි:

"This Resolution bars references in debate (as well as in Motions and Questions) to matters awaiting or under adjudication in all courts exercising a criminal jurisdiction and in courts martial from the moment the law is set in motion by a charge being made to the time when verdict and sentence have been announced".

Mark the words: "From the moment the law is set in motion by a charge being made".

"යම් චෝදනාවක් ඉදිරිපත් කළ මොහොතේ සිට" එදා සිට යම් පිරිසකට අවාසියක් සිදුවන්ට පුළුවනි. ඒ වචන ටික ගරු නියෝජ්‍ය කථානායකතුමාට අමතක වුණා, ඔහුගේ තීරණය දීමෙදි.

මේ සියල්ලම කියල ගරු නියෝජ්‍ය කථානායකතුමා ඊළඟට යනව, දොම්පෙ ගරු මන්ත්‍රීතුමා (එෆ්ප්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) ඉදිරිපත් කළ යම් ප්‍රශ්නයක් ගැන පිළිතුරු දෙන්න. ඊට පසුව මේ මරණ පරීක්ෂණය ගැන කථා කරන්ට යනව. එසේ කථා කරමින් කියන්නෙ මේකයි. ඒ මරණ පරීක්ෂණය පැවැත්වූ මහේස්ත්‍රාත්තුමා දෙවෙනි වර දී තිබෙන තීන්දුවට අඩංගුවූයේ කුමන්ත්‍රණ නඩුවට අසුවී සිටින උදවියගේ සාක්ෂියි; ඒ නිසා ඒ ගැන මෙතැන සාකච්ඡා කරන්ට ගියොත් ඒ කුමන්ත්‍රණ නඩුවේ විත්තිකරුවන්ට අවාසියක් සිදුවන්ට ඉඩ තිබෙන බවයි. දොඩම්පෙ මුදලාලි මහත්මයාගෙ මිනිමැරුම පිළිබඳ වගකියයුතු උදවියට අනාගතයෙදි ඇති විය හැකි හානියක් ගැන නොවෙයි එතුමා කියන්නෙ. "කුමන්ත්‍රණ නඩුවේ විත්තිකරුවන් පිළිබඳව විභාගයක් පවත්වාගෙන යනවාය; ඒ අයගේ සාක්ෂි උඩය මෙතැන මේ තීන්දුව දුන්නෙ; ඒ නිසා මේ තීන්දුව ගැන සාකච්ඡාවක් ඇති වීමෙන් ඒ අයට හානියක් වෙන්ට පුළුවනිය" කියා තිබෙනව. ඒ නිසා, නියෝජ්‍ය කථානායකතුමාගේ තීරණයේදි තීරු 2 1/2 ක් යන තුරු ඉදිරිපත් කළ කරුණු අවසාන වශයෙන් දුන් තීන්දුවට කිසිම විදියකින් ගැළපෙන්නෙ නැහැ. කියන්ට පටන් ගත්තෙ දොඩම්පෙ මුදලාලි මහතාගෙ සිද්ධිය නිසා ඉදිරියට යම් කෙනකුට අමාරුවක් ඇතිවන්ට පුළුවන් නිසා මේක සාකච්ඡා කරන්ට ඉඩ නොදෙනවය කියන පැත්තට බරවෙලයි. ඒ සේරම පැත්තක තියල අවසාන වශයෙන් කියනව, දෙවැනි තීන්දුවට සාක්ෂි දුන්නෙ කුමන්ත්‍රණ නඩුවෙ විත්තිකරුවන් නිසා ඒ අයට භායනික් වීම වැළැක්වීම සඳහා ඒ ගැන යමක් කථා කරන්ට දෙන්නෙ නැහැ කියල. එතැනිනුයි, අවසාන වන්නෙ. ඉදිරිපත් කළ තර්කවලට තීරණය ගැල පෙන්නේ නැහැ.

කථානායකතුමනි, තමුන්නාන්සෙට විශේෂයෙන් මතක් කරන්නෙ, ඉදිරිපත් කර තිබුණු යෝජනාව ඊති විරෝධිය කියල නැති බවයි. "මේ යෝජනාව ගැන සාකච්ඡා කිරීමට ඉඩ නොදෙමි" කියලයි, කියන්නෙ. නියෝජ්‍ය කථානායකතුමා එක තැනකවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා නැහැ, "මම මේ යෝජනාව ඊති විරෝධී යෝජනාවක් හැටියට නවත්ව නව" කියල. "මම මේ යෝජනාව ගැන සාකච්ඡා කිරීමට ඉඩ නොදෙමි" කියලයි, කියන්නෙ.

නියෝජ්‍ය කථානායකතුමා මේ පිළිබඳව මේ විදියට ප්‍රකාශ කිරීම පුදුමයි. අද තිබෙන කුමන්ත්‍රණ නඩුවේ විත්තිකරුවන්ට වාසියක් වන ප්‍රකාශයක් මෙතැන ප්‍රකාශ වීම වැළැක්වීම සඳහා ආණ්ඩු පක්ෂයෙ මන්ත්‍රීවරයෙක් උත්සාහ දැරීම නම් හිතන්ට පුළුවන් දෙයක්. ඒක අහේතුක දෙයක් නොවේය කියා අපට කියන්ට පුළුවන්. ඒ මිනි මැරුම ගැන සාකච්ඡා කිරීමෙන්, එම නඩුවේ සාක්ෂිකරුවන් කුමන්ත්‍රණ නඩුවේ විත්තිකරුවන් හැටියට පෙනී සිටින නිසා ඔවුන්ට යම් අවාසියක් වේය කියන කාරණය නම් ටිකක් හිතන්ට අමාරු දෙයක්.

කථානායකතුමනි, මෙතැන වුණේ මොකක්ද? රාජ්‍ය පැහැර ගැනීමේ කුමන්ත්‍රණය පෙබරවාරි මාසයේ සිදු වුණාය කියන කථාවක් පැතිර ගියා. ගරු රාජ්‍ය ඇමතිතුමා එදා හිටියෙ, ගරු අගමැතිතුමාගෙ වැඩ බැලීමේ අවස්ථාවකයි. ඒ පිළිබඳව මේ සභාවෙදි රාජ්‍ය ඇමතිතුමා ගෙන් ප්‍රශ්න කළ අවස්ථාවෙ එතුමා ප්‍රකාශයක් කළා, "රජය පැහැර ගැනීමක් පිළිබඳව නොවෙයි, ඇතැම් ඇමතිවරුන්ටත් මන්ත්‍රීවරුන්ටත් බලහත්කාරකම් කිරීමට පිරිසක් සූදානම් වුණාය, ඒ ගැන විභාගයක් කරගෙන යනවාය" කියා. මූලාසනයෙ සිටි කථානායකතුමා ඒ අවස්ථාවෙ එම ප්‍රකාශ කිරීම තහනම් කළේ නැහැ.

ඊළඟට, සභාව කල් තැබීමේ අවස්ථාවලදි දෙවරක්ම හදිසි අවස්ථාව පවත්වා ගෙන යාම පිළිබඳව මේ සභාවෙ සාකච්ඡා ඇති වුණා. ඒ අවසථාවලදි රාජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා හදිසි අවස්ථාව පිළිබඳ එම රෙගුලාසි, මේ විභාගයට අවශ්‍යයි කියා. එවැනි එක් අවස්ථාවකදි යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මේ විත්තිකරුවන් ගැන විශේෂයෙන්ම මෙතැන සඳහන් කළා. ඒ ප්‍රකාශය කරන අවස්ථාවෙදි, "මේ විත්තිකරුවන් මෙතැන විවාදයට භාජන වෙනවාය, එයින් ඔවුන්ට වාසියක් හෝ අවාසියක් වෙන්ට පුළුවන්ය" කියා ඒ

ප්‍රකාශය වළක්වන්ට මූලාසනයෙ සිටි කථානායකතුමා ඉදිරිපත්වුණේ නැහැ; එම ප්‍රකාශය තහනම් කළේ නැහැ.

ඊටපසුව මහෙස්ත්‍රාත් උසාවිය ඉදිරිපිට ප්‍රාථමික විභාගයක් කළා. ඒ අවස්ථාවෙදි පොලිසියේ පරීක්ෂණය නැවතුණේ නැහැ. ඒ නිසා තමයි, එල්. වී. පොඩි අප්පුහාමි මහතා හිර භාරයට අරගෙන යම් කරුණු සම්බන්ධයෙන් ඔවුන්ගෙන් ප්‍රශ්න කරන්ට වුවමනා යයි කියමින් ඔවුන් රහස් පොලිසියෙ මධ්‍යම කාර්යාලයට අරගෙන ගියේ. එවැනි අවස්ථාවලදි, මෙම පරීක්ෂණ යන් කරගෙන යන කාලයෙදි ඔය සිද්ධින් ගැන මේ සභාවෙ ප්‍රශ්න කරන්ට යෙදුණ. ඒ එක ප්‍රශ්නයක්වත් තහනම් කළේ නැහැ. ඊට පසු දොඩම්පෙ මුදලාලි මහත්මයා ජනේලයෙන් වැටුණාය කියන ප්‍රකාශයක් කළාට පසුවත්, ඒ සම්බන්ධව මේ සභාවෙදි මතක් කරන්න යෙදුණා; නමුත් කිසිම තහනමක් ඇති වුණේ නැහැ. ඊ ළඟට මහෙස්ත්‍රාත් තැන්පත් ස්වර්ණාධිපති මහතා විසින් විශේෂ පරීක්ෂණයක් පවත්වා, මිනීමැරුමක් සිදු වී තිබෙනවාය කියා දෙවැනි වරට තීන්දුවක් දුන්නා. ඒ තීන්දුව දුන්නට පසුවත්, සභාව කල් තැබීමේ අවස්ථාවකදී මැද කොළඹ තුන්වන ගරු මන්ත්‍රීතුමා ඒ ගැන දීර්ඝ වශයෙන් කථා කළා. කථානායකතුමා ඒ කථාවත් තහනම් කළේ නැහැ. ඒ කථා කළ අවසථාවෙදි සෑම කාරණයක්ම එල්ල කෙළේ ආණ්ඩුවට විරුද්ධවයි. ඒ අනුවමයි අපි විශ්වාස භංග යෝජනාවක් සකස් කෙළේ.

මේ කරුණු පෙන්වා දීමෙන් මම අදහස් කරන්නෙ මේකයි. ආණ්ඩුව පිළිබඳව විශ්වාස භංගත්වය ප්‍රකාශ කෙරෙන මෙම යෝජනාව ඉදිරිපත් කෙළේ දොඩම්පෙ මුදලාලි මහතාගේ මරණය පිළිබඳව දුන් මිනීමැරුම් තීන්දුව සම්බන්ධවයි. කල් තැබීමේ යෝජනාවකදි මැද කොළඹ තුන්වැනි ගරු මන්ත්‍රීතුමා එවැනිම කරුණු කලින් ඉදිරිපත් කර තිබුණ. ඒ වාගේම අප්‍රේල් මස 24 වෙනිදා හදිසි තත්ත්වය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය කථානායකතුමා කෙරෙහි විශ්වාස භංගය

[බර්නාඩ් සොයිසා මයා.]

පිළිබඳව ඇති වුණ විවාදයේදී මැද කොළඹ තුන්වන මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ කාරණා වලින් සමහරක් මම දැන් පෙන්වා දෙන්නම්:

"A relative of one of the detenus showed me a letter this detenu had written to his wife and which had been sent to her officially, through the Permanent Secretary to the Ministry of Defence and External Affairs, who, I presume, would have also read the letter. I do not know whether what this detenu says is true or not, but in this letter, which came through the officials, the detenu writes, and I quote:

'The physical and mental torture I am undergoing . . .'

I do not know what he means by it. He does not describe it. But those are the exact words that he used.

There is also information that another detenu had been assaulted by a naval officer, not by the C.I.D. but by a naval officer, in the Hulftsdorp Remand Jail, which has now been declared a place for detention and no longer a prison."—[OFFICIAL REPORT, 24th April 1966; Vol. 65, c. 2056-7.]

මැද කොළඹ තුන්වැනි ගරු මන්ත්‍රීතුමා අප්‍රේල් මාසෙ 24 වෙනිදා හදිසි තත්ත්වය ගැන ඇති වුණ විවාදයේදී අනාගතයේදී ඇති වන්නට පුළුවන් නඩුවක් පිළිබඳ කරුණුයි මෙසේ ඉදිරිපත් කර තිබෙන්නෙ. ඒ නිසා මේ කරුණු විනිශ්චය කට යටහත් වූ දෙයක් හා සම්බන්ධය කියා නවත්වන්න ඉඩ තිබුණා; නමුත් නැවැත්තුවෙ නැහැ. තහනම් කෙළේ නැහැ. අප්‍රේල් මාසෙ 24 වෙනිදා ඉඩ දුන්නානම්, සැප්තැම්බර් මාසෙ ඉඩ දුන්නානම්, ආණ්ඩුව පිළිබඳව විශ්වාස භංගත්වය ප්‍රකාශ කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවෙ දී පමණක් ඒ කාරණය විනිශ්චයකට යටහත් වනවාය කියන කාරණය මතුවුණේ කොහොමද?

කථානායකතුමනි, මේහී දේශපාලන හේතූන් තිබෙනවා. මෙම යෝජනාව පිළිබඳ විවාදය ආරම්භ කරන්න මත්තෙන් තමුන්නාන්සේ අපට ආරාධනා කළා, අප ඉදිරිපත් කරන කරුණු, නැත්නම් අපි පවත්වන කථා මෙම යෝජනාවට සීමා කරන්නය කියා. මම කිසිසේත්ම මෙම යෝජනාවෙන් පිට පනින්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. එහෙත් මෙම යෝජනාවේම සඳහන් එක් කාරණයක් මම ඉතාමත් ගෞරවයෙන් සඳහන් කරන්න ඕනෑ:

"අගමැතිතුමා විසින් විවාදයකට මුලින් සතුව ප්‍රකාශකර තිබියදීත්, ඇල්. වී. පොඩිඅප්පුහාමි මහතා හෙවත් දොඩම්පෙ මුදලාලි මරාදැමීම සම්බන්ධයෙන් ආණ්ඩුවේ කෲ ක්‍රියාව පිළිබඳව විරුද්ධ පක්ෂය විසින් ඉදිරිපත් කළ ආණ්ඩුව කෙරෙහි විශ්වාස භංගය ප්‍රකාශ කිරීමේ යෝජනාව සාකච්ඡා කිරීම දීනි විරෝධියයි 1966 සැප්තැම්බර් මස 24 වැනි දින නියෝජ්‍ය කථානායකතුමා විසින් තීරණය කොට එනයින් විරුද්ධ පක්ෂයේ නිත්‍යනුකූල අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කොට එකී යෝජනාව විවාද කිරීමෙන් වැළකී සිටීමට ආණ්ඩුව විසින් දරණ ලද ප්‍රකාශිත හා බියසුළු ප්‍රයත්නයට ආධාර කළ නිසාත්;....."

එය මේ යෝජනාවෙ අඩංගු දෙයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙ හැසිරීම පිළිබඳ විවේචනයක්. නමුත් ඒ විවේචනයෙන් කෙරෙන්නෙ දේශපාලන චෝදනාවක්. ආණ්ඩුව ලක් වන දේශපාලන චෝදනාවක්. එනම් දොඩම්පෙ මුදලාලිගෙ මරණය පිළිබඳව මේ ආණ්ඩුවට විරුද්ධව ඉදිරිපත් කළ විශ්වාස භංග යෝජනාව සාකච්ඡා කිරීමට ඔවුන් බියසුළු වුණාය කියන චෝදනාවයි. ඒ බයට නියෝජ්‍ය කථානායකතුමාත් යට වුන බවයි.

දොඩම්පෙ මුදලාලිගෙ මරණය පිළිබඳව මේ ගරු සභාවෙ මතක් කළ ප්‍රථම අවස්ථාවෙදී පළාත් පාලන උප ඇමතිතුමා යම් කිසි වචනයක් කියන්න යෙදුණා. විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන එනවා නම් ගෙන ආ යුත්තේ මහෙස්ත්‍රාත්වරයාට විරුද්ධවයයි කිව්වා. ඒ ගැන එදා නියෝජ්‍ය කථානායකතුමා පළාත් පාලන කටයුතු පිළිබඳ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට තමන්ගේ තිබෙන අප්‍රසාදය පළ කළා.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

අනුවිශ්‍යයයි කිව්වා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
"අන්නෙසසරි" යන වචනය පමණයි පාවිච්චි කළේ. එපමණයි කිව්වෙ. ඊට වඩා දුරට කියන්න ඉඩ තිබුණා. තමන්ගෙ අප්‍රසාදය පළ කරන්න තිබුණා. එහෙත් ඒ සම්බන්ධව විරුද්ධත්වයක් ඇති බව දෙන්නුවා.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
නැහැ, "අන්නෙසසරි" කිව්වා.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
ඊට වඩා එහාට යන්න එදා ඉඩ තිබුණා. අපේ යෝජනාව කිසිම මහෙස්ත්‍රාත්වරයෙකුට හෝ උසාවියකට යම් බලපෑමක් ඇති කරන්නකැයි කල්පනා කරනවා නම් ඊට වඩා නරක දෙයක් හැටියටයි එදා පළාත් පාලන කටයුතු පිළිබඳ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගේ වචන භාර ගන්න තිබුණෙ. ඒ සම්බන්ධව ඒ ආකාරයෙන් ක්‍රියා කළ නියෝජ්‍ය කථානායකතුමා අපේ යෝජනාව මතු වන අවස්ථාවේදී මෙවැනි තීරණයක් ගැනීම නුසුදුසු දෙයක් හැටියටයි මා කල්පනා කරන්නෙ.

මේ කාරණය මතු කළ අවස්ථාවේදී, අප යෝජනාවක් ගැන සාකච්ඡාවක් කරන්න ඉඩ ඉල්ලන අවසථාවේදී, තමුන්නාන්සෙට මතකයි පක්ෂ නායකයන්ගේ සාකච්ඡාවක් කැඳවන්නට යෙදුණු බව. ඉන් පසු මේ ගරු සභාවේදී 1966 සැප්තැම්බර් මාසයේ 18 වැනිදා දින නියමයක් පිළිබඳව සාකච්ඡාවක් කරන්න යෙදුණා. පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) මෙහෙම කිව්වා :

"MR. LESLIE GOONEWARDENE :

I was not here last evening, but I find a report in the newspapers that before the House adjourned last night the Hon. Prime Minister said that the days for the Debate on the No Confidence Motion have already been fixed by the Government.

THE HON. DUDLEY SENANAYAKE :

I shall explain that. The Hon. Leader of the House informed me that the Opposition wanted two days for the Debate on the No Confidence Motion, and I said, 'Let them have these two days, that is, the 24th and the 25th'.

MR. MAITHRIPALA SENANAYAKE :

We asked for the 23rd and the 24th.

THE HON. DUDLEY SENANAYAKE :

We also have certain adjustments to make. Both sides have to make adjustments, not one side only. We are giving you the first opportunity to debate the No Confidence Motion. We want it. We welcome it."—[OFFICIAL REPORT, 18th September 1966 ; Vol. 70, cs. 451-2]

කේ. බී. රත්නායක මයා. (අනුරාධපුර)
(திரு. கே. பி. ரத்நாயக்க—அனுராதபுரம்)
(Mr. K. B. Ratnayake—Anuradhapura)
ඒ එදා.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
ගරු අග්‍රාමාත්‍යතුමා "වී වෝන්ට් ඉට්"—අපට මෙය වුවමනායි, අප මෙයට සතුටුයි, අප මෙය භාර ගන්නව, පිළිගන්නව ආදි වශයෙන් කිව්වා. එසේ කී ගරු අග්‍රාමාත්‍යතුමාගේ අදහසට විරුද්ධව, පත් කරන ලද ගරු මන්ත්‍රීවර ජොන්ක්ලාස් මහත්මයා සහ බේරුවල ගරු මන්ත්‍රීතුමා (බකීර් ඒ. මාකර් මයා.) අපට මෙය වුවමනා නැතැයි කිව්වා. අප මෙයට අසතුටුයි, අප මෙය පිළිගන්නෙ නැහැ, කිව්වා. පිළිගන්නත් බැහැයි කිව්වා. එපමණක් නොව එය මේ ගරු සභාව නොපිළිගත යුතුය කියාත් කරුණු ඉදිරිපත් කළා. මේ සියල්ලම කළේ ගරු අගමැති සභාව තුළ සිටියදීයි. ගරු කථානායකතුමනි, මොකක්ද මේ අතරතුරේ ඇති වූ බිය? මේ අතරතුර ඇති වූ සිද්ධි මොනවද? කැබිනට් මණ්ඩලය ඇතුළත ඇති වන රහස් පිළිබඳව මේ ගරු සභාවේදී සාකච්ඡා කරන්න මා ලෑස්ති නැහැ. තමුන්නාන්සේ ඊට ඉඩ දුන්නත් ඒ ගැන වැඩි දුර යමක් කියන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. එවැන්නක් කරන්න මට වුවමනා කරන්නෙත් නැහැ. එහෙත් අප කවුරුත් එක් කාරණයක් දන්නව. මේ යෝජනාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

සාකච්ඡා කරන්නට යෙදුණා නම් පොලිසිය පිළිබඳව විවේචනයකුත් කරන්න සිදු විය හැකිව තිබුණා. ඇයි එහෙම කිව්වේ? පොලීසියේ අත් අඩංගුවට ගනු ලැබ සිටි දොඩම්පේ මුදලාලි එසේ සිටිද්දී මිනී මැරුමකට භාජන වුණාය කීවා නම් ඒ සම්බන්ධ වගකීම කාගේද? ඒ ප්‍රශ්නය මතු වෙනවා. එහෙත් පොලීසියේ එක් පුද්ගලයෙකු පිළිබඳ යම් වගකීමක් තිබුණා නම් අන්න එතකොට නියෝජ්‍ය කථානායකතුමාගේ තීරණය සාධාරණයි කියන්න තරමක්වත් ඉඩ තිබුණා. ඒ නිලධාරියා පිළිබඳව—ඒ කියන පුද්ගලයා පිළිබඳව—නඩු විභාගයක් කර අවසන් වන තුරු ඒ ගැන මෙහිදී අප සාකච්ඡාවක් නොකළ යුතුයයි කිව්වා නම් එය සාධාරණයයි කියන්නත් පුළුවනි. මෙය එසේ එක්තරා නිලධාරියෙකුගේ වගකීමක් පිට තිබුණු සිද්ධියක් නොවෙයි. අසුවල් පොලීස් නිලධාරියාය කියන්න පුළුවන්කමක් වුණේ නැහැ. එහෙත් පොලිස් දෙපාර්තමේන්තුවේ වගකීමක් තියෙනවා. ඒ ගැන වගකිව යුත්තා කවුරුද? ඒ සම්බන්ධයෙන් වගකිව යුත්තේ වැඩ බලන ඇමතිවරයා හැටියට එදා සිටි රාජ්‍ය ඇමතිතුමායි. රාජ්‍ය ඇමතිතුමා පිළිබඳව—රාජ්‍ය ඇමතිතුමාගේ කටයුතු පිළිබඳව—චෝදනාවක් පැන නැගෙනවා නම් සම්පූර්ණයෙන්ම ඒ ගැන වගකීමක් භාර ගන්නට සිදුවෙනවා. එලෙසම ඊට කැබිනට් මණ්ඩලය වගකිව යුතුයි. ඒ ගැන කැබිනට් මණ්ඩලය වගකියනවා නම් මුළු හත් හවුල් ආණ්ඩුවම ඊට වගකියන්න ඕනෑ. මෙපමණයි අපි කියන්න ලැස්ති වුණේ. මෙයින් අධිකරණයට කෙසේ බල පෑමක් කෙරෙනවද, කුමන්ත්‍රණ නඩුවේ විත්තිකරුවන්ට කෙසේ අවාසියක් සිදු වෙනවද යන වග අපට තේරුම් ගන්න අමාරුයි. නමුත් මෙහි එක කරුණක් නම් තියෙනවා. එදා තිබුණු තත්ත්වය අනුව කැබිනට් මණ්ඩලය තුළ පාර්ශ්ව දෙකක් අතර ඇති වුණා යයි කියන සංවිධානය මෝරා යමින් තිබුණු නිසා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙ වැඩ කටයුතු එදා මෙහිදී විවේචනයට ලක් වීම ආණ්ඩුවට උසුලන්න බැරි දෙයක් වී තිබුණා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

This is not a Vote of Censure on me.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

On the whole Government through you.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்சா)
(Mr. Bernard Soysa)

ගරු කථානායකතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමා මිනිමරුවෙක් යයි මම කවදාවත් කියලත් නෑ; දැන් කියන්නෙත් නෑ. මම එවැනි චෝදනාවක් කරන්නෙ නෑ. සම්පූර්ණ වගකීම තිබෙනවදැයි එතුම මගෙන් ඇහුව. එතුම කෙනකුගෙ අතට පිහියක් දුන්නය, කෙනකු ජනේලයෙන් තල්ලු කරන්න එතුමා උදව් කළාය කියා නොවෙයි මම යකින්නෙ. නමුත් එදා පොලිසිය පිළිබඳ වගකීම පැවරී තිබුණේ ගරු රාජ්‍ය ඇමතිතුමාටයි. එම නිසා, රජයේ ආයුධයක් හැටියට කටයුතු කිරීමේ දී එතුමට එක්තරා වගකීමක් පැවරී තිබෙනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමාට දීර්ඝායුෂ පතන්නට මම හැම විටම ලැස්තියි. එහෙත් වෙනත් රටවල මෙවැනි සිද්ධීන් ඇති වුණු අවස්ථාවලදී ඇමතිවරුන් ක්‍රියා කර තිබෙන ආකාරය ගැන මම මෙහිදී මතක් කරන්න අදහස් කරනවා. වරක් ඉන්දියාවෙ විශාල දුම්රිය අනතුරක් සිදු වී එයින් කීප දෙනකු මරණයට පත් වීම එවකට සිටි ගමනාගමන කටයුතු පිළිබඳ ඇමතිතුමාට උසුලාගන්න බැරි වුණා. ඒ සිද්ධිය පිළිබඳව තමන්ට පැවරෙන වගකීම ඒ ඇමතිතුමා කොයි තරම් තදින් හිතට ගත්තද කියතොත්, එතුමා නිලයෙන් අස් වුණා පමණක් නොව සිය පණත් නසා ගත්ත. එවැනි දෙයක් කරන්න මම ගරු රාජ්‍ය ඇමතිතුමාට කියන්නෙ නෑ. දකුණු කොළඹ මගේ සහකාර ගරු මන්ත්‍රීතුමාට දීර්ඝායුෂ පතන්න මම කැමැතියි. නමුත් ඇමතිවරයෙකුගෙ වගකීම පිළිබඳ තත්ත්වය සැලකෙන්නෙ ඒ විධියටයි. ඉන්දියා වේ කන්ද ඇමතිතුමාත් අද මෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැනි අවස්ථාවක් මුල් කොට සිය නිල යෙන් ඉල්ලා අස්වෙලා. ඇමතිවරයෙකුගෙ වගකීම, කැබිනට් මණ්ඩලයක වගකීම, ආණ්ඩුවක වගකීම ඒ විධියටයි. [බාධා කිරීමක්]

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඩේවිඩ් සිල්වා ගැන කොහොමද?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்சா)
(Mr. Bernard Soysa)
ගරු ඇමතිවරුත් ආණ්ඩු පක්ෂයෙ ගරු මන්ත්‍රීවරුත් අපට නිතරම මතක් කර දෙන දෙයක් තමයි ඩේවිඩ් සිල්වගෙ සිද්ධිය. ඒ නිසා මෙහිදී ඒ ගැන වචනයක් කියන්න ඕනෑ. මා ඒ ගැන කථා කරන්නෙ එදා ඇති වුණු ප්‍රතිපත්තිය ආරක්ෂා කරන්න නොවෙයි. නමුත්, ඩේවිඩ් සිල්වා මහතා පිළිබඳ සිද්ධියත් දොඩම්පෙ මුදලාලි පිළිබඳ සිද්ධියත් අතර වෙනසක් තිබෙනව. ඩේවිඩ් සිල්වා මහතාත් ආර්ලිස් සිල්වා මහතාත් මරණයට පත් වුණේ රටේ කලබලකාරී තත්ත්වයක් තිබුණු අවස්ථාවෙදියි. නමුත් දොඩම්පෙ මුදලාලි මරණයට පත් වන අවස්ථාවේ රටේ කිසිම කලබල තත්ත්වයක් තිබුණෙ නෑ. මොන විධියකින්වත් මිනීමැරීම යුක්ති සහගත යයි මම එයින් අදහස් කරන්නෙ නෑ. නමුත් ඒ අවස්ථා දෙකේ වෙනස පෙන්වා දිය යුතුව තිබෙනව. [බාධා කිරීමක්] ගරු අධ්‍යාපන ඇමතිතුමා බොහොම හොඳට මට ඇහුම්කන් දීගෙන සිටීම ගැන මම එතුමාට විශෙෂයෙන් ප්‍රශංසා කරනව. ඩේවිඩ් සිල්වා මහතාගෙත් ආර්ලිස් සිල්වා මහතගෙත් මරණ සිදු වන අවස්ථාවේ දී ඒ පළාත බාරව සිටි උප පොලිස්පති තුමා තමයි, ඊට පසුව ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමා අගමැති වශයෙන් සිටි කාලයෙදි එතුමා විසින් ස්ථාවර ලේකම් නිලයකට පත් කර ගත්තෙ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
මම අහන්නෙ ඒක නෙමෙයි. ඩේවිඩ් සිල්වා මැරූ කාලෙ හිටපු අගමැතිතුමා ඉල්ලා අස් නුණෙ ඇයි?

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
දහනායක ඇමතිතුමාගෙන් අහන්න.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
බණ්ඩාරනායක අගමැතිතුමාගෙ කාල යේනෙ.

බර්නාඩ් සොයියා මයා.
(திரு. பெர்ணாட் சொய்சா)
(Mr. Bernard Soysa)
කාටවත් ඉල්ලා අස් වෙන්නය කියා මා බල කරන්නෙ නැහැ. මුළු ආණ්ඩුවම ඉල්ලා අස් වෙනවා නම් මා කැමතියි. [බාධා කිරීමක්] පෞද්ගලික වශයෙන් එක ඇමතිවරයෙක් පමණක් අස් කරන්න මගේ බලාපොරොත්තුවක් නැහැ.

ගරු කථානායකතුමනි, ඊළඟට කියන්න තිබෙන්නේ මෙයයි: දැන් ආණ්ඩු බලය තිබෙන්නේ මේ අය අතේයි. පොලිසිය බාරව තිබෙන්නෙ ආණ්ඩුවටයි. පොලිස් වාර්තාවල් තිබෙන්නෙත් මේ ආණ්ඩුව අතෙයි. ඒ නිසා දැන්වත් ඩේවිඩ් සිල්වාගේ හා ආර්ලිස් සිල්වාගේ මරණ පිළිබඳව පරීක්ෂණයක් නොපවත්වන්නේ ඇයි? අපි ඒ ගැන පරීක්ෂණයක් කළේ නැතෙයි කියනව. දැන් බලය ලබාගෙන සිටින තමුන්නාන්සේලා එය නොකරන්නෙ ඇයි?

ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)
(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல— கல்வி, கலாச்சார விவகார அமைச்சர்)
(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)
ඕවා අවුස්සන්නට දැන් කරදර වැඩියි.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்சா)
(Mr. Bernard Soysa)
ඒ වගකීම ගැන මා මතක් කරන්න යෙදුණේ මෙන්න මේ නිසයි: ඒ වගකීම පිළිබඳව මෙතන විවේචනයක් හෝ විග්‍රහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

යක් කිරීම වැළැක්වීමට ආණ්ඩුවට අවශ්‍ය තාවක් තිබුණ. අන්න ඒ නිසයි එදා අපි ඉදිරිපත් කළ ඒ යෝජනාව "We want it. We welcome it." කියා බාර ගත් අග මැතිතුමාගේම පක්ෂයේ මන්ත්‍රීවරයකු විසින්, වර්නන් ජොන්ක්ලාස් මන්ත්‍රීතුමා විසින්, ඉදිරිපත් කළ රීති ප්‍රශ්නය මුලසුන අනුමත කළේ.

ගරු කථානායකතුමනි, පොලිසියේ අඩන්තේට්ටම් නිසා මරණයට පත් වන අය පිළිබඳව, විශේෂයෙන්ම දේශපාලන හේතුවක් උඩ කරගෙන යන පරීක්ෂණයකට ඇතුළත් වූ කෙනෙක් සම්බන්ධව එවැනි පරීක්ෂණයක් කෙරෙද්දී මිනීමැරීමක් වුණාය කියා අධිකරණයේ නිලයක් දරන මහෙස්ත්‍රාත්වරයෙක් ප්‍රකාශයක් කළ විට ඒ ප්‍රකාශය පිළිබඳව ආණ්ඩුවට ඇති වන වගකීම අනුව ඉන් පසුව ගන්න පියවර පිළිබඳව අපට මේ ගරු සභාවේදී කථා කරන්නට ඉඩක් ලැබෙන්නෙ නැත්නම් මේ ගරු සභාවේදී අපට මුකවාඩම් පනතක් පිළිපදින්නට සිදු වෙනවාය කියන බයක් හා සැකයක් අප තුළ තිබෙනවා. අනාගතයේදී අපේ රටේ ඇති වන අනතුරු හා අපරාධ රාශියක් පිළිබඳව කණගාටුවට පත් වන්නටයි, අපට සිදු වී තිබෙන්නෙ.

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය කථානායකතුමාගේ ඒ තහනම විශේෂයෙන්ම අයුතුසහගත එකක් හැටියට පක්ෂග්‍රාහී එකක් හැටියට අපට පිළිගැනීමට සිදු වන තවත් කරුණක් මේ යෝජනාවේ සඳහන් වී තිබෙනව. 1966 සැප්තැම්බර් 26 වැනිදා සභාව කල් තබන අවස්ථාවේදී දෙණියායේ ගරු මන්ත්‍රීතුමා (සී. එන්. කන්නන්ගර මයා.) මෙන්න මේ විධියට ප්‍රකාශ කළා :

"Mr. Deputy Speaker, I read in today's papers the antics of a lawyer, Mr. Tissa Wijeratne, the eccentric son of a distinguished father. In fact, he was called "Pissu Wije" even at school. Mr. Tissa Wijeratne has said in court that Mr. J. R. Jayewardene has sought to interfere, etc., etc."—[Official Report, 26th September 1966; Vol. 70, c. 883.]

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ඒ දෙන්න එකට පාසැලේ සිටියා.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

ගරු රාජ්‍ය ඇමතිතුමාගේ ආරක්ෂාවටයි ඔහු මේ කථාව කළේ. අද මේ විවේචනය කළ දෙණියායේ ගරු මන්ත්‍රීතුමාත් තිස්ස විජේරත්න අධිනීතිඥ මහත්මයත් පාසැලේදී එකට සිටි අය බව විශේෂයෙන්ම දෙණියායේ ගරු මන්ත්‍රීතුමාගේ ආරක්ෂාව සඳහා ගරු රාජ්‍ය ඇමතිතුමා අපට මතක් කර දෙනවා. එහෙත් දෙනියායෙ ගරු මන්ත්‍රීතුමාට ඉඩ දෙන්ට බැහැ, එතුමා ස්කෝලෙ යන කාලෙ කළ දේවල් දැනුත් කරන්ට. [බාධා කිරීම්] අපේ නීති සංග්‍රහයෙ උසාවි පිළිබඳව විශේෂයෙන් මතක් කර දෙන දෙයක් තිබෙනව. අධිකරණයක් ඉදිරිපිට විත්තිය වෙනුවෙන් හෝ පැමිණිල්ල වෙනුවෙන් හෝ ඉදිරිපත් වන නීතිඥ මහත්මයකු පිළිබඳව විවේචනයක් කිරීම උසාවියට කරන ගැරහීමක් හැටියට එහි මතක් කර තිබෙනව. මෙම සභාවෙන් පිටතදී දෙනියායෙ ගරු මන්ත්‍රීතුමා එම වචන මාලාව ප්‍රකාශ කළා නම් උසාවියට ගැරහීමේ චෝදනාව උඩ දඬුවම් විඳින්න සිදු වෙනව. [බාධා කිරීම්] විත්තිකරුවකු වෙනුවෙන් ඉදිරිපත් වී සිටින නීතිඥයා පිස්සකු බව කියනව නම්, ඔහු ඔල්මාදයට eccentric ලක්වෙච්ච කෙනෙකු බව කියනව නම් [බාධා කිරීම්] ටිකක් පිස්සු ඇතැයි කියනව නම් එයින් විත්තිකරුවන්ට අවාසියක් සිදුවෙනවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ආදරණීය වචනයක්. [බාධා කිරීම්]

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

අවුරුදු ගණනකට පෙර, රාජ්‍ය ඇමතිතුමා විවාහ වන්නටත් මත්තෙන්, එක් තරු දවසක බම්බලපිටියෙ වෙරළ අද්දර ඇවිදගෙන යන වෙලාවෙ මම දුටුව

Digitized By Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එක්තරා යුවලක්. මම ඒ යුවල ළඟින් යද්දි මට ඇහුණා ඒ පුද්ගලය එම යුවතියට කියනවා, "පිස්සි, පිස්සි, පිස්සි" යනුවෙන්. දැන් මගේ කල්පනාවෙ හැටියට ඒ රාජ්‍ය ඇමතිතුමා වෙන්නටත් පුළුවනි. එදා කරුවලේ එතැන හිටියෙ කවුද කියන එක මට හරියට දැනගන්ට බැරි වුණා. නමුත් දැන් මගෙ සැකයක් තියෙනවා ඒ රාජ්‍ය ඇමතිතුමා දැයි කියා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
වෙලාව කීයට ඇද්ද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
තමුන්නාන්සෙ තනියමද ගියෙ?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

විත්තිකරුවකු වෙනුවෙන් අධිකරණය ඉදිරිපිට කතා කරන නීතිඥ මහතකු මෙතැනදි විවේචනයට ලක් වෙනවා නම් මම අහනවා ඒ හේතුකොටගෙන එම විත්තිකරුවාට අවාසියක් වෙන්නෙ නැද්ද කියන ප්‍රශ්නය. ඔවුන් අතර තිබුණු විශ්වාසය බිඳී යන්නෙ නැද්ද? ඒ අනුව ඔවුන් අතර තිබියයුතු සහයෝගය පලුදු වන්නෙ නැද්ද? එනිසා එම විත්තිකරුවාට අවාසියක් වෙන්නෙ නැද්ද? එක් අවස්ථාවකදි එක් පිළිවෙළක් අනුවත් තවත් අවස්ථාවකදි තවත් පිළිවෙළක් අනුවත් නියෝජ්‍ය කථානායකතුමා කටයුතු කිරීම වැරදියි. විපක්ෂයෙන් ඉදිරිපත් කරන යෝජනා පිළිබඳව එක් පිළිවෙලකට අනුව ක්‍රියා කරන අතර ආණ්ඩු පක්ෂයෙ ගරු මන්ත්‍රීවරයකුගෙ හැසිරීම පිළිබඳව තවත් විධියකට තීන්දු කර තිබෙන බව පේනවා. එය පක්ෂග්‍රාහී ලීලාවෙන් කළ වැඩක්ය කියන චෝදනාව මෙතැනදි මතු වන්නේ නැද්ද? ආණ්ඩු පක්ෂයේ වාසිය බලා නොවෙද? මීට වඩා මම මේ සම්බන්ධව කතා කරන්ට යන්නෙ නැහැ. මින් පසු කතා කරන ගරු මන්ත්‍රීන් තවදුරටත් මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරනු ලබනවා ඇති.

අප රටේ දේශපාලන තත්ත්වය එක් තරා කනගාටුදායක අවස්ථාවකට පැමිණ නිබෙනවා. ඒ වගේම අපි ආර්ථික වශයෙන් විශාල පරිහානියකට පත් වී සිටිනවා. ඒ අනුව ආණ්ඩුවට දේශපාලනමය ප්‍රශ්න රාශියකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. මෙවැනි අවස්ථාවක මේ අන්ද මේ සභාවක ගරුත්වය අපි රකින්ට ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදයට අනුව මෙම සභාවෙහි අයිතිවාසිකම් අපි රැකගන්ට ඕනෑ. එය අපේ යුතුකමයි.

එපමණක් නොවෙයි. මේ ප්‍රශ්නයෙන් මීට වඩා පුළුල් ප්‍රශ්නයක් මතු වෙනවා. අපේ යෝජනාවෙ අරමුණ හැටියට තිබුණෙ ඇල්. වී. පොඩිඅප්පුහාමි මහතා හෙවත් දොඩම්පෙ මුදලාලි මහත්මයාගෙ මරණය පිළිබඳව විශේෂ පරීක්ෂණයක් ඉල්ලීමයි. එදා තිබුණු තත්ත්වය අනුව විශේෂ කොමිෂන් සභාවක් මගින් හෝ විශේෂ පරීක්ෂණයක් ලබා ගැනීමේ බලාපොරොත්තුවක් අප තුළ තිබුණා. පොලිස් අත්අඩංගුවට ගන්නා යම් කෙනෙකුට, සාමාන්‍ය අපරාධයක් උඩ නොවෙයි විශේෂයෙන්ම දේශපාලන හේතුවකින් ඇති වුණාය කියන කාරණයක් උඩ, පොලිස් අත්අඩංගුවට ගන්නා කෙනකුට ආරක්ෂාවක් නැත්නම්, තමන්ගේ ජීවිතය ගැන විශ්වාසයක් ඇති කර ගන්නට බැරි නම්, අපේ රටේ දේශපාලනය විශාල පරිහානියකට පත්ව තිබෙන බව අප පිළිගන්නට ඕනෑ. ඒ කියන්නෙ අප රාධ මර්දන අංශය හැටියට සලකන පොලීසිය, විශේෂයෙන්ම රජයේ බල ඇනියක් හැටියට පවත්වාගෙන යන පොලීසිය, වුවමනාවෙන්ම පක්ෂග්‍රාහී අන්දමට තමන්ගේ දේශපාලන විරුද්ධ වාදීන්ට විරුද්ධව යොදවන්නට රජයට පුලුවන්ය යන කාරණයයි මතු වෙන්නෙ. එවැනි තත්ත්වයක් සම්බන්ධව නිසි අන්දමට රටේ සැලකිල්ල යොමු කරන්නට යුතුකමක් තිබුණු අවස්ථාවේදී—පොදු අයිතිය, මනුෂ්‍ය අයිතිය, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ අයිතිය ආරක්ෂා කිරීම උදෙසා අපේ විශේෂ සැලකිල්ල යොමු කරන්නට යුතුකමක් තිබුණු අවස්ථාවේදී—එදා මේ සාකච්ඡාව වැළැක්වීම මහජනතාවට විරුද්ධව කළ විශාල අපරාධයක් හැටියට සඳහන් කරන්නට පුලුවන්.

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය කථානායක ධුරය උසුලන හලාවත ගරු මන්ත්‍රීතුමා (සී. එස්. ඡර්ලි කොරෙයා මයා.) කෙනෙකුට ඉතා ගරුත්වයක් ගෞරවයක් හැර වෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

කිසිම අදහසක් මා තුළ නොමැති බව මා ආරම්භයේදීම සඳහන් කළා. මේ බද්දේ ගම ගරු මන්ත්‍රීතුමා (නීල් ද අල්විස් මයා.) වැනි ඒ මහත්මයාගේ තවත් කිට්ටු මිත්‍රයන් කීප දෙනෙකුම මේ පැත්තෙ ඉන්නව. නමුත් මේ යෝජනාව විරුද්ධ පාර්ශ්වය ඉදිරිපත් කරන්නේ නියෝජ්‍ය කථානායකතුමාට විරුද්ධව ඉදිරිපත් කරන යෝජනාවක් හැටියටයි. සාමාන්‍යයෙන් අපේ සිංහල සිරිත් විරිත් අනුව මිත්‍රයන් ගැන සලකන්නෙ කෙසේද කියා තමුන්නාන්සෙ දන්නව:

"මිතුරු තුමෝ දුක සැප දෙකෙහිම පැව නි
ඔතු සිතුවම් රූ මෙන් පිටු නොපාව නි"

යන කවි පදවලින් එය හොඳට පැහැදිලියි

නමුත් රටේ පොදු අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් මතු වන විට, මනුෂ්‍ය අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් මතු වන විට එයට හානියක් කරන්නෙ නම් පිටුපාන්නට සිද්ධ වෙනව. මිත්‍ර කමට වඩා දේශපාලන අයිතියෝජනාවෙ තිබුණු අදහස් මුළු රටේ රැව්යත් මනුෂ්‍ය අයිතියත් ලොකුයි. එම නිසයි, මේ යෝජනාව ඉදිරිපත් කළේ. සාකච්ඡා කිරීම වළක්වන්න යෙදුණු අපේ යෝජනාවෙ තිබුණු අදහස් මුළු රටේ රැව් පිළිරැව් දෙන බව ප්‍රකාශ කරමිනුත්, ඒ මගින් යම් දවසක---නුදුරු අනාගතයේදීම ---සත්‍යය හෙළි වන බවට මා තුළ විශ්වාසයක් තිබෙන බව ප්‍රකාශ කරමිනුත්, ඒ හෙළිවීම අනුව මේ මරණය පිළිබඳව වගකීමක් දරණ, පොලීසිය පිළිබඳව වගකීමක් දරණ, මේ හත්හවුල් ආණ්ඩුවට මහජනතාව නිසි පිළිතුර දෙන බවට මා තුළ තිබෙන විශ්වාසය ප්‍රකාශ කරමිනුත්, මේ යෝජනාව තමුන්නාන්සේ ඉදිරියේ තබනව.

ප්‍ර. භා. 11.50

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

ගරු කථානායකතුමනි, මේ යෝජනාව ස්ථිර කරන අවස්ථාවේදීම මාගේ කථාවත් කරන්නටයි මා කල්පනා කළේ. මේ යෝජනාව ඉදිරිපත් කරමින් දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) නියෝජ්‍ය කථානායකතුමා වැරදියට දුන් තීන්දුව පිළිබඳව, ඒ තීන්දුව තුළ තිබෙන වැරදි තර්ක පිළිබඳව, හේතු සහිතව කථා කළා. ඊටත් වඩා පලල් අන්දමින් කරුණු ඉදිරිපත් කරන්නටයි මා කල්පනා කරන්නෙ.

මගේ කල්පනාවේ හැටියට නියෝජ්‍ය කථානායකතුමා මේ තීන්දුව දුන්නේ සම්පූර්ණයෙන්ම පක්ෂපාතවයි. එය මා මේ ගරු සභාවට ඔප්පු කරනව. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරයකු වන එතුමා නියෝජ්‍ය කථානායක හැටියට මේ ගරු සභාවේ වැඩ කටයුතු පිළිබඳව අපක්ෂපාත අන්දමින් රාජකාරිය කරන්නට පෙරොන්දු වී තිබෙනව. ගරු කථානායකතුමාත් එවැනි පොරොන්දුවක් පිටයි මේ ගරු සභාවේ ඔය උත්තම ස්ථානය දරන්නේ. දැනට අපක්ෂපාතව තමුන්නාන්සේ අතින් වැඩ කටයුතු කෙරෙන බව අප පිළිගන්නවා. සමහර විට තමුන්නාන්සේ දෙන තීන්දු වැරදෙන්නටත් ඒ වගේම හරියන්නටත් පුළුවනි. ඒ පිළිබඳව තමුන්නාන්සේට හෝ තමුන්නාන්සේගේ නියෝජිතයාට අද දක්වාම දොස් කියා නැහැ. එහෙත් ගරු නියෝජ්‍ය කථානායකතුමා පසුගිය දා වැරදි අන්දමට පමණක් නොව සම්පූර්ණයෙන්ම ආණ්ඩුවට පක්ෂපාතව තීන්දුවක් දුන් බව ඉතාමත්ම කනගාටුවෙන් මේ අවස්ථාවේදී සඳහන් කරන්නට සිදු වී තිබෙනවා. අන්න ඒ පිළිබඳවයි, අපේ චෝදනාව ඉදිරිපත් වන්නේ. "මේ මේ තර්ක උඩ මේ ක්‍රමයට තීන්දුවක් දෙන්නට පුළුවනි. මේ ක්‍රමයට තීන්දුවක් දුන්නොත් වැරදියි" යන කාරණා ගැන සලකන්නට අපට වුවමනාවක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමා එදා අවංකව තම කාර්යය ඉෂ්ට කළාද යන්නයි අපට ප්‍රශ්නය වී තිබෙන්නේ.

පසුගිය සැප්තැම්බර් 24 වැනිදා ගරු කථානායකතුමා සිටියේ පිටරටයි. ඔව්, මේ කනගාටුදායක සිද්ධිය ඇති වූ දවසේ ගරු කථානායකතුමා සිටියේ පිටරටයි. එදා සැප්තැම්බර් 24 වැනිදා ඒ විවාදය පටන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගන්නට ඔන්න මෙන්න කියා තිබුණු මොහොතේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා කියා ඇති දේ මා දැන් **හැන්සාඩ්** වාර්තාවෙන් කියවනවා. පත් කරන ලද මන්ත්‍රීවරයකු මතු කරන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් නියෝජ්‍ය කථානායකතුමා තම අදහස් ප්‍රකාශ කර තිබෙනවා.

"MOTION OF NO CONFIDENCE IN GOVERNMENT : DEATH OF MR. L. V. PODIAPPUHAMY *alias* DODAMPE MUDALALI

වර්නන් ජොන්ක්ලස් මයා. (පත්කරන ලද මන්ත්‍රී)

(திரு. வீ. ஜொங்கிளாஸ்—நியமன அங்கத்தவர்)

(V. Jonklaas—Appointed Member)

Mr. Deputy Speaker, I rise to a point of Order that this matter is *sub judice*.

නියෝජ්‍ය කථානායකතුමා

(உப சபாநாயகர் அவர்கள்)

(Mr. Deputy Speaker)

The hon. Appointed Member saw me at 1.30 P.M. and said that he was raising this point of Order.

As a matter of fact this matter has given me considerable worry and I have been studying it myself, but I would like to have the assistance of the House. Although a point of Order cannot be debated, I would like your assistance and would ask one of the signatories to this Motion to assist me after the point of Order has been raised proposed by him." [OFFICIAL REPORT, 24th September 1966 ; Vol. 70, c. 726-7.]

පත් කරන ලද මන්ත්‍රීවරයා විසින් මතු කරන ලද කාරණය පිළිබඳව තමන්ට මුලින්ම දැන ගන්නට ලැබුණේ එදින දහවල් 1.30 ට බවත්, ඉන් පසුව තමන්ට ඒ ගැන කල්පනා කරන්නට සිදු වූ බවත්, මෙය බරපතළ කාරණයක් හැටියට තමන් සලකන බවත්, එහෙයින් ගරු මන්ත්‍රීවරුන්ගේ ආධාරයෙන් මෙය විසඳා ගැනීමට බලාපොරොත්තු වන බවත්, මෙවැනි ප්‍රශ්නයක් උඩ සාකච්ඡාවක් කර ගෙන යන්නට ඉඩ නැතත් මෙය විසඳා ගැනීමට ගරු මන්ත්‍රීවරුන්ගේ ආධාරය ඉල්ලා සිටින බවත් එදා එතුමා සඳහන් කළා. එතුමාගේ මේ ප්‍රකාශය අනුව ඒ වගේ ප්‍රශ්නයක් ඇති වන බව එතුමාට දැන ගන්නට ලැබුණේ එදින දවල් 1.30 ටයි. ඊට පෙර, දොඩම්පේ මුදලාලිගේ

මරණය සම්බන්ධයෙන් උසාවියෙන් ලැබුණු තීන්දුව අනුව විශේෂ සාකච්ඡාව කට විරුද්ධ පාර්ශ්වය විසින් යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබ තිබුණා. ඒ යෝජනාව සාකච්ඡා කිරීමට දින නියම කර ගෙනද තිබුණා. අප බලාපොරොත්තු වූ ඒ සාකච්ඡාව ඇති කිරීමට ගරු අගමැතිතුමාත් බලාපොරොත්තු වෙන බව මෙම ගරු සභාවේදී ම එතුමා ප්‍රකාශ කළා. නියමිත දිනයේ—සැප්තැම්බර් 24 වැනිදා—සාකච්ඡාව ආරම්භ වීමට තිබුනේ දවල් 2 ටයි. දවල් එකහමාරට පළමු වැනි වතාවට නියෝජ්‍ය කථානායකතුමාට, පත් කරන ලද මන්ත්‍රීවරයාගේ මාර්ගයෙන් තමුන්නාන්සේගේ කාමරයේදී, දැන ගන්නට ලැබී තිබෙනව, මේ නීති ප්‍රශ්නය මතු කරන බව. ඊට පස්සෙ නියෝජ්‍ය කථානායකතුමාගේ හිත හුගක් කම්පා වෙලා තියෙනව. ඒ කයි, එතුමා විසින් ප්‍රකාශ කරන්නට යෙදුනේ. දවල් දෙකට මේ ගරු සභාව රැස් වූ පසු පත්කරන ලද මන්ත්‍රීවරයා එතුමාගේ නීති ප්‍රශ්නය මතු කළා. මොකක්ද එතුමා කීවෙ? එතුමාගේ කථාව නැවත වරක් මා ඉංග්‍රීසියෙන් කියවන්න වුවමනා නැහැ. එදින **හැන්සාඩ්** වාර්තාවේ 722, 723 යන පිටුවල ඒ කථාව වාර්තා වී තිබෙනව. එතුමා කියා සිටියේ මෙපමණයි :

ආණ්ඩුව මේ යෝජනාවට පිළිතුරු දෙන අවස්ථාවේදී ආණ්ඩුවට අවශ්‍ය වෙයි, උසාවියේ සාක්ෂි දුන් සාක්ෂි කරුවන්ගේ කට උත්තර පිළිබඳව විස්තර කරන්නට. ඒ විස්තරය කරන අවස්ථාවේදී ඒ ප්‍රශ්න මතු කිරීමෙන් කුමන්ත්‍රණ නඩුවේ සාක්ෂි කරුවන්ගේ කට උත්තරත් ඉදිරිපත් කරන්නට සිදු වෙයි.

දෙවනුව දොඩම්පෙ මුදලාලිගෙ මරණය පිළිබඳව ස්වර්ණාධිපති විනිශ්චයකාරතුමා දුන් තීන්දුව උඩ තව දුරටත් විභාග පවත්වන්නට ඉඩ දේය යන හැඟීමයි, පත් කළ මන්ත්‍රීතුමා තුළ තිබුනෙ. ඒ නිසා ඒ ප්‍රශ්නය ගැන පාර්ලිමේන්තු සභාවේ කෙරෙන සාකච්ඡාවෙන් ඒ විභාගයට අකුල් හෙළීමක් ඇති වේය කියන අදහසයි ඒ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්ජ් ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

ගරු කථානායකතුමනි, මම තමුන්නාන්සේගෙන් දැන ගන්න කැමතියි, මේ විවාදය කීය වන තෙක් පවත්වනවාද කියා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සවස 4.30 වන තෙක්.

එෆ්ජ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
අපි දැන් රැස්වීම නවත්වන්නෙ කීය ටද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
12ට.

එෆ්ජ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
එසේ නම් මගේ කථාවෙ ඉතිරි කොටස නැවත 2ට රැස්වුනාම පවත්වන්න මම බලාපොරොත්තු වෙනව.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
රැස්වීම අ. භා. 2 වන තෙක් තාවකාලිකව අත්සිටුවනව.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 2 ට නැවත පවත්වන ලදි.

அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, மீண்டும் பி. ப. 2 மணிக்கு ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 2 P.M. and then resumed.

එෆ්ජ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
ගරු කථානායකතුමනි, රැස්වීම තාවකාලිකව අත්හිටුවන අවස්ථාවෙදි මා කියා සිටියෙ, මේ නීති ප්‍රශ්නය පිළිබඳව පළමු වන වතාවට ගරු නියෝජ්‍ය කථානායකතුමා දැන ගත්තෙ එදින දවල් 1.30ට නම්, ඊට පසුව එතුමාගෙ හිත මේ ප්‍රශ්නය උඩ කම්පා වී තිබුණ නම්, සවස 4.30ට, නියෝජ්‍ය කථානායකතුමාගෙන් අපට මෙවැනි තීන්දුවක් ලැබීම ගැන අපට පුදුම බවයි. මා විශේෂයෙන්ම එසේ කියන්නෙ ඇයි? එදා පාර්ලිමේන්තු රැස්වීම පටන් ගත්තෙ දවල් 2ටයි. රැස්වීම පටන් ගත් වෙලාව **හැන්සාඩ්** වාර්තාවෙ සඳහන් වී තිබෙනව. ඒ සාකච්ඡාවෙදි ගරු නියෝජ්‍ය කථානායකතුමා මන්ත්‍රීවරුන්ගේ සහාය ඉල්ලා සිටිය. දෙපැත්තෙන්ම මන්ත්‍රීවරුන් දෙදෙනා බැගින් එතුමාට ඒ අවස්ථාවෙදි ආධාර කළා. අපේ පැත්තෙන්--විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන්—මැද කොළඹ ගරු තුන් වෙනි මන්ත්‍රීතුමාත් (කෙනමන් මයා.) මමත්, නියෝජ්‍ය කථානායකතුමාට තර්ක වගයක් ඉදිරිපත් කරමින් ඒ නීති ප්‍රශ්නයේ හරි වැරදි කියා සිටිය. අනික් පැත්තෙන් බේරුවල ගරු මන්ත්‍රීතුමාත් (එම්. අබ්දුල් බකීර් මාකර් මයා.) වර්තන් ජොන්ක්ලස් පත්කරන ලද මන්ත්‍රීතුමාත් කරුණු ඉදිරිපත් කළා. ඉන් පසුව නියෝජ්‍ය කථානායකතුමා මෙසේ කිව්ව:

"I must thank the hon. Member who participated in this—I will not say Debate —discussion, to give me assistance to make my Order. I must inform hon. Members that I have studied this matter, made by my own notes, and even written down most of the authorities you have cited, but I have not made up my mind. That is why I wanted your assistance. All that I am concerned with, as the hon. Member for Dompe stated, is in arriving at a correct decision. I may make a mistake but I can assure you that whatever decision I shall arrive at will not be influenced by anybody and that that decision will be without fear or favour.

I suspend the Sitting till 4.30 P.M. to make my Order." [OFFICIAL REPORT, 24th September 1966; Vol. 70, c. 749-50].

ගරු කථානායකතුමනි, හැන්සාඩ් වාර්තාවේ වෙලාව සඳහන් වී නැතත් ගරු නියෝජ්‍ය කථානායතුමා විසින් මේ ප්‍රකාශය කරන්ට යෙදුණෙ සවස 3.20ටයි. මට එය හොඳට මතකයි. මා මේ ගරු සභාවේ ඒ අවස්ථාවෙ සිටි නිසයි මා කියන්නෙ. රැස්වීම දවල් 2ට පටන් ගෙන 3.20 දක්වා පවත්වාගෙන ගියා. එතෙක් ගරු නියෝජ්‍ය කථානායකතුමා ඔය ආසනයේ වාඩිවී අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තර්කවලට ඇහුම්කන් දුන් බව මා පළමුවෙන් මතක් කරන්ට කැමතියි. එහෙම නම් නියෝජ්‍ය කථානායකතුමාට මේ ප්‍රශ්නය ගැන කල්පනා කරන්ට අවකාශයක් ලැබුණෙ දවල් 1.30 සිට 2 දක්වාත්, සවස 3.20 සිට 4 දක්වාත් පමණයි. [බාධා කිරීමක්].

ගරු කථානායකතුමනි, එදා දවල් වරුවේ විශ්වාස භංග යෝජනාව ගැන සාකච්ඡා කරන්ට කවදද අපට ඉඩ දෙන්නෙ කියා මා විශේෂයෙන් මතු කළ ප්‍රශ්නයක් උඩ ගරු නියෝජ්‍ය කථානායකතුමා අපට කියා සිටිය, දවල් 4ට පක්ෂ නායකයින්ගේ රැස්වීමක් එතුමාගේ කාමරයේ පවත්වන බව. සවස 4ට ඊට සහභාගිවන්ට මැද කොළඹ ගරු තුන් වෙනි මන්ත්‍රීතුමාත් මමත් නියෝජ්‍ය කථානායකතුමාගෙ කන්තෝරුවට ගියා. ඒ වෙලාවෙදි එතුමාගෙ තීන්දුව ලියා හමාරයි; එය ටයිප් ගහනව. ටයිප් ගහපු කොලේ අන්තිම කොටස කරනව. අපි ඒකට ඇඟිලි ගැසුවෙ නැහැ. නමුත්, 4 වන විට නියෝජ්‍ය කථානායකතුමා තීන්දුව ලියල ලිපිකාර මහත්වරුන් සමග සාකච්ඡා ආදිය පවත්වා ඔක්කොම හමාරයි. අපි ඊට පසු කාමරයට ගියා.

මොකක්ද සිද්ධ වුණේ? මේ තීන්දුව නිසා ඒ සාකච්ඡාව කල් දමුවෙ නැහැ. නියෝජ්‍ය කථානායකතුමා කියා සිටිය, "මට කනගාටුයි, තමුන්නාන්සේලා කැඳවූ රැස්වීම අපට කල් දමන්ට සිදුවී තිබෙනව. තමුන්නාන්සේලා සමග සවස 4ට සාකච්ඡා කිරීමට රාජ්‍ය ඇමතිතුමාට පහසු නැතිලු" කියා. උන්නැහේ අපට ආරාධනා කළා තේ බොන්ට. අපි කිව්ව, "අපි ආවෙ තේ බොන්න නොවෙයි; පාර්ලිමේන්තු වැඩ කටයුත්තකටයි. රාජ්‍ය ඇමතිතුමාගේ පහසුව අනුව නම් තමුන්නාන්සෙ කටයුතු කරන්නෙ අපි යනව යන්ට. අපට තමුන්නාන්සෙගෙන් වැඩක් නැහැ." කියා. අපි එහෙම කියල යන්න ගියා.

මේකයි, අපි කියන්නෙ: දවල් 1.30 ට දැනගත් කාරණාව ගැන වැඩ කරන්ට නියෝජ්‍ය කථානායකතුමාට කාලය තිබුණෙ දවල් 2.00 දක්වා පමණයි. ඊළඟට අපෙන් ආධාර ඉල්ලුව. ඒ කාරණය ගැන අපි සාකච්ඡා කළා. නියෝජ්‍ය කථානායකතුමාට නීතිය පිළිබඳව පර්යේෂණ කරන්ට අවසථාවක් ලැබුණෙ නැහැ, මේ සභාවෙ [illegible] 4.00 වන විට වැඩෙත් ඉවරයි. තීන්දුවක් ලියන්න කල් ගත්තේ 3.20ටයි. ඒ අතර තුරෙදි මොකක්ද කළේ?

මෙන්න කථානායකතුමනි, නියෝජ්‍ය කථානායකතුමාගෙ තීන්දුවෙ සඳහන් කළ පොත් ටික. මේව සියල්ලක්ම ගෙනාවෙ තමුන්නාන්සෙලාට පෙන්වන්න. මම මේව කියවන්න යන්නෙ නැහැ. මේව අපේ පාර්ලිමේන්තුවෙ ලයිබ්‍රරියෙන් ගොයා ගන්න මට පැය $2\frac{1}{2}$ ක් ගිය බව පළමුවෙන් කියන්න කැමතියි. එක පොතක් "West Bengal Legislative Assembly Reports" නමැති පොතයි. ඒක ගන්න බැරි වුණා, තාමත්. ඒක තිබෙන්නෙ අටුවක. ඉණි මඟක නැඟලයි. යන්න තිබෙන්නෙ. ඉණි මඟක නැඟල ගොයන්න ඕනෑ. අද දක්වා ඒ පොත අතට ගන්න බැරි වුණා. නියෝජ්‍ය කථානායකතුමා ඔය කෙටි කාල සීමාව තුළ කොහෙන් ද මේව ගොයාගත්තෙ? අපි දන්නව, හැරී ජයවර්ධන වගෙ මහත්වරු ඉන්නව නම් පුළුවන්කමක් තිබෙනව මේව ගොයා ගන්න; බොහොම පහසුයි තීන්දු ලියන්න; බොහොම පහසුයි නීති ප්‍රශ්න ගොයා බලා ගෙදර ඉඳල ඕව හදාගන්න.

කථානායකතුමනි, අපි පාර්ලිමේන්තුවෙ වැඩ කරන අය. නීතිඥවරු හැටියට නොවෙයි, අපි වැඩ කරන්නෙ. අපි පිළිගන්නව, නියෝජ්‍ය කථානායකතුමා නීතිඥවරයෙක් බව. කොච්චර දක්ෂතාවක් තිබුණත් මම පිළිගන්නව, මෙහෙම තීන්දුවක් කෙටි කාල සීමාවක් තුළ ලියන්ට පුළුවන්කමක් නැති බව. පුළුවන්කමක් තිබෙනව නම් ඇත්ත වශයෙන්ම වහාම එතුමා අග්‍ර විනිශ්චයකාර ධුරයට පත් කළ යුතුයි.

අපි මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නෙ හේතුවක් ඇතිවයි. නියෝජ්‍ය කථානායකතුමාගෙ තීන්දුවෙ එක් කාරණාවක් සඳහන් වී තිබෙනව. පළමුවෙන්ම ඒක මතක් කරන්න කැමතියි. එතුමා තමන්ගෙ තීන්දුවෙ කියා තිබෙනව, මැද කොළඹ 3 වැනි ගරු මන්ත්‍රීතුමාත් මාත් ඉදිරිපත් කළ තර්කයක් පිළිබඳව; 96 වැනි සථාවර නියෝගය පිළිබඳව. උසාවියකට යටත් වූ ප්‍රශ්නයක් පිළිබඳව සාකච්ඡා කිරීම නහනම් බව අපි කවුරුත් පිළිගන්නව. උසාවිය තීන්දුවකට යටත්වුණු ප්‍රශ්නයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

පිළිබඳව සාකච්ඡා කිරීම තහනම්. එනමුත් සාකච්ඡාට පමණයි තහනම්; යෝජනාව තහනම් නැහැ. ඕනෑම මන්ත්‍රීවරයෙක් තහනම් කළ ප්‍රශ්නය උඩ අනවශ්‍ය කාරණාවක් පිළිබඳව නැඟී සිට කථාවක් පවත්වන්ට උත්සාහයක් දරනව නම්, තමුන්නාන්සෙට හෝ වේවා නියෝජ්‍ය කථානායකතුමාට හෝ වේවා ඔය පදවිය උසුලන තැනැත්තාට බලයක් තිබෙනව, සථාවර නියෝග 96 යටතේ, "ඔය ගැන තමුන්නාන්සෙට කථා කරන්ට බලයක් නැත" කියන්ට. නමුත් අපි කිව්වෙ, යෝජනාවක් පිළිගත්තයින් පස්සෙ ඒ යෝජනාව අස් කරන්ට බලයක් නැති බවයි. ඒ තර්කය පිළිබඳව ගරු නියෝජ්‍ය කථානායකතුමා කියා සිටින්නෙ මේකයි:

"It was maintained both by the hon. Third Member for Colombo Central (Mr. Keuneman) and the hon. Member for Dompe (Mr. F. R. Dias Bandaranaike) that Standing Order 96 (vi) relates only to Rules for Members speaking in the House and that it cannot be relied on as authority for deciding other points of Order regarding Motions, Questions, etc." [OFFICIAL REPORT, 24th September 1966; Vol. 70, c. 750.]

ඒකයි අපේ තර්කය. ඒකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමා කියා තිබෙන්නෙ.

"Similar provisions to ours exist in the Indian Lok Sabha and other State Legislative Assemblies in India, the Union of South Africa, New Zealand and several African States under which all matters *sub judice* when attempted to be raised in any form are decided by the Speaker." [OFFICIAL REPORT, 24th September, 1966; Vol. 70, c. 750].

කථානායකතුමනි, නියෝජ්‍ය කථානායකතුමා පිළිතුරක් වශයෙන් මේ තර්කය කියා තිබෙනව. එතුමා සොයා බැලූ පර්යේෂණවලින් එතුමාට දැනගන්ට ලැබුණලු ඉන්දියාවෙ ලෝක් සභාවෙ, තවත් මන්ත්‍රණ සභාවල, ඒ වගේම දකුණු අප්‍රිකාවෙ—හරි තැනකට නේද ගියේ? පින් සිද්ධ වෙන්න, ඒවයෙ කෙරෙන හරිය අපේ ලංකාවෙ තවම කෙරිල නැහැ—නිව්සීලන්ත රටේ, තවත් අප්‍රිකා රටවල් කීපයක පවතින නීති රීති යටතෙ උසාවියට යටත්වුණු ඕනෑම ප්‍රශ්නයක් ඕනෑම පිළිවෙලකට තීන්දු කරන්ට කථානායකතුමාට බලය තිබෙන බව. ඒකයි පිළිතුර.

ගරු කථානායකතුමනි, මෙන්න අපේ පාර්ලිමේන්තු පුස්තකාලයේ මේ පිළිබඳව තිබෙන පොත් සියල්ලම. මෙන්න දකුණු අප්‍රිකාවෙ පොත. මෙන්න ඔස්ට්‍රේලියාවෙ පොත. මෙන්න ඉන්දියාවෙ පොත. මේ සථාවර නියෝග පොත්. මෙන්න නිව්සීලන්තයෙ පොත. මෙන්න තවත් එකක්. එනම්, කැනඩාවෙ පොත. අනික් අප්‍රිකානු රටවල් ගැනත් නියෝජ්‍ය කථානායකතුමා කියා තිබෙනව. කොහොමද ඒවා ගැන කියන්නේ? අපේ පාර්ලිමේන්තු පුස්තකාලයෙ නම් අද දක්වාම ඒ එකක්වත් අපට සොයා ගන්න නැහැ. එහෙම නම් මෙව කොහෙන්ද සොයා ගත්තෙ? අනිකුත් අප්‍රිකානු රටවල සථාවර නියෝග පොත් කොහෙන්ද සොයා ගත්තෙ? මම හොඳට දන්නව කථානායකතුමාගෙ කාමරයෙත් පොත් කීපයක් තිබෙන බව. පොත් විශාල ගණනක් නැහැ. තමුන්නාන්සෙ හොඳින්ම දන්නව තමුන්නාන්සේටත් යම් පොතක් සොයා ගැනීමට වුවමනා වුණොත් තමුන්නාන්සෙටත් අපටත් ඒ පොත් සොයා ගැනීමට මෙහි තිබෙන එකම තැන පාර්ලිමේන්තු පුස්තකාලය බව. එහෙම නැත්නම් කොහෙන්ද සොයන්නෙ? තමුන්නාන්සෙටත් අපටත් තිබෙන්නෙ එකම පොත්. [බාධාකිරීමක්] පරණ කඩයටවත් යන්න වෙලාවක් තිබුණෙ නැහැ. එකහමාරත් හතරත් අතර වෙලාවක් තිබුණෙ නැහැ. මගේ තර්කය ඒකයි.

මේ ආකාරයට කථානායකතුමනි, නැති දේවල් සොයන්න ගියේ කොහේද කියා මම අහන්න කැමතියි. දකුණු අප්‍රිකාවෙ පොතයි මට සොයා ගන්න ලැබුණෙ. ඒත් ඇත්ත වශයෙන්ම එය සොයාගන්නත් එතරම් ලෙහෙසි වුණේ නැහැ. මම බැලුව ඝානාවෙ, නයිජීරියාවෙ සථාවර නියෝග පොත් තිබෙනවද කියා. නැහැ. අපේ පාර්ලිමේන්තු පුස්තකාලයෙන් නම් ඒ එකම එක පොතක්වත් සොයාගන්න අද දක්වාම ලැබුණෙ නැහැ. එහෙමනම්, එකහමාරෙ සිට හතර දක්වා සුළු කාලය ඇතුළත නියෝජ්‍ය කථානායකතුමාට ඒව කොහෙන්ද ලැබුණෙ? කොහොමද, මේ පර්යේෂණ ටික කරගත්තෙ? රාජනීතිඥ වරයෙක් ළඟට ගියා නම් කියයි මේ කාරණය ගැන හරියාකාර තීන්දුවක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දෙන්න මට කල් ඕනෑය කියා; ගිනිත් ඕනෑය කියා. එය හබරාදූව ගරු මන්ත්‍රීතුමාගෙ පනත් කෙටුම්පතට අඩංගු කරුණක්ය කියා මම කල්පනා කරනව.

අපි කියන්නෙ මේකයි. මොනවටද මේ විකාර කෙළේ? මෙතැනට පැමිණ "මම තීරණය කරගෙන තිබෙනව මේ තර්කය භාර නොගන්න; දෙඩම්පෙ මුදලාලිගෙ මරණය ගැන තමුන්නාන්සේලාට වචනයක්වත් කථා කරන්න ඉඩ දෙන්නෙ නැහැ" කියා කිව්ව නම් ප්‍රශ්නයක් නැහැ. මොනවටද බොරු කරන්නෙ? මෙතැනට පැමිණ කියනව, මම අපක්ෂපාත තීන්දුවක් දෙන්න යනව කියා. ඒ නිසයි අපි එතුමා කෙරෙහි විශ්වාසයක් තබන්න බැරි බවට යෝජනාවක් ගෙනාවෙ. පාර්ලිමේන්තු පුස්තකාලයෙ නැති පොත්වලින් කොහොමද කරුණු ගෙනාවෙ? මෙන්න මේක බලන්න:

"Similar provisions to ours exist in the Indian Lok Sabha and other State Legislative Assemblies in India, the Union of South Africa, New Zealand and several African States under which all matters *sub judice* when attempted to be raised in any form are decided by the Speaker." [OFFICIAL REPORT, 24th September 1966; Vol. 70, c. 750.]

ඒ කියන්නෙ පාර්ලිමේන්තුවේ පවතින රීතිවලට හෝ සථාවර නියෝගවලට යටත්වන කරුණු ගැන පමණක් නොවේය; උසාවියට යටත්වන ප්‍රශ්නයක් මොනම පිළිවෙලකට මතු වුණත් සථාවර නියෝග යටතේ තීන්දුවක් දෙන්න කථානායකතුමාට බලය තිබෙනවාය කියායි.

මම මෙයින් එකක් ගන්නම්. එනම්, දකුණු අප්‍රිකාවෙ පොත. දකුණු අප්‍රිකාවෙ පොත පමණයි මම කියවන්න බලාපොරොත්තු වන්නෙ. මම හිතන්නෙ නැහැ ඒවා ඒ තරම් හොඳ සථාවර නියෝගය කියා. එහෙත් ප්‍රශ්නය එය නොවෙයි. ඒක වෙනම ප්‍රශ්නයක්. එවැනි රටක ගරු අගමැතිවරුන් පවා පාර්ලිමේන්තු සභා ගර්භය තුළදීම මරා දමන්න පුළුවනි. දකුණු අප්‍රිකාවෙ එවැනි සථාවර නියෝග තිබෙනවා නම් අන්න ඒවා තමයි අපට ප්‍රයෝජනයට ගන්න කියන්නෙ. ගරු නියෝජ්‍ය කථානායකතුමා එදා කියා සිටියේ ඕනෑම පිළිවෙලකට මතු කරන ප්‍රශ්නයක් උසාවියට යටත්ව තිබෙනවා නම් තහනම්ය කියා තීරණය කරන්න ගරු කථානායකට තීන්දුවක් හැටියටයි මා මේ අවස්ථාවේ තුමාට බලය තිබෙන බවයි. හොඳයි, ඒ කාරණය ගැන දකුණු අප්‍රිකාවේ සඳහන් වී තිබෙන්නේ කෙසේදැයි අපි දැන් ටිකක් සොයා බලමු. දකුණු අප්‍රිකාවේ සභයෝග යෙන් තමයි දැන් අපට වැඩ කටයුතු කර ගෙන යන්න සිදු වී තිබෙන්නෙ. ඒක ඇත්තයි. "එච්" අක්ෂරය යටතේ තිබෙන ඡේදයෙහි සථාවර නියෝග දක්වා තිබෙනව. මා ළඟ ඒ පොත තිබෙනව. ඒ පොතේ 24 වැනි පිටුවෙනුයි මා කියවන්න බලාපොරොත්තු වන්නෙ. එහි තිබෙන්නෙත් සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය ගැන පමණයි. අපේ මහජන නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට සමාන මන්ත්‍රී මණ්ඩලයේ සථාවර නියෝග දක්වෙන පොතක් අපේ පුස්තකාලයේ නම් සොයා ගන්න නැහැ. දකුණු අප්‍රිකාවේ සථාවර නියෝග සඳහන් වන එකම එක පොත මා ළඟ තිබෙනව. ඒ පොතේ තිබෙන්නේ මෙහෙමයි:

"Standing Orders—Senate of South Africa."

"A Senator shall not allude to Debates in the House of Assembly, nor refer to matters on which a judicial decision is pending."

අපිත් එය පිළිගන්නව. මෙයින් කියැවෙන්නෙ උසාවියකට යටත් වූ ප්‍රශ්නයක් සම්බන්ධයෙන්—උසාවියෙන් තීන්දුවක් දෙන්න තිබෙන ප්‍රශ්නයක් සම්බන්ධයෙන්—මැතිසබයේදී කථාවක් පවත්වන්න මන්ත්‍රීවරයෙකුට ඉඩ දෙන්න දකුණු අප්‍රිකාවේ කථානායකතුමෙකුටවත් බලයක් නැති බවයි. මෙහි කියා තිබෙන දෙය අප ඉදිරිපත් කළ තර්කයට පටහැණිව කියා තිබෙන දෙයක් නොවෙයි. ඒ වගේම අපේ සථාවර නියෝගත් අප ඉදිරිපත් කරන තර්කයට අනුවයි තිබෙන්නෙ. ගරු නියෝජ්‍ය කථානායකතුමා මෙයින් කර තිබෙන්නෙ බොරුවක් නොවෙයිද? බොරුවක්—සම්පූර්ණ බොරුවක්—පක්ෂපාතව තීන්දුව දීමක් ගරු නියෝජ්‍ය කථානායකතුමා කළ බවයි අප කියන්නෙ. ඒ බව මා නිර්භයව ප්‍රකාශ කරනව.

දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාගේ කථාවට ගරු කළත් මම දෙපැත්තක් අරන් කථා කරන මන්ත්‍රීවරයෙක් නොවෙයි. යමක් අඩු කර කථා කරන්න මම කැමති නැහැ. දෙන ලද තීරණය සම්පූර්ණයෙන්ම පක්ෂපාත ලෙස දෙන ලද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්ජ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

කියන්නෙ. මෙය වැරදි තීරණයකැයි මා කියන්නෙ නැහැ. මෙය වැරදි තීන්දුවක් පමණක් නොවෙයි. වැරදි තීරණයක් පමණක් නම් මා මේ ගැන කථා කරන්නෙ නැහැ. කා අතින් වුවත් වැරදි සිඳ වෙනව. ඒ ගැන කිසිම මත භේදයක් නැහැ. කා අතින් වුවත් වැරදි සිදු වුණොත් ඒ ගැන දොස් පැවරීම වැරදියි. ඕනෑම කෙනකු—නඩුකාරයකු වුවත්—අතින් වැරදි කෙරෙන්න ඉඩ තිබෙනව. කාගෙන් ලැබෙන තීන්දුවක් වුවත් එය වැරදි තීන්දුවක් වෙන්න පුළුවනි. එහෙත් හොර තීන්දුවක්, වැරදි සිතින් දෙන තීන්දුවක්, බොරු තීන්දුවක් දීම සුදුසු නැහැ. හොර තීන්දුවක්, බොරු තීන්දුවක්, දෙන විට මේ ගරු සභාවල වැඩ කටයුතු විකාරයක් බවට පත් වෙනව. ඒ නිසා එවැනි තීන්දු අපට කිසි සේත් පිළිගන්න බැරි බව මුළු විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් මා මේ අවසථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි.

පාර්ලිමේන්තුවේදී අප කථා කරන දේවල් ඇත්ත වශයෙන්ම උසාවියට යටත් වූ ප්‍රශ්නයක් මතු කරමින් කරන ඒවා නම් ඒවා ගැන කථා කරන්න ඉඩ දෙන්නෙ නැතැයි කියන්න පුළුවනි. එහෙත් අප ඉදිරිපත් කළේ එවැන්නක් නොවෙයි. අප කියන්නෙ මෙයයි: කොහෙද තියෙන්නෙ අප ගෙනා යෝජනාව තහනම් කළ හැකිය කියා? අප ඉදිරිපත් කළ කාරණය උසාවියේ තීන්දුවක් බලාපොරොත්තු වන විෂයයක් ගැන නම් ඒ බව සඳහන් කර තමුන්නාන්සේ අණ කරතොත් ඒ ගැන කථා නොකළ යුතුය කියා, කවුරුත් එය පිළි ගන්නව. ස්ථාවර නියෝගයක් තිබුණත් නැතත් එය පිළිගන්නවා ඇති. මේ යෝජනාව ගැන කථා කරන්න මම ඉඩ දෙන්නෙ නැහැ කියා තමුන්නාන්සේ කියනවා නම්, එය තමුන්නාන්සේ දෙන තීන්දුවක් නම් අපි එය පිළිගන්නව. එහෙත් දකුණු අප්‍රිකාවේ ස්ථාවර නියෝග අඩංගු පොතක් ගැන කියා සිටියට අපට එය පිළිගන්න බැහැ. මේ පොත් සියල්ලක්ම කියවන්න මට වෙලාව තිබුණාය කියන හැඟීමක් දුන්නත් එය අපට පිළිගන්න බැහැ. පැයකින් හමාර කින් කරන්න බැරි වැඩක්, එය. මොන වටද අපට කියන්නෙ ඔය ස්ථාවර නියෝග වල මෙහෙම තියෙනවය කියා? ඔය තරම් සුළු වෙලාවකින් ඔය කියන ස්ථාවර නියෝග ආදිය අඩංගු පොත්පත් ටික සොයා ගන්නවත් බැහැ. මා මේ අවසථාවේ අභියෝගයක් කරන්න කැමතියි, මේ පොත් ඔය තරම් ඉක්මනින් සොයා ගන්න බැරි බවට. එහෙත් අපේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව තමුන්නාන්සේට මේ සාකච්ඡාවට අද සහභාගි වෙන්නට බැහැ. එහෙමයි සියලු දෙනාම කල්පනා කරන්නෙ. ඔය තරම් ඉක්මනින් ඔය පොත්පත් සොයා ගන්න පුළුවන් වුණා නම් ඇත්ත වශයෙන්ම මා ආඩම්බර වෙනව. උන් නැහෙට මේ පොත් ටික කොහෙන් ලැබුණා දැයි මා දන්නව. ඒවා ලබා ගන්න පුළුවන් තරම් මාර්ග තිබෙනව.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
කොහෙන්ද?

එෆ්ජ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
රාජනීතිඥවරුන්ගෙ පෞද්ගලික පොත් ගුල්වල—පුස්තකාලවල—පොත්පත් තිබෙනව. ඒ පුස්තකාල දෙස බලන විට ඕනෑ තරම් තිබෙනවය කියා පෙනී යනවා ඇති. කල් තබා මුදල් ගෙවා ලබා ගන්න පුළුවනි.

රජයට පක්ෂව මේ කරුණු මෙතරම් හදිසියෙන් ඉදිරිපත් කළහම කවුද එය විශ්වාස කරන්නෙ? මේ තරම් කෙටි කාල සීමාවක් තුළදී ඒව හොයා ගත්තෙ කොහොමද? එදා ගරු නියෝජ්‍ය කථානායකතුමා අපේ ආධාරය එතුමාට ඕනෑ යයි කිව්ව. ඒ නිසා අපි හතර දෙනෙක්—ආණ්ඩු පක්ෂයෙන්, පත් කළ ගරු මන්ත්‍රීවර්නන් ජොන්ක්ලස් මහත්මයත් බේරු වල ගරු මන්ත්‍රීතුමත් (එම්. අබ්දුල් බකීර් මාකර් මයා.) විරුද්ධ පක්ෂයෙන් මැද කොළඹ තුන් වැනි ගරු මන්ත්‍රීතුමත් (පී. ජී. බී. කෙනමන් මයා.) මමත්—නියෝජ්‍ය කථානායකතුමාට ආධාර කළා. හැබැයි අපි එදා, ලංකාවෙ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට අදාළ ස්ථාවර නියෝග අනුව කථා කළා මිස—ඉංග්‍රීසියෙන් තමයි කථා කළේ. ඒ බව පිළිගන්නව—පරණ හැන්සාඩ් වාර්තා හෝ පිටරටවල පළ වුණු පොත්පත් හෝ නියෝජ්‍ය කථානායකතුමාට එකතු කර දුන්නෙ නෑ. පිටරටවල ස්ථාවර

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

නියෝග පොත් අපි කියෙව්වෙ නෑ. තිබුණු සුළු කාල සීමාව තුළ අපට ඒ ව හොයා ගන්න ක්‍රමයකුත් නෑ. සවස 2 ට ප්‍රශ්නය මතු වුණු අවස්ථාවෙදි තමාට ආධාර කරන ලෙස නියෝජ්‍ය කථානායකතුමා අපෙන් ඉල්ලීමක් කළා. ඒ අනුව අපි එතුමාට ආධාර කළා. අපි ඉදිරිපත් කළ කරුණු ලියා ගත් බවත් එතුමා කිව්ව. නමුත් තීන්දුව දුන්නෙ වෙනත් කරුණු උඩ. ඒ තීන්දුව දෙන්න එතුමා හොයාගෙන තිබුණු පොත් කොහෙන් ගත් ඒවාදැයි අපි දන්නෙ නෑ.

රීති ප්‍රශ්නයක් මතුවන බව තමාට දැන ගන්න ලැබුණෙ එදා සවස එකහමාරට බව නියෝජ්‍ය කථානායකතුමා කිව්ව. නමුත් එසේ එකහමාරක් ගැන කථා නොකර, ඇත්ත වශයෙන්ම මේ ගැන කල්තියා කල්පනා කර බලා නොයෙක් නොයෙක් කරුණු සොයා බැලූ බව ප්‍රකාශ කළා නම් වඩා හොඳයි. නියෝජ්‍ය කථානායකතුමාට මේ කරුණ දැනගන්න ලැබුණෙ එදා සවස එකහමාරට බව එතුමා කියන නමුත්, අපට නම් එය ඊට කලින් දවසෙ "ලේක් හවුස්" පත්තරවලින් දැන ගන්න ලැබුණ. නමුත්, ගරු අගමැතිතුමා මේ විවාදයට දවස් දෙකක් දෙන බවට අපට වචනයක් දී තිබුණු නිසා අපි ලේක්හවුස් පත්තර වලින් කී දේ තුට්ටු දෙකකටවත් ගණන් ගත්තෙ නෑ. අපි අගමැතිතුමා කෙරෙහි එදා සෑහෙන විශ්වාසයක් තබා තිබුණ. ගරු අගමැතිතුමා, ඉස්සරහ දොරෙන් හෝ පස්ස දොරෙන් හෝ, පත් කළ ගරු මන්ත්‍රීවරයකුගෙ මාර්ගයෙන් හෝ, අපට දුන් පොරොන්දුව කඩ නොකරයි කියා අපි තරයේ විශ්වාස කළා.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(අකුරැස්ස)
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறள்ஸ)
(Dr. S. A. Wickremasinghe—Akuressa)
දැන් අපි ඉගෙන ගෙන තියෙනව.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
ඔව්, පාර වැදුණට පස්සෙ අපි ඉගෙන ගත්ත. [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මෙපමණ වෙලාවක් බොහොම හොඳට මේ ප්‍රශ්නය ගැන කථා කරගෙන ගියා. ගරු මන්ත්‍රීවරු හරස් ප්‍රශ්න දැමීමෙන් එය කාරණයෙන් පිට ගෙනයන්න එපා.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
මගෙන් වරදක් වුණානම් මා බොහොම කණගාටු වෙනව.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නෑ, නෑ, අවහිර නොකර කථා කරන්න ඉඩ දෙන්නයි මම කිව්වෙ.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர் டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
කථානායකතුමනි, මට මෙතෙක් කාගෙන්වත් අවහිරයක් ඇති වුණේ නෑ. කිය යුතු දේ මම කොහොමත් කියනව. මම කෙලින් කථා කරනව. තද වචන පැවිච්චි කරන්න අවස්ථාවක් ඇති වුණොත් මම ඊටත් සූදානම්. මම හිත් රිදීම් නැති වන විධියට කොළේ වහල කථා කරන්නෙ නෑ.

ගරු කථානායකතුමනි, එදා ගරු නියෝජ්‍ය කථානායකතුමා එතුමාගෙ මේ තීන්දුව දීමට පුරා ශත වර්ෂ දෙකහමාරක කරුණු හොයා බැලුව. ලෝඩ් ජෝන් රසල් වැනි මහා නීතිඥයින්ගෙ තීන්දු, ඉන්දියාවෙ, අප්‍රිකාවෙ පාර්ලිමේන්තුවල තීරණ ආදී දේවල් අස්සක් මුල්ලක් නැර එතුමා හොයා බැලුව ඉතාමත් සුළු වෙලාවක් ඇතුළත. මේ සභාවෙ ලිපිකරු මහත්වරු දෙදෙනත් දක්ෂ නීතිඥයින් දෙදෙනෙක්. නමුත්, එදා නියෝජ්‍ය කථානායකතුමා ඉදිරිපත් කළ කරුණු උන්නැහෙලවත් දන්නෙ නැතිව ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.
(අත්තනගල්ල)
(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டார நாயக்க—அத்தனகல்ல)
(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)

එක්කෙනෙක් හිටියෙ නෑ.

එෆ්. ආර් ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

එක්කෙනෙක් හිටියෙ නැතිලු. අනිත් එක්කෙනත් දන්නෙ නැතිව ඇති. මම මෙය ලිපිකරු මහත්වරුන්ට අගෞරව යක් කරන්න කියනව නොවෙයි. උන්නැ හෙලවත් ඒ කරුණු දන්නෙ නැතිව ඇති. වර්නන් ජෝන්ක්ලස් රාජ නීතිඥතුමා ගෙ කථාවෙදි ඒ කරුණු එකක්වත් ඉදිරිපත් කළේ නෑ. නියෝජ්‍ය කථානායක තුමා ඉතාමත් හදිසියෙන් ඒ ඔක්කොම ලියාගෙන ලෑස්ති කරගෙන හිටිය තීන්දු වට බහින්න. ඒ තීන්දුව ගැන එතුමාට අවංක හිතින් කියන්න තිබුණේ "මෙ වැනි දීනි ප්‍රශ්නයක් මතුවන්නට පුළු වන් බව මා ඊයේ පත්තරයේ දැක්කා. ඒ නිසා රාත්‍රි නිදා ගත්තෙවත් නැතිව මන්ත්‍රී මණ්ඩලයට පැමිණ ඉනිමං නැඟල අටුවලට ගොස් පොත්පත් සොයා ගෙන තීන්දුවක් ලිව්වා" කියලයි.

එහෙත්, ගරු නියෝජ්‍ය කථානායකතුමා කළේ එහෙම නොවෙයි. මෙතැන්ට ඇවිත් එකින් එකට තීන්දු කියෙව්ව. එතුමගෙ ඒ තීන්දු කියවන්නට මා අදහස් කරන්නෙ නැහැ. ඒ සියල්ලක්ම තිබෙන්නෙ ඉංග්‍රීසියෙන්. ඒවා පහසුවෙන් කිය වන්නට ගරු කථානායකතුමාට පුළුවන් කම තිබෙනව. ඔය ආදී වශයෙන් හැම එකක් දෙසම බලන විට පෙනී යන තත්ත්වය මොකක්ද? හැම එකකම කියනවා අහවල් දින අහවල් රටේ—1940 වෙන්නත් පුළුවන්, 1950 වෙන්නත් පුළුවන්—අහවල් අහවල් මන්ත්‍රණ සභාවලදී මෙ වැනි ප්‍රශ්න මතු වූ අවස්ථාවලදී ගත් තීන්දු මේ මේවාය කියල. ඇතැම් රටවල මෙවැනි ප්‍රශ්න මතු වූ අවස්ථාවලදී රජය වෙනුවෙන් ගරු ඇමතිවරයෙක් හෝ නිල ධාරියෙක් නැගී සිට කියනව "මෙය උසා වියකට සම්බන්ධ ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කිරීමෙන් උසාවියේ තීරණ යට බාධා පැමිණෙන්න පුළුවන්. ඒ නිසා මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කිරීමට ඉඩ දෙන්න එපා" කියල. සමහර රටවල මන් ත්‍රණ සභාවලට ඇතුළු වීමට නිලධාරීන් ටත් ඉඩ තිබෙනව. සමහර රටවල ඇටර්නි ජනරාල්වරයාට මන්ත්‍රණ සභාව තුළ විශේෂ තැනක් තිබෙනව. අපේ රටට පින් සිදු වේවා, අමීර් මහත්මයෙක් අපට නැහැ. මස්සිනත් නැහැ; අමීරුත් නැහැ. එහෙත් ඇතැම් රටවල මන්ත්‍රණ සභාවේ කටයුතුවලට සහභාගි වීමට ඇටර්නි ජන රාල්වරයාට අවසර තිබෙනව. මා කලින් සඳහන් කළ පරිදි වගකිවයුතු ඇමතිවර යෙක් හෝ මන්ත්‍රණ සභාවේ නිලධාරීන් සිටින රටවල නම් එවැනි නිලධාරියෙක් හෝ නැගිට කියා සිටින්න ඕනෑ, උසාවිය කට සම්බන්ධ කරුණක් නම් ඒ ගැන සාකච්ඡා කරන්න ඉඩ දෙන්න එපාය කියල. සමහරවිට ඉදිරිපත් කරන්නට පුළු වන්කම තිබෙනව "අපි තවම නඩුවක් පවරා නැහැ. එහෙත්, හෙට අනිද්දා නඩු වක් පැවරීමට අපි අදහස් කරනව. ඒ නිසා මේ සාකච්ඡාවට ඉඩ දෙන්න එපා" කියල. එවැනි ප්‍රශ්නයක් මතු කළ වහාම කථානායකතුමාට කරන්නට තිබෙන එකම එක යුතුකම ඒ ගැන සාකච්ඡා කිරීමට ඉඩ නොදීමයි. නියෝජ්‍ය කථා නායකතුමාත් එය පෙන්වා දී තිබෙනව.

ගරු කථානායකතුමනි, එදා දවල් 2 ට ආණ්ඩුවේ වගකිවයුතු ඇමතිවරයෙක් නැගිට "දෙඩම්පෙ මුදලාලිගේ මරණය ගැන උසාවිය දුන් තීන්දුව අනුව නඩුවක් පවරන්නට හෝ තව දුරටත් විභාග කර බලන්නට හෝ ඒ පිළිබඳ කරුණු සෝදිසි කර බලන්නට හෝ අදහසක් තිබෙනවාය, ඒ වගකීම අපි බාර ගන්නවාය, ඒ ගැන කාට හෝ විරුද්ධව නඩුවක් පැමිණිලි කිරීමට අපේ අදහසක් තිබෙනවාය, ඒ නිසා මේ සාකච්ඡාව කල් දමන්න"ය කිව්වා නම්, අපට කියන්න දෙයක් නැහැ. එහෙම කළා නම් අපි සාදරයෙන් ඒ තීරණය පිළිගන්නව. ඇත්ත වශයෙන්ම අපි විශ්වාස කළේ දොඩම්පෙ මුදලාලි ජනේලයෙන් වැටුණාය කියලයි. එහෙත්, සවර්ණාධිපති විනිශ්චයකාරතුමාගේ තීන් දුවෙන් පසුව අපට සැකයක් ඇති වී තිබෙ නව ඇත්ත වශයෙන්ම ජනේලයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැටුණද, හතරවැනි තට්ටුවෙන් තල්ලුව දැම්මද කියන එක ගැන. එවැනි සැකයක් ඇති වූ පසු රජය පිරිසිදු චේතනාවෙන් වගකිවයුතු ඇමතිවරයකුගේ මාර්ගයෙන් කිව්ව නම් "අපි තව දුරටත් විභාගයක් ගෙන යනවාය, එයට මේ සාකච්ඡාවෙන් බාධාවක් ඇති වන්නට පුළුවන් නිසා කරුණා කර මේ සාකච්ඡාවට ඉඩ දෙන්න එපා" කියල, අපටත් කියන්න දෙයක් නැති වෙනව.

එවැනි ප්‍රකාශයක් කිරීමට මේ ගරු සභාවේ සිටින වගකිවයුතු මන්ත්‍රීවරයා පුත්තලමේ මන්ත්‍රී අධිකරණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්වරයාසි. මේ ගරු සභාවේ අධිකරණ කටයුතු බාරව සිටින්නේ එතුමාසි. නීතිය පිළිබඳ ප්‍රශ්න වල වගකීම බාර ගන්නට සිටින තැනැත්තා ඔහුසි. එහෙත් එතුමගේ වගකීම සම හරවිට රාජ්‍ය ඇමතිතුමා හෝ අගමැතිතුමා විසිනුත් බාර ගන්නව. එයටත් අපි විරුද්ධ නැහැ. එවැනි වගකිවයුතු කෙනෙක් එවැනි ඉල්ලීමක් කළා නම් අපට කියන්න දෙයක් නැහැ. එවැනි තත්ත්වයක් ඇති වුණා නම් අපි එය සම්පූර්ණයෙන්ම පිළිගන්ට සූදානමින් සිටිය. රජය ලවා මේ පිළිබඳව හරියාකාර විභාගයක් පවත්වාලන්නටයි, අපිත් සෑම උත්සාහයක්ම දරුවෙ. ඒකයි අපේ නියම අදහස.

එසේ නැතුව අපි මෙම සාකච්ඡාවෙන් අදහස් කළේ දොඩම්පෙ මුදලාලි මහතාට නව ජීවයක් ලබා දෙන්නට හෝ පොලීසියෙන් කෙරෙන අපරාධ සම්පූර්ණයෙන්ම තුරන් කර දැමීමට හෝ නොවෙයි. එවැනි වැඩ කටයුතු මෙම කුඩා ලංකාවෙන් හරියාකාර තුරන් කර දමන්ට රජය අවදි වී උත්සාහ දරනව නම් එයට රජයට විරුද්ධව අප කරන චෝදනාව කුමක්ද? තමුන්නාන්සෙල දොඩම්පෙ මුදලාලිගෙ මරණය වසා දමා පොලීසිය ආරක්ෂා කිරීමට උත්සාහ දැරූ එකයි අපි කිවෙ. ඒ ගැනයි විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කළේ. "මම මේ ගැන හරියාකාර විභාගයක් කරනවා"ය කියා අගමැතිතුමා කිව නම් මෙම ප්‍රශ්නය එතැනින් ඉවරයි. "අපට දැන් අවබෝධ වෙලා තියෙනව එය වැරදි බව. මේ මනුස්සය මරා දැම්ම කියා අපට දැන් සැකයක් පහළවී තිබෙනව; මේ ගැන අවංක අපක්ෂපාත විභාගයක් පවත්වන්න අපි බලාපොරොත්තු වෙනව" යනුවෙන් එතුම කීව නම් ප්‍රශ්නය එතැනින් ඉවරයි. මුළු විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන්ම මා ආඩම්බරයෙන් කියා සිටිනව එතුම එවැනි ප්‍රකාශයක් කළා නම් කිසිවකු ඊට විරුද්ධ වන්නෙ නැති බව. ආණ්ඩුවට විරුද්ධව කරන එවැනි සාකච්ඡාවකින් අපට ජයක් ලබා ගන්ට බැහැ. වැඩි ඡන්ද සංඛ්‍යාව ඒ පැත්තෙයි තියෙන්නෙ. එය අපි පිළිගෙන හමාරයි. නමුත් අපට නිදහස තියෙනව ඒ සම්බන්ධයෙන් කතා කොට එහි වැරැද්ද නිවැරැද්ද මහජනතාවට අවබෝධ කර දෙන්ට. ඒකයි පාර්ලිමේන්තු සභාවෙ තියෙන අගය. ගරු කථානායකතුමාගෙ කාලයත් මිඩංගු කරමින් අපේ තර්ක ඉදිරිපත් කරන්නෙ ඒකයි.

නියෝජ්‍ය කථානායකතුමා ඒ ගැන කියා තිබෙන්නෙ මොනවද? කවුරුවත් ඒ පිළිබඳව විභාගයක් කරනවය කියා කිසිම පොරොන්දුවක් වුණේ නැහැ. පත් කරන ලද මන්ත්‍රීතුමාගෙ කට හඬ එතුමගෙ කට හඬට වඩා හොඳය කියා ගරු අගමැතිතුමා කල්පනා කළා නම් අපි ඒකට විරුද්ධ වන්නෙ නැහැ. ජොන්ක්ලස් මන්ත්‍රීතුමාගෙ මවු බසින් තම අදහස් ප්‍රකාශ කරන්න එතුමා කල්පනා කරනව නම් අපි ඒකටත් විරුද්ධ වන්නෙ නැහැ. නමුත් අපි කියා සිටින්නෙ මෙයයි: රජය මෙහි වගකීම භාර ගන්න බවක් වර්තන් ජොන්ක්ලස් මන්ත්‍රීතුමාගෙ කතාවෙ කොතැනකවත් සඳහන් වුනේ නැහැ. දොඩම්පෙ මුදලාලි මහතාගෙ මරණය පිළිබඳව අපක්ෂපාතව වැඩි දුරටත් විභාගයක් පවත්වා තීන්දුවක් දීම පිළිබඳව වචනයක්වත් එහි සඳහන් වුනේ නැහැ. බේරුවල ගරු මන්ත්‍රීතුමා (අබ්දුල් බකීර් මාකර් මයා.) කළ කතා වෙහිත් එවැනි දෙයක් සඳහන් වෙලා නැහැ.

නීති විරෝධිකම පිළිබඳ ප්‍රශ්නය ඉදිරිපත් කරද්දී ජොන්ක්ලස් මන්ත්‍රීතුමා කියා තිබෙන්නෙ කොහොමද? එතුමා කියපු හරියත් බොහොම පරිස්සමින් ලියා ගෙන ඇවිල්ලයි කිවෙ. නිකම් කතාවක් නොවෙයි ඒක. ඒක කඩදාසියක ලියාගෙන ඇවිල්ලයි තිබුනෙ. කවුරු ලිව්වද කියන්ට දන්නෙ නැහැ ඒක. මා පිළිගන්නව ජොන්ක්ලස් මන්ත්‍රීතුමාම ඒක ලියන්ට ඇතිය කියා. එතුමට පුළුවන්කම තියෙනව බොහොම ලස්සනට ලියන්න. මම එතුම ගැන දන්න නිසයි එහෙම කියන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්. ආර්. ඔසස් බණ්ඩාරනායක මයා.]

එතුම මගේ බොහොම කිට්ටුවර යාළුවෙක්. නමුත් නියෝජ්‍ය කථානායකතුමාගෙ තීන්දුව ගැන මට සැකයක් තියෙනවා. ඒක කවුරු ලිව්වද කියන්ට මම දන්නෙ නැහැ. කවුරු නමුත් හුඟක් පොත් ලියන මනුස්සයෙක් වෙන්ට ඕනෑ ලියන්ට ඇත්තෙ. ඒකයි මගේ විශ්වාසය. 1965 සැප්තැම්බර් මස 24 වන දින **හැන්සාඩ්** වාර්තාවෙ 723 පිටුවෙ සඳහන් වන එතුමගෙ කතාවෙ මෙසේ තියෙනවා :

"Secondly, as a result of the inquest proceedings, certain criminal investigations must take place and this debate will prejudice those persons who may then be tried."—[OFFICIAL REPORT, 24th September 1966 ; Vol. 70, c. 729.]

ඒ අනුව මා දැන් අහා සිටිනවා ඒ අය කවුද කියන ප්‍රශ්නය. දොඩම්පෙ මුදලාලි මහතාගෙ මරණ තීන්දුව උඩ ක්‍රිමිනල් වශයෙන් උසාවියෙ වැඩ කටයුතු රාශියක් කර ගන්න තිබෙනවා. ඒ කර ගන්න කටයුතු උඩ කාටහරි විරුද්ධව චෝදනාවක් එල්ල කරන්ට සිදු වෙනවා ඇති. ඒ උදවියගෙ නඩුව අපක්ෂපාතව ඇසීමට මෙම සාකච්ඡාව උඩ අකුල් හෙළීමක් සිදු වෙනවා ඇත කියා එදා එතුමා කීවා.

කවුද ඒ අය ? කාට විරුද්ධවද මේ නඩුව දැම්මෙ ? මරණ තීන්දුව උඩ තවදුරටත් "Criminal Proceedings" ඇති වේය කියා රාජනීතිඥ ජොන්ක්ලස් මන්ත්‍රීතුමා කියනවා. කෝ ඒව ? අපි තවම බලාගෙන ඉනන්වා. ඒ පිළිබඳව උසාවියක දැන් කොයි තරම් දුරට වැඩ කටයුතු කර තිබෙනවද ? ජූරිලය අල්ලා දෙකට කඩල එල්ලුම් ගහට අරින එකයි තියෙන්නෙ. එම නිසා මේ කරන විකාරය කුමක්ද කියා අපි ප්‍රශ්න කරනවා. වගකිව යුතු කෙනෙක් නැගිට කිව්ව නම් අපි මේ ගැන නඩුවක් පවරනවා මය කියා—විත්තිකරුවන් කවුද කියා කියන්නට වුවමනා නැහැ—නඩුවක් පවර නවාය කියා කිව්ව නම් අපි නියෝජ්‍ය කථානායකතුමාගෙ කීම පිළිගන්නවා.

නමුත් ජොන්ක්ලස් මන්ත්‍රීතුමා මොකක්ද කියන්නෙ ? මා හිතන්නෙ ක්‍රිමිනල් නඩු ගැන එතුමාට වැඩිය කථා කරල පළපුරුද්දක් නැතිව් ඇති. එතුමා වැඩි හරියක්ම කථා කරන්නෙ නින්දගම් නඩුවලටයි. මහනුවර උසාවියෙ බොහොම දක්ෂ නීතිඥ මහත්මයෙක්

නියෝජ්‍ය කථානායකතුමා කෙරෙහි විශ්වාස භංගය

නමුත් අපි කියන්නෙ මේකයි. එතුමා දන්න නීතියෙ හැටියට එතුමා මේ ගරු සභාවට කියනවා, ඒ මරණ තීන්දුවෙන් පසුව තව දුරටත් නඩු මාර්ගයේ කටයුතු සිද්ධ වෙන වාය කියා. කාට විරුද්ධවද මේ නඩුව පවරා තිබෙන්නෙ ? කොහේද ඔය නඩුව ? අද දක්වා අපි බලාගෙන ඉන්නවා. පොලීසියෙන් කිව්ව තවත් විභාගයක් පවත්වන වාය කියා. කවුරුවත් දන්නෙ නැහැ, මොනව විභාග කළාද කියා. මට ආරංචියි උස මිම්ම එහෙම අරගෙන පඹයෙක් හදල ජනේලෙන් දැම්මාය කියා, පඹයට මොනව වෙයිද කියා බලන්න. පඹයො නම් ඉතින් මේ දවස්වල ඕනෑ තරම් ඉන්නවා. මේ මොන විකාරයක්ද ? මේ ප්‍රශ්නය උඩ නියෝජ්‍ය කථානායකතුමා මෙහෙමයි කියා තිබෙන්නෙ :

"With regard to the inquest proceedings, the magistrate in his capacity as an inquirer has under Section 362 of the Criminal Procedure Code reported that the evidence discloses a reasonable suspicion that crime has been committed." [OFFICIAL REPORT, 24th September 1966 ; Vol. 70, c. 753.]

ඒ කොටස නම් සියයට සියයක්ම හරි. මේ මනුෂ්‍යයා මරා දැමූ බවට ස්වර්ණාධිපති නඩුකාරතුමාගේ සිතේ සැකයක් තිබෙන වාය කියා තීන්දුවක් කර තිබෙනවා.

"The verdict at the inquest cannot rest there, for, under the Code, he must then act under sub-section 2, 3 or 4."—[OFFICIAL REPORT, 24th September 1966 ; Vol. 70, c. 753.]

මේ කොටස අනුව නියෝජ්‍ය කථානායකතුමා ස්වර්ණාධිපති නඩුකාරතුමාට නීතිය උගන්වන්න බැලුවා.

"The inquest proceedings are not final but further action must automatically follow, and what is contemplated are non-summary proceedings."—[OFFICIAL REPORT, 24th September 1966 ; Vol. 70, c. 753-4.]

ස්වර්ණාධිපති නඩුකාරතුමාට කියල නඩු දම්මවන්න යන්නෙ නියෝජ්‍ය කථානායකතුමාද, නැත්නම් ජොන්ක්ලස් මන්ත්‍රීතුමාද කියල මම දන්නෙ නැහැ. අපි තවම බලාගෙන ඉන්නවා. "Must automatically follow." මේ ඉඛේම එන නඩුව ගැනයි, අපි තවම බලාගෙන ඉන්නෙ.

"It is inevitable that the rule be applied."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එතකොට තවත් මෙතන කියා තිබෙනව—

"... if the evidence led there is sufficient, the accused will be committed to stand their trial."—[OFFICIAL REPORT, 24th September 1966; Vol. 70, c. 754.]

කවිද මේ විත්තිකරු? නියෝජ්‍ය කථානායකතුමා අපට කියනව විත්තිකරු ගැන. කවිද මේ විත්තිකරු? කොහෙන් සොයා ගත්තද මේක? ඇත්ත වශයෙන්ම මේක අපක්ෂපාත තීන්දුවක්ද කියා මා ප්‍රශ්න කරනවා. කවුරුවත් නොකී දෙයක් ගැන නියෝජ්‍ය කථානායකතුමා තීන්දු දෙනවා නම් මේ ගරු සභාවේදී මොකක්ද අපට කරන්ට තියෙන්නෙ? උන්නැහේ ඇටෝර්නි ජනරාල් හමු වුණාද? නැත්නම් ආණ්ඩුවට පක්ෂව සිටින නඩුකාරවරුන්ගේ අදහස කුමක්ද කියා උන්නැහෙ සොයා බැලුවද? නැත්නම් කොහොමද මේව දන්නෙ? ජොන්ක්ලස් මන්ත්‍රීතුමා සඳහන් කළ දේකුත් නොවෙයි; අපි සඳහන් කළ දේකුත් නොවෙයි. නියෝජ්‍ය කථානායකතුමා කොහෙන්ද මේව සොයා ගත්තෙ?

ගරු කථානායකතුමනි, අපක්ෂපාත තීන්දුවක් දෙනවා නම් මොකක්ද කළ යුතු දේ? අපේ තර්ක ටික බලනව. ඒ අයගෙ තර්ක ටික බලනව. අපේ තර්ක වැරදි නම් හේතු දක්වා ඒව ප්‍රතික්ෂේප කරනව. ඒ අයගෙ තර්ක හරි නම් ඒව පිළිගන්නව. නමුත් මෙතන මොකක්ද සිද්ධ වී තිබෙන්නෙ? කවුරුවත් කියපු නැති දේවල් ගැන ලියල නඩුවක් දමන්න යනවාය කියනව. කොහේද මේ නඩුව? නඩුවක් දමන්න යනවාද නැද්ද කියා නියෝජ්‍ය කථානායකතුමා කොහොමද දන්නෙ? "Non-summary proceedings must antomatically follow." අපට තීන්දුව දුන්නෙ ඒක උඩයි. කාට හරි විරුද්ධව නඩුවක් දමනව නම් මේක ඒ නඩුවට අවහිරයක් වන බව කියනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමා නඩු පැවරීමක් ගැන සොයා ගත්තෙ කොහෙන්ද? ඔව්, සොයාගෙන තිබෙන මාර්ගය නම් හොඳටම පැහැදිලියි. පසුගිය දවස්වල ජනේලයෙන් පඹයන් විසි කළ බව දැන ගන්නට තිබුණා. නමුත් කිසිම ශබ්දයක් නැතිව උපාසකයන් සේ සිටින පඹයන් මෙහි සිටින බව කියන්නට ඕනෑ. නියෝජ්‍ය කථානායකතුමාගේ තීන්දුව ගැන කල්පනා කරන විට අපට පෙනී යන්නෙ රජයෙන් එතුමාට කරන ලද බලකිරීමක් නිසා එසේ නැත්නම් නියෝග කිරීමක් නිසා එතුමා එවැනි තීන්දුවක් දුන් බවයි. අවස්ථාවේ හැටියට ඒ විධියේ තීන්දුවක් දෙන ලෙස එතුමාට බල කර තිබෙනවා. අපේ තර්කය ඒකයි.

ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා ආණ්ඩු පැත්තෙන් සහ විරුද්ධ පැත්තෙන් ආධාර ඉල්ලනවා යයි නියෝජ්‍ය කථානායකතුමා කීම නීතිමය විකාර කථාවක් පමණයි. එතුමා ඒ කල්පේ බොරුවක්. එතුමා මන්ත්‍රීවරුන්ගෙන් ආධාර ඉල්ලුවත් ඔවුන් ඉදිරිපත් කරන තර්කවලට ඇහුම්කන් දෙන්නට අදහස් කෙළේ නැහැ. එතුමා ඉදිරිපත් කළ උදාහරණ ඕස්ට්‍රේලියාවෙන් හෝ එංගලන්තයෙන් හෝ ටිම්බක්ටුවෙන් හෝ ලබා ගත්තත්, එදා එතුමා ඒ විධියට තීන්දුවක් දුන්නේ රජයේ වගකිවයුත්තන්ගේ ඉල්ලීමකට හිස නැමීමක් වශයෙන් බවයි ඔප්පු වන්නෙ. හෙට අනිද්දා නඩුවක් පවරන්නට යනවා යැයි රජයේ වගකිවයුතු ඇමතිවරයකු කියනවා නම්, ඊට සම්බන්ධ කාරණා ගැන මෙම ගරු සභාවේදී සාකච්ඡා කිරීමට ඉඩ නොදිය යුතු බව අප පිළිගන්නව. ඒ විධියට කියනවා නම් නඩුවක් තිබුණත් නැතත් ඒ වගේ සාකච්ඡාවකට ඉඩ නොදීම යුතුකමයි. ඒ මොහොතේ නඩුවක් පවරා නැති පලියට සාකච්ඡාවකට ඉඩ දිය යුතු නැහැ. අපත් නීතියට ගරු කරනවා. අපත් පාර්ලිමේන්තු සම්ප්‍රදායට යටත් වෙලයි, ඉන්නෙ. අප පාර්ලිමේන්තුවටත් පාර්ලිමේන්තු සම්ප්‍රදායටත් ගරු කරන නිසයි, නියෝජ්‍ය කථානායකතුමාගේ ක්‍රියා පටිපාටියට මේ තරම් විරුද්ධ වන්නෙ.

සමහර විට කථානායකතුමා හෝ නියෝජ්‍ය කථානායකතුමා දෙන තීන්දුවක් අපට පක්ෂ වන්නටත් පුළුවනි; විරුද්ධ වන්නටත් පුළුවනි. ඒ වගේම ආණ්ඩුවට පක්ෂ වන්නටත් පුළුවනි; විරුද්ධ වන්නටත් පුළුවනි. 1964 දී හියු ප්‍රනාන්දු මහතා කථානායකතුමා වශයෙන් සිටියදී එක්තරා කාරණයක් සම්බන්ධයෙන් මෙම ගරු සභාවේදී ප්‍රශ්නයක් මතු වූ විට එතුමා දුන් තීන්දුවෙන් එවකට තිබුණු ආණ්ඩුවට සෑහෙන කරදරයකට මුහුණ පාන්නට සිදු වුණත්, මේ මේ විධි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එඑස් ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

යට තින්දු දිය යුතු යයි අප එතුමාට කිවේ නැහැ. එදා ඒ ප්‍රශ්නයේදී අප රාජනීතිඥ වරයන්ගේ ආධාරය ලබා ගත්තේත් නැහැ. පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ නොතිබුණු පොත් සොයාගෙන ගියෙත් නැහැ. පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුගමනය කරනවා නම්, පාර්ලිමේන්තුවට සැලකිල්ලක් දක්වනවා නම්, ඇති වන සටන්වලින් බේරෙන්නට බැරි වන විට වෙන මොනවා හෝ කළත් කථානායකතුමාගේ හෝ නියෝජ්‍ය කථානායකතුමාගේ පදවිවල මඩ ගාන්නට ලෑස්ති වන්නට එපා. ඒ පදවි නියම විධියට දරන්නට බැරි අය ඒ පදවිවල මඩ ගාන්නටත් එපා. කුමන පක්ෂයකින් මැතිවරණයට මුහුණ පෑවත් දැන් කථානායකතුමා කිසිම පක්ෂයකට අයිති නැහැ. දැන් එතුමා අප සියලු දෙනාටම අයිතියි. ඒ වගේම අප එතුමා ගැන ආඩම්බර වෙනවා. විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් අප එතුමාට සෑම ආරක්ෂාවක්ම දෙන්නට ලෑස්තියි.

ගරු කථානායකතුමනි, දොඩම්පෙ මුදලාලි මරා දැමීමෙන් රජය කරන ලද වැරදි කටයුත්ත නිසා රජයට කරදරයකට මුහුණ පාන්නට සිදු වුණු බව ඇත්තයි. එවැනි දේවල් සිදු වෙනවා. මේ ප්‍රශ්නයේදී ආණ්ඩුවට කෙළින් ඉන්නට බැරි වුණේ ඇයි? නඩුකාරතුමා දුන් තීන්දුව අනුව තව දුරටත් කටයුතු කරන බවටත් එහෙයින් මෙවැනි සාකච්ඡාවලින් හානියක් වන බවටත්, ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරන්නට ආණ්ඩුවට පුළුවන්කම තිබුණා. නමුත් මොකක්ද සිදු වුණේ? ගරු අගමැතිතුමා හැංගිමුත්තන් ක්‍රීඩාවක යෙදෙන්නට පටන් ගත්තා. සාකච්ඡාවකට සතුටු බව අගමැතිතුමා මුලින් කිව්වා. මම සතුටුයි සාකච්ඡාවට. ඒ ඉස්සරහ දොරෙන්. පස්ස දොරෙන් එනවා, ජොන්ක්ලස් මන්ත්‍රීතුමා. බැහැ. ගරු කථානායකතුමනි, මෙහෙම වැඩ කරන්න ඉඩ දෙන්න. අපි නියෝජ්‍ය කථානායකතුමාට කොච්චර කැමති වුනත්, මේවා නොකියා සිටින්න බැරි නිසයි, මේ අවස්ථාවේදී අපි එතුමාට විරුද්ධව මේ කරුණු ඉදිරිපත් කරන්නෙ.

ඊළඟට මම කැමතියි, තමුන්නාන්සේට තවත් කාරණාවක් මතක් කරන්න. මේ රජය යටතේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය, මීට පෙර තිබුණු සම්ප්‍රදායට වඩා ටිකක් වෙනස් වී තිබෙන බව පෙනෙනවා. ගරු කථානායකතුමනි, නීතියට යටත් වූ—උසාවියක තීන්දුවකට යටත් වූ—ප්‍රශ්නයක් ගැන කථා කරන විට උසාවියේ තීන්දුවක් ලැබෙන්න තිබෙන මනුෂ්‍යයකුට හානියක් කිරීමට උත්සාහ කිරීම වැරදි බව අපි කවුරුත් කල්පනා කරන්න ඕනෑ. යම් කිසි මනුෂ්‍යයකු මිනීමරුවකුද නැද්ද කියා තීරණයකට බසින්නට නඩුවක් තියෙනවා නම් මේ මනුෂ්‍යයා මිනී මැරුවාය කියා අපි පාර්ලිමේන්තුවේ කීම වැරදියි. ඒ බලය තිබෙන්නෙ අපට නොවෙයි. ඒ බලය තියෙන්නෙ ජූරි සභාවටයි. හරි හෝ වැරදි හෝ ඒ බලය තියෙන්නෙ අපට නොවෙයි. අප එවැනි කථාවලින් වළකින්නට ඕනෑ. ඒ බව අපි කවුරුත් දන්නවා.

උසාවියට යටත් වී තිබෙන්නෙ කොයි ප්‍රශ්නයද කියා අපි දන්නෙ කොහොමද කියා මම අහන්නට කැමතියි. මේ රටේ උසාවිවල තිබෙන නඩු සියල්ලක් ගැනම අපි දන්නවද? පානදුර උසාවියේ, ගම්පහ උසාවියේ, යාපනේ උසාවියේ තියෙන නඩු ගැන අපි දන්නවද? කළුතර උසාවියේ තියෙන නඩු ගැන අපි දන්නවද? බේරුවල මන්ත්‍රීතුමාවත් දන්නෙ නැතුව ඇති. උසාවියට යටත්ව තිබෙන ප්‍රශ්න සියල්ලක් ගැනම අපි කවුරුවත් දන්නෙ නැහැ. ඒක මතු කරලා, පෙන්නුම් කරලා දුන්නමයි, අපි දැන ගන්නෙ. සමහරවිට පවතින නඩුවකට සම්බන්ධ සිද්ධියක් ගැන මම වැරදීමකින්—මම නොදන්න නිසා—කථා කරන්න පුළුවන්. අප කාගෙනුත් අප නොදන්න නඩුවකට සම්බන්ධ සිද්ධියක් ගැන කිය වෙන්නට ඉඩ තිබෙනවා, මේ ගරු සභාවෙ. ඒක වැරදි දෙයක් බව අපි දැන ගන්නෙ කොහොමද? කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් නැගිටලා කියා සිටින්න ඕනෑ, කරුණාකර මේ ගැන කථා කරන්න එපා, මේ කාරණය නඩුවකට යටත් වී තිබෙනවය කියා. එවිට තමුන්නාන්සේ දෙපැත්තම කල්පනා කර බලා කියයි, මේ ප්‍රශ්නය ගැන කථා නොකරනවා නම් වඩා හොඳය, එසේ කරනවා නම් මම කැමති වෙනවය, මේ ප්‍රශ්නය අමතක කර වෙන එකක් ගැන කථා කරන්නය කියා. එහෙම නේද කථානායකතුමනි? ඒක අපට තේරුම් ගන්න පුළුවන්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මොකක්ද උසාවියට යටත් වූ ප්‍රශ්නයක් කියන්නෙ? ක්‍රිමිනල් නඩු ගැන චෝදනා පත්‍රයක් තියෙනවා. ක්‍රිමිනල් නඩුවක ඒ චෝදනා පත්‍රයේ අඩංගු කරුණු ගැන කථා කිරීම තහනම් බව අපි කවුරුත් දන්නවා. අප කවුරුත් දන්නවා, සිවිල් නඩුවල පැමිණිල්ලයි උත්තරයයි කියා දෙකක් තිබෙනවා. ඒවායෙ සඳහන් වී තිබෙන ඉද් තමයි, නඩුවට අදාළ වන්නෙ. නමුත් ඕනෑම නඩුවක් යටතේ සාකච්ඡා වන්නෙ ඔය කරුණු පමණක් නොවෙයි. සාක්ෂි කාරයෙක් කියන ඕනෑම දෙයක් නඩුවට යටත්ද? සමහරවිට දික්කසාද නඩුවක ප්‍රශ්නයක් මතු වන්න පුළුවන්, ඒ දික්කසාද නඩුවට අදාළ හොර මනුෂ්‍යයා අසවල් රාත්‍රියේ වෙනින් නගරයක සිටියාද, එසේ නැත්නම් දික්කසාද නඩුවට සම්බන්ධ නෝනා මහත්මයා සමග එකතුව සිටියාද කියා. එසේනම් මේ ගරු සභාවෙදි, අසවල් මිනිහා අසවල් නගරයේ හිටපු අවස්ථා ගැන කථා කිරීම වැරදිද? ඒකයි, ජොන්ක්ලස් මන්ත්‍රීතුමාගෙ තර්කය. නඩුවට යටත් වූ ප්‍රශ්න ගැන නොවෙයි, "කොග්නේට් ඉෂ්යූස්" ගැන.

ගරු නියෝජ්‍ය කථානායකතුමා කථා කරලා තියෙන්නෙ "කොක්නේට් ඉෂ්යූස්" ගැන. ඇයි? අද කුමන්ත්‍රණ නඩුවක් තියෙනවා. කුමන්ත්‍රණ නඩුවෙ තියෙන ප්‍රශ්නය මොකක්ද? ඔය හිර කූඩුවෙ ඉන්න කට්ටිය අසුවල් දිනයක රාජද්‍රෝහී කුමන්ත්‍රණයක් කළාද, නැද්ද කියන එකයි, ප්‍රශ්නය. එච්චරයි. ඔය ජෙනරල් තුමන්ල ඔය කෝපරල් තුමන්ල—උසස් මිනිස්සුයි පොඩි මිනිස්සුයි—ඔක්කොම එකතුව රාජද්‍රෝහී කුමන්ත්‍රණයක් කළාද නැද්ද කියන එකයි, උසාවියට අදාළ ප්‍රශ්නය. නේද, ගරු කථානායකතුමනි? වෙන එකක් නැහැනෙ? දැන් දොඩම්පෙ මුදලාලි සාක්ෂිකරුවකුත් නොවෙයි. දැන් ඔහුට සාක්ෂි දෙන්ට සිද්ධ වෙන්නෙ වෙනින් උසාවියකයි. [බාධාකිරීමක්] ඉහළ උසාවියකයි. පහළ උසාවියක් උන් නැහේට නැහැ, ඇන්.

මොකක්ද මෙතැන තිබෙන ප්‍රශ්නය? ජොන්ක්ලස් මන්ත්‍රීතුමාගෙ තර්කය මට තේරුම් ගන්ට හැකි තම් උන්නැහෙ කියන්නෙ මේකයි: දොඩම්පෙ මුදලාලිගෙ මරණය පිළිබඳව සාක්ෂි දුන්න කුමන්ත්‍රණ නඩුවේ විත්තිකරුවන්ට සමහර විට තව සැරයක් කුමන්ත්‍රණ නඩුවෙදි සාක්ෂි දෙන්ට සිද්ධ වෙයි. ඒ සාක්ෂිකරුවන් ඉදිරිපත් වූණාම, මෙහිදී වන සාකච්ඡාවන් ඒ සාක්ෂි ඇත්ත බව ඔප්පු වන්ට පුළුවන්. ඒ සාක්ෂි ඇත්ත බව ඔප්පු වුණොත් කුමන්ත්‍රණ නඩුව එතැනින් හමාරයි. ඇයි? විත්තිකරුවන් කියන දේ පිළිගත් තොත් නඩුවක් නැහැ. ඉතින් කුමන්ත්‍රණ නඩුව බේරා ගැනීම පිණිස අපි දොඩම්පෙ මුදලාලි ගැන සාකච්ඡා නොකරමු. ඒකයි, තර්කය. ගරු කථානායකතුමනි, මේක මට නොතේරෙන දෙයක්. උසාවියට යටත් වුණු කරුණක් හැටියට අප සලකන්නෙ කෙලින්ම උසාවියට ඉදිරිපත් වී තිබෙන කාරණයක් පමණයි.

ගරු කථානායකතුමනි, මීට කලිනුත්, 1962 දීත්, මේ රටේ රාජද්‍රෝහී කුමන්ත්‍රණයක් තිබුණ නේද? ඒ කෙදි මිනිස්සු ජනේලවලින් පැන්නෙත් නැහැ; මිනිසුන් ජනේලවලින් තල්ලු කර දැම්මෙත් නැහැ. ඒ දවස්වල මිනිස්සු පණ පිටින් හිටිය, සාක්ෂි දෙන්ට. එදා විභාග කළ අන්දම අද විභාග කරන අන්දමට වඩා හුඟක් වෙනස්. එදා සාක්ෂි දෙන්ට හැම දෙනාම ජීවතුන් අතර හිටිය.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
වෙඩි තියාගත්ත.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
මේ දවස්වල නම් නඩු පවරන්ටත් කලින් "ඉන්ක්වෙස්ට්" විභාග අවශ්‍ය වෙලා. මොකක්ද එදා ඇති වුණු තත්ත්වය? රජය වෙනුවෙන් ඒ අවස්ථාවෙදි අපි කියා සිටිය, පොලීස් හමුදාවෙත්, යුද හමුදාවලත් එක්තරා පිරිසක් එකතුව රාජද්‍රෝහී කුමන්ත්‍රණයක් කළාය කියා. ඒක ඇත්ත බව උසාවියෙන් ඔප්පු වුණා. ඇපැල් උසාවියෙන් ඔප්පු වුණා නීතියේ දුර්වලතාවයක් තිබෙනවාය කියා. ඒ නිසා කුමන්ත්‍රණකරුවන් නිදහස් වුණා. අපි කවුරුත් ඒකට සතුටුයි. දෙපැත්තම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්ජ් ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

සතුටුයි. දැන් ආණ්ඩු පක්ෂය සතුටුයි, එයාලගෙ අය නිදහස් වීම ගැන; අපි සතුටුයි, නීතියේ කොතරම් දුර්වලතා තිබුණත් කාරණය ඔප්පුවීම ගැන.

ගරු කථානායකතුමනි, අපි මේකයි, අහන්නෙ. ඒ කුමන්ත්‍රණ නඩුවේ විත්ති කරුවන් කියාසිටිය, "අපි නොවෙයි, කුමන්ත්‍රණකරුවො, පිලික්ස් ඩයස් බණ්ඩාරනායකයි කුමන්ත්‍රණකරුවා" කියා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) රාජ්‍ය ඇමතිතුමාත් ප්‍රසිද්ධියේ කියා සිටිය, "පිලික්ස් ඩයස් තමයි, මේ කුමන්ත්‍රණය කළේ" කියා. ඒ වචන කවුරුවත් තහනම් කළාද? ඇයි එසේ නොකළේ? ඒක නීතියට යටත් වූ ප්‍රශ්නයක් නොවන නිසයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

එතකොට විභාගයක් තිබුණෙ නැහැ.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

පිලික්ස් ඩයස්ට විරුද්ධව විභාගයක් නැහැ. කවදාවත් තිබුණෙ නැහැ. විභාගය තිබුණෙ රාජද්‍රෝහී කුමන්ත්‍රණය ගැනයි. එච්චරයි, තිබුණෙ. සහතික ඇත්ත. මම පිළිගන්නවා. එහෙත් ඒ කාරණය පිළිබඳව තීරණයක් දෙන්ට සිද්ධ වුණා උසාවියෙන්.

උසාවියක් තීන්දු කරන්ට තිබෙන සෑම දෙයක්ම උසාවියට යටත් වෙන්නෙ නැහැ. සිවිල් නඩුවක නම් පැමිණිල්ලේ හෝ උත්තරයේ තිබෙන කරුණුත්, ක්‍රිමිනල් නඩුවක නම් චෝදනා පත්‍රයේ ඇතුළත්ව තිබෙන කරුණුත් පමණයි, නීතියට යටත්. ඒ ගැන කථා කරන්ට බැහැ.

1962 පෙබරවාරි 13 වැනිදා රජය ප්‍රසිද්ධියේ කියා සිටිය, කුමන්ත්‍රණ සෑක කරුවන්ට විරුද්ධව නඩු දමන බව. එහෙත් විරුද්ධ පක්ෂය ඒ ගැන වාද විවාද කරන්ට ඉඩ ඉල්ලා සිටිය. මොකක්ද, ඇතිවූ තත්ත්වය? අපි පාර්ලිමේන්තු සම්ප්‍රදාය කවදාවත් පාවිච්චි කළේ නැහැ, රජයේ වැඩ වහ ගන්න. රජයෙන් වරදක් කෙරෙන්ටත් ඉඩ තිබෙනවා; හොඳ දෙයක් කෙරෙන්ටත් ඉඩ තිබෙනවා. ඒක මණින්ට පුළුවන් වෙන්නෙ මෙහි වාද විවාදවලින් පමණයි. බාග වෙලාවට රාජ්‍ය ඇමතිතුමා විසින් කුමන්ත්‍රණ නඩුව ඉදිරිපත් කිරීමෙන් රටට ලොකු යහපතක් කරන්ටත් ඉඩ තිබෙනවා. බාග වෙලාවට අනික් අතින් බොරුවක් කරන්ට ඉඩ තිබෙනවා; අපි දන්නෙ නැහැ. මෙහෙ කෙරෙන වාද විවාදවලින් පමණයි, අපට ඇත්ත දැනගන්ට පුළුවන් වන්නෙ. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා එදා කල්පනා කළේ එහෙමයි. මට විරුද්ධව චෝදනාව කුත් ඉදිරිපත් කළා. ඒකට මම තරහ වෙලා ගියෙ නැහැ. ඒ නිසා මා දැන් අහනවා මේක නීතියට යටත්, උසාවියට යටත් ප්‍රශ්නයක්ද? නෑ. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කියන්ට තිබුණු දේ කිව්ව. ඒ වාද-විවාදවලින් පස්සෙ අන්තිමට එතුමා ඒ චෝදනාව ප්‍රසිද්ධියෙ මේ ගරු සභාවෙදි ඉල්ලා අස්කර ගත්ත. ඒකට මම එතුමාට ගරු කරනවා.

අපි බොරුවක් කරන්නෙ නැහැ. උසාවියට යටත්වුණු දෙයක් ගැන කථා කරන්ට කවදාවත් අපේ බලාපොරොත්තුවක් නැහැ. අපට කථා කරන්ට ඕනෙත් නැහැ. එහෙත් නීතියට යටත්වුණු නැති දෙයක් බොරුවට ඉදිරිපත් කරල, "මල්ලෙ පොල්" තර්ක ඉදිරිපත් කරල, පාර්ලිමේන්තුවට අයිති නැති පොත් ඇතුළත් කරල, ඒ පොත්වල නැති දේවලුත් ඇතුළත් කරල, අගමැතිතුමා අමාරුවෙන් බේරගන්ට තීන්දු ලියන්න උත්සාහ කරනවා නම් අපි ඊට සහමුලින්ම විරුද්ධත්වය ප්‍රකාශ කරන බව මේ අවස්ථාවෙදි මා විශේෂයෙන් කිව යුතුයි.

කථානායකතුමනි, මේ නියෝජ්‍ය කථානායකතුමාගෙ තීන්දුව ගැන වූ සාකච්ඡාව පටන් ගත් වෙලාවෙදි තමුන්නාන්සෙ අපෙන් විශේෂ ඉල්ලීමක් කළා, මේ සාකච්ඡාවට අදාළ කරුණු පමණක් කථා කරන්න කියල. මේක නියෝජ්‍ය කථානායකතුමාට විරුද්ධව ඉදිරිපත් කළ විශ්වාස භංග යෝජනාවක්. එතුමගෙ තීන්දුව ගැනත්, එතුමාගෙ ක්‍රියා පටිපාටිය ගැනත් කථා කරන්ට අපට නිදහස තිබෙනවා. තමුන්නාන්සෙ කියා හිටියෙ ඊට පට හැණිව කථා නොකරනු ඇතැයි බලාපොරොත්තු වන බවයි. ඇත්ත වශයෙන්ම කල්පනා කර බලන්න, කථානායකතුමනි, මේ මොහොත දක්වා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දකුණු කොළඹ මන්ත්‍රීතුමාත් (බර්නාඩ් සොයිසා මයා.) මමත් කථා කළා. අපි ඊට පටහැණිව කථා කළාද? නෑ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳ ලක්ෂණට, හරියට නූලට කථා කළා.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

මාත් කල්පනා කරනව, අපි නූලට තමයි කථා කළේ කියා. නූල පනින්නෙත් නැහැ, නූල කඩන්නෙත් නැහැ. දැන් බලන්න, නියෝජ්‍ය කථානායකතුමා ඒ විශ්වාසය අප කෙරෙහි තිබ්බේ නැහැ. බලන්න, එතුමාගෙ තීන්දුව:

"The evidence of the witnesses on which the second inquest verdict was based was the evidence of some of those who are accused in the coup case that is now under trial. Any statements in the course of this Debate concerning the accused will only serve to prejudice their case before the courts. Even though the main purpose behind this Motion appears to be the deploring of the conduct of the police in the investigation of the facts relating to the death of Dodampe Mudalali and of the manner in which the inquest was held, a discussion of the Motion in the House may, in the words of a Speaker of the House of Commons, take it "too near to the subject to be safe." It is because there is a likelihood that if this were to happen the holding of a free and fair trial would be prejudiced, that I disallow a discussion of the Motion now before the House."—[OFFICIAL REPORT, 24th September 1966; Vol. 70, c. 754.]

මොකක්ද මේ තර්කය? "ආණ්ඩුවට විරුද්ධව තදබල විරෝධය ප්‍රකාශ කිරීම පිණිස මන්ත්‍රීවරු කථා කරන විට බාග වෙලාවට සමහර මන්ත්‍රීවරු කුමන්ත්‍රණ චිත්තිකාරයන් හැටියට සිටින අයගේ සාක්ෂි ගැන වචනයක් දෙකක්වත් කියන්ට පුළුවන්, එහෙම කීවොත් ඕනෑවට වඩා කුමන්ත්‍රණ නඩුව කිට්ටුවට යන්න මේකට ඉඩ තිබෙනව." අපි කියනවා, අපි ඔය ගැන කට ඇරල කියන කොට නූල පනින්නෙවත්, නූලට ඕනෑවට වඩා කිට්ටු වන්නෙවත් නැති බව. තමුන්නාන්සේට බලයක් තිබෙනව, නූල පෙන්වන්ට. "මෙන්න නූල, කරුණාකර හරි පැත්තෙන් එන්න" කියන්න තමුන්නාන්සෙට බලය තිබෙනව. නමුත් නියෝජ්‍ය කථානායකතුමා කියනව, "තමුන්නාන්සෙට කථා කරන්ට බෑ. මම කොහෙත්ම ඉඩ දෙන්නෙ නැහැ" කියල. අපි මොනව කියන්ට යනවද කියා දැනගන්නෙත් නැතුව එහෙම කියනව.

කථානායකතුමනි, අපිත් නීති සම්ප්‍රදාය දන්නව. නූල දැකලයි, අපි කථා කථා කළේ, නූල ගැන දැනගෙනයි. කථා කළේ. හිතන්ට එපා, අපි නූල නොදන්නවය, තමුන්නාන්සේල පමණක් නූල දන්නවය කියා. අපි කියා සිටින්නෙ, තමුන්නාන්සෙල බලන්නෙ නූල හෙමිහිට අනික් පැත්තට ගෙනියන්න බවයි. ඒ කයි රාජනීතිඥ වර්නන් ජොන්ක්ලස් මන්ත්‍රීතුමා කරන්ට බැලුවෙ. නූල හෙමිහිට පැත්තකට ගත්ත. ඔය නූල් ඇදීම්වලින් මෙහෙ වැඩ හරියන්නෙ නැහැ. අපි කියා සිටින්නෙ ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරයෙක් යම් වරදක් කළොත් ඒ වරද පෙන්නුම් කර දී ඒ මන්ත්‍රීවරයා හරි මාගීයේ යැවීමට තමුන්නාන්සේට බලය තිබෙන බවයි. ඒ කායීය තමුන්නාන්සෙ ඉතාමත් අලංකාර ලෙස සෑම අවස්ථාවකදීම කරන බව මම පිළිගන්නව. නියෝජ්‍ය කථානායකතුමාත් ඒ ලෙසම කළා නම් එතුමාට දොස් කියන්න අපට ඉඩක් නැහැ. නමුත් එතුමා එහෙම කෙළේ නැහැ. නූල කිට්ටුවටවත් යන්න කලින්, නූල පනින්න අවස්ථාවක් ලැබෙන්නත් කලින්, නූල පැන්නීම සම්පූර්ණයෙන්ම තහනම් කළා. එතකොට කථානායකතුමනි, ඒ ක්‍රියාවට අපි නිකම්ම ඔිස නමා නිකම් ඉන්නද? අපට පිළිගන්න පුළුවන්ද, මෙවැනි නියෝජ්‍ය කථානායකතුමෙක් අප මධ්‍යයේ සිටියදී අපේ වැඩ කටයුතු හරියාකාර ගෙන යන්න පුළුවන්ය කියා.?

තමුන්නාන්සෙ කෙරෙහි අපේ විශ්වාසයක් තිබෙනව. තමුන්නාන්සෙගෙ තීන්දු අපක්ෂපාත බව—සමහර විට වැරදි වෙන්න පුළුවන්, හරි වෙන්නත් පුළුවන්, ඒක සුළු දෙයක්—අපි පිළිගන්නව. නමුත් විශ්වාසයක් නැත් නම් අපි කොහොමද පාර්ලිමේන්තුව තුළ අපේ වැඩ කටයුතු ගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. ආර්. ඛයස් බණ්ඩාරනායක මයා.]

යන්නෙ? එකඟමාරත් ඔතරත් ඇතුළත මේ කරුණු සියල්ලම විග්‍රහ කරගෙන මෙතැනට පැමිණ තීන්දුවක් දෙනව. අපි ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ තර්කවලට කිසිත් පිළිතුරක් නොදී පිටින් ලබාගත් දෙයකින් මෙන්න මගේ තීන්දුවය කියා තීන්දුව දුන් විට එය අපට පිළිගත හැකිද? මම එවෙලෙම නැගිට, ඉතාම කල්පනාකාරීව,—මගේ කථාව මම ලියාගෙන ආවෙ නැහැ, නමුත් ඉංග්‍රීසියෙන් හෝ වේවා, සිංහලෙන් හෝ වේවා—කියා සිටියා, "ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තමුන්නාන්සෙගෙ තීන්දුවට සහමුලින්ම විරුද්ධයි; මම මෙපමණයි කියන්නෙ; මෙම ඉතාම කෙටි කාලය තුළදී තමුන්නාන්සෙ කර තිබෙන මේ නීති පර්‍යේෂණය ගැන මම පුදුම වෙනවා" කියා. එසේ ප්‍රකාශ කර විරුද්ධ පක්ෂයේ අප කවුරුත් නැගිට පිටතට ගොස් තමුන්නාන්සේ යළිත් පාර්ලිමේන්තුවට පැමිණෙන තුරු රැස්වීම්වලට සහභාගි නොවෙමුය කියා තීරණය කර ගත්ත.

අපි එසේ තීන්දු කර ගත්තෙ ඇයි කථානායකතුමනි? අපේ වරප්‍රසාද ආරක්ෂා කිරීමට සිටින තැනැත්තා කෙරෙහි විශ්වාසයක් නැත් නම් කොහොමද අපි මේ සභාවෙ වැඩ කටයුතු කර ගෙන යන්නෙ? ඒකයි අපේ තර්කය. අපි කියා සිටින්නෙ ඒ තත්ත්වය නැති කළ යුතු බවයි. නියෝජ්‍ය කථානායකතුමා බලාපොරොත්තු වෙනවා නම් ආණ්ඩුවට පක්ෂපාතව මේ විධියට තීන්දු දෙන්න, මේ රටේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය සහ සමාජවාදය ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් ලොකුවට කථා කරන උදවියට මතක තබාගන්න සිද්ධ වේවි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයටත් නිදහසටත් හානි වෙන්න ඉඩ තිබෙන්නෙ මේවායින් බව.

ගරු කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමේදී තමුන්නාන්සේ විසින් මුල් තැනක් ගත යුතුව තිබෙනව. තමුන්නාන්සේට මෙන්ම මේ ගරු සභාවේ සිටින තමුන්නාන්සේගේ නියෝජිතයින්ටත් විශාල වගකීමක් තිබෙනව. අන්න ඒ නිසයි අපි මේ අවස්ථාවෙදි කියා සිටින්නෙ එම තීන්දුව වැරදිය කියා. වැරදිවා පමණක් නොව, මෙය සක්ෂි පාතයි. පක්ෂපාත තීන්දුවක් කියන චෝදනාවයි අපි මේ ගරු සභාවෙදි කියා සිටින්නෙ. ඊට වඩා ඔප්පු කරන්න දෙයක් නැහැ. ඒ මොකද? තමුන්නාන්සේත් මාත් රු. 7 වන තුරු නැවතී ඉණි මං නැඟ ඔය පොත් ටික සොයන්න උත්සාහ ගත්තත් සොයා ගන්න බැහැ. මම ගිහින් බැලුනිසයි, එසේ කියන්නෙ.

අවසාන වශයෙන් මම තව එක කාරණාවක් මතක් කරනව. නීති, වරප්‍රසාද ආරක්ෂා කිරීමේදී තමුන්නාන්සේට තිබෙන වගකීම ඉටු කරන්නට තිබෙන්නේ පොතේ තිබෙන අකුරට පමණක් නොවෙයි. රටේ තත්ත්වය මැණගෙන, කල්පනා කරගෙන, සෑම දෙයක් ගැනම ඉතාමත් කල්පනාකාරීව රටේ වැඩ කටයුතුවලට අවහිරයක් නොවන හැටියට ඒ වගකීම ඉටු කළ යුතු බව අපි කවුරුත් පිළිගන්නව. පාර්ලිමේන්තු කාලය සම්පූර්ණයෙන්ම විරුද්ධ පාර්ශ්වයට දිය යුතුයයි අප කවුරුවත් කවදාවත් කියා සිටියේ නැහැ. එය අසාධාරණයි. එහෙත් යම් විධියකින් විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් අඩු ගණනේ මාස දෙකකට එක් දිනයක්වත් ලබා ගන්නට අපට බැරිකමක් තිබෙනවා නම්—විරුද්ධ පාර්ශ්වයේ අවශ්‍යතාවන් අනුව වැදගත් ප්‍රශ්න මේ ගරු සභාවට ඉදිරිපත් කර සාකච්ඡා කිරීමට එක් දිනයක්වත් ලබා ගන්න බැරිකමක් තිබෙනවා නම්—එතකොට තව දුරටත් මේ පාර්ලිමේන්තුවේ අප සිටීමෙන් වැඩක් වන්නේ නැහැ. ඒ කොයි හැටි වෙතත් පාර්ලිමේන්තුවට තිබෙන වැඩ කටයුතු ගැන කල්පනා කර බලන විට, පාර්ලිමේන්තුව රැස්වෙන දවස්වලින් සියේට 80කට 90 කට වඩා ඒ වැඩ කටයුතු වෙනුවෙන් ආණ්ඩුවට දිය යුතු බව අප පිළිගන්නව. රජයට තමයි වගකීම තිබෙන්නෙ. රටේ පාලනය ගෙන යන්නෙ විරුද්ධ පාර්ශ්වය නොවෙයි. ඒ නිසා රජයකට හරියාකාර තමන්ගේ වැඩ කටයුතු ටික කරගෙන යාමට, වාද විවාද කරගෙන යාමට, නීති සම්පාදනය කර ගැනීමට වැඩි කාලයක් අවශ්‍ය බව අමුතුවෙන් කියන්න දෙයක් නොවෙයි. එය අප කවුරුත් පිළිගන්න කාරණයක්.

ඒ සමගම මේ කාරණයත් කල්පනා කර බලන්න. නීතියෙන් විශ්වාස භංග යෝජනාවකට විශේෂ ඉඩක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එහෙත් මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන්නට පෙර අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් තිබුණා. මේ අවුරුදු එකහමාර තුළ අප විසින් ඉදිරිපත් කරන ලද ඒ යෝජනාවට කාලයත් දිනයත් ලබා ගන්න බැරිකමක් තිබුණේ නැහැ. එහෙත් පසුගිය සැප්තැම්බර් මාසයේ 24 වැනිදා ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වූ, එහෙත් ගරු නියෝජ්‍ය කථානායකතුමා විරුද්ධ පාර්ශ්වයට ඉදිරිපත් කරන්නට ඉඩ නොදුන් එම යෝජනාව සඳහා දිනයක් ඉල්ලා සිටි නමුත් එය වරින් වර දිනෙන් දින කල් ගියා. ඒ සඳහා දිනයක්වත් ලබා ගන්න අපට පුළුවන්කමක් ඇති වුණේ පාර්ලිමේන්තුව විර්ජනය කිරීමෙන් පමණයි. අපේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව අප වැඩ කරගෙන යා යුතුයි. ඒ නිසා තමුන්නාන්සේ මෑනලා බලා නියෝගයක් කරන්න ඕනෑ මේවා ගැන. ඒ හැම දෙයක්ම රජයේ කටයුතුවලට අවහිරයක් නොවන හැටියට කළ යුතු බව අපිත් කියනවා. අපට සම්පූර්ණ කාලය තුළ කථා කරන්න ඉඩ දෙන්නැයි අප කියන්නෙ නැහැ. එහෙත් අපට සාධාරණ ලෙස ලැබිය යුතු අසිතිවාසිකම් ලැබෙන ආකාරයට තමුන්නාන්සේ කටයුතු නොකරනවා නම් අපට කිසිසේත් තමුන්නාන්සේගේ උසස් පදවිය කෙරෙහි විශ්වාසය තබන්නට බැහැ. ඒකයි ඇති වුණේ. ඒ නිසා ඒ ගැන කල්පනා කර බලන්නැයි මා විශේෂ ඉල්ලීමක් කරනවා.

දවසේ වැඩ අවසානයේදී හදිසි කාරණා ගැන සාකච්ඡා කිරීමට, කරුණු ඉදිරිපත් කිරීමට පැයක කාලයක් දීමට ස්ථාවර නියෝගය යටතේ වරප්‍රසාදයක් අපට තිබෙනවා. ඕනෑම දවසක එයට ඉඩ ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. එහෙත් පුදුමයකට කියන්න තිබෙන්නෙ අපේ දැන් පවතින පාර්ලිමේන්තු වාරයේදී හදිසි කාරණයක් නම් කවදාවත් සිද්ධ වෙලා නැති හැටියටයි කාටත් පෙනී යන්නෙ කියන එකයි. එක් දවසක්වත් හරි හදිසි කාරණාවක් සාකච්ඡා කරන්න යොදා ගන්න බැරි වුණා. අප දන්නා හැටියට ඕනෑම වෙලාවක ගරු මන්ත්‍රීවරුන් විසි දෙනකුට තමන් සිටින අසුන්වලින් නැඟිට හදිසි කාරණයක් සාකච්ඡා කිරීමට අවසරය ඉල්ලන්න පුළුවන්කම තිබෙනවා. එය හදිසි කාරණයක්ද නැද්දැයි තීරණය කර ඊට ඉඩ දෙන්නෙ ගරු කථානායකතුමා විසිනුයි. ජනවාරි 8 වැනිදා සිට හදිසි කරුණක් තිබුණා නම් ඒ සඳහා අවස්ථාවක් ලැබිය යුතුව තිබුණා. එහෙත් හැම කරුණක්ම හදිසි කාරණයක් හැටියට සලකා හැම දවසෙම ඒ ගැන සාකච්ඡා කරන්න ඉඩ දෙන ලෙස ඉල්ලා සිටියා නම් එය පාර්ලිමේන්තුවට අවහිරයක් නොවෙයිද? එහෙත් සාකච්ඡා කිරීමට ඉල්ලා සිටින හැම දෙයක්ම හදිසි නැතැයි කියමින් අවසරය නොදී සිටියොත් එයත් සාධාරණයි කියන්න පුළුවන්කමක් තිබෙනවාද? සමහර විට ඇඳුම්වලට ගිනි ඇවුලුනොත් පමණයි හදිසි කාරණයක් හැටියට ඇතැම් අය සලකන්නෙ. එහෙම කල්පනා කරතොත් වැඩක් තිබෙනවද? එහෙත් යම් හදිසි කරුණක් ගැන සාකච්ඡා කිරීමට අවසර ඉල්ලා සිටින විට ඔය කියන දෙපැත්තම පරීක්ෂාකාරී ලෙස සලකා බලා ඉතාමත් සාධාරණ ලෙස තීරණයකට බහිනවා නම් විරුද්ධ පාර්ශ්වය තමුන්නාන්සේට විශේෂයෙන්ම ස්තුතිවන්ත වන බව මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි.

මීට වැඩි යමක් මේ අවස්ථාවේදී කියන්න මා බලාපොරොත්තු වන්නෙ නැහැ. අප මේ විවාදයේදී යම් යම් තර්ක ඉදිරිපත් කර තිබෙන්නේ අප තුළ ඇති පෞද්ගලික තරහක් උඩ නොවෙයි. නියෝජ්‍ය කථානායකතුමා මගේ පෞද්ගලික යාලුවෙක්. අවුරුදු ගණනාවක් පමණක් නොවෙයි, පරම්පරා ගණනාවක් තුළ කිට්ටු හිතවත්කම් තිබෙන කෙනෙක්. පෞද්ගලික වශයෙන්ම හොඳ යාලුකමක් එතුමා සමග අපට තිබෙනවා. ඒ නිසා හිත් වේදනාවෙනුයි මේ අවස්ථාවේදී මා කථා කරන්නෙ. ඒ කොයි හැටි වෙතත් කිවයුතු දේවල් කිවයුතුමයි. මෙය ප්‍රතිපත්තියක් වශයෙන් ඉදිරිපත් කරනු මිස පෞද්ගලික තරහකින් ඉදිරිපත් කරනවා නොවෙයි. මේවා කියන්නෙ සම්ප්‍රදාය ගරු කිරීම අවශ්‍ය නිසයි.

අවසාන වශයෙන් එක් ඉල්ලීමක් කළ යුතුව තිබෙනවා. දැන්වත් අවංකව කල්පනා කර බලන්න මේ කාරණය ගැන. දොඩම්පේ මුදලාලිගේ මරණය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්ජ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

ගැන නඩුවක් නැති බව දැන්වත් තමුන්නාන්සේලා පිළිගන්නවද? ඒ සම්බන්ධයෙන් දැන් වෙන කිසිම විභාගයක් නැති බව පිළිගන්නවද? දොඩම්පෙ මුදලාලිගෙ සිද්ධිය සම්බන්ධයෙන් නඩුවක් දාන්න බලාපොරොත්තුවක් නැති බව දැන්වත් රජය පිළිගන්නවාද? ඒ ගැන නඩුවක් නැති බව දැන් කවුරුනුත් දන්නව. එම නිසා එදා නියෝජ්‍ය කථානායකතුමා විසින් දෙන ලද වැරදි තීන්දුව පැත්තකට දමා, දොඩම්පෙ මුදලාලි සිද්ධිය සම්බන්ධයෙන් අප ඉදිරිපත් කළ යෝජනාව නැවත වරක් න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඒ ගැන සාකච්ඡා කරන්න අවස්ථාවක් දෙන්න. ඒකයි මගෙ ඉල්ලීම.

මීට වඩා කථා කරන්න මම අදහස් කරන්නෙ නෑ. තමුන්නාන්සෙටත් ගරු සභාවටත් ස්තුති කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනව.

අ. භා. 3.11

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය කථානායකතුමා එදා එතුමගෙ තීරණය දෙන්න ප්‍රථම විරුද්ධ පක්ෂයෙ නායකයො එතුමා හැඳින්නුවෙ ඉතාමත් දක්ෂ සමර්ථ නීතිඥයකු හැටියටයි. නමුත් එතුමගෙ තීරණය දීමෙන් පසු අද ඒ නායකයොම එතුමා හඳුන්වන්නෙ ඉතාමත් නරක වංචා සහගත පුද්ගලයකු වශයෙනුයි. එදා රීති ප්‍රශ්නය මතු වුණු අවස්ථාවෙදී මැද කොළඹ තුන් වැනි ගරු මන්ත්‍රීතුමා (කෙනමන් මයා.) නියෝජ්‍ය කථානායකතුමා ගැන කථා කළේ මෙහෙමයි:

"The fact that the hon. Appointed Member should agree with this position, and legally, is in my submission no reason why you as the guardian and custodian of the rights of the House and even a more eminent lawyer than the Attorney-General should automatically agree with this point of view.

MR. DEPUTY SPEAKER: I have not automatically agreed.

MR. KEUNEMAN: I know, Sir. I am not flattering you. I very sincerely think that you are a very eminent lawyer;—

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
I still think so.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
—otherwise you would not have been recently appointed to the position of such high eminence in the legal world." [OFFICIAL REPORT, 24th September 1966; 1966; Vol. 70. c. 733.]

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
I also agree with what he said about good canvassing.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
මැද කොළඹ තුන් වැනි ගරු මන්ත්‍රීතුමා, රාජ නීතිඥවරුන් ශ්‍රෙෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් ඇතුළු නීතිඥ පරම්පරාවකින් පැවත එන පුද්ගලයෙක්. උන්නැහෙත් නීතිඥයෙක් හැටියටයි අපි පිළිගන්නෙ. එතුමා නියෝජ්‍ය කථානායකතුමා හැඳින්නුවෙ, රාජ නීතිඥයකු වන ඇටර්නි ජනරාල්තුමාටත් වඩා උසස් සමර්ථ නීතිඥයකු හැටියටයි.

"I am not flattering you. I very sincerely think that you are a very eminent lawyer."

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
I still think so.

ගරු ජේ .ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඒ ගරු මන්ත්‍රීතුමා බොහොම අවංක පුද්ගලයෙක්. එතුමා අවංක ලෙසම කියා තිබෙනව, ලංකාවෙ උසස්ම පදවියට පවා නියෝජ්‍ය කථානායකතුමා සුදුසු කෙනෙක් බව. මේ තීරණය දුන්නෙ නියෝජ්‍ය කථානායකතුමා එතුමාගෙ තීරණය දෙන්න කලිනුයි. නමුත් දැන්, මැද කොළඹ තුන් වැනි ගරු මන්ත්‍රීතුමා තව ටිකකින් කථා කරණ විට, දොම්පෙ ගරු මන්ත්‍රීතුමා කී කරුණු සියල්ලම අනුමත කරයි. "තමුන්නාන්සෙ දක්ෂ නීතිඥයෙක් නොවෙයි, තමුන්නාන්සෙ පක්ෂපාතයි, තමුන්නාන්සේ බොහොම සුළු වේලාවකින් මේ තීරණය

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය කථානායකතුමා කෙරෙහි විශ්වාස භංගය

දුන්න, රාජ නීතිඥයින්ගෙ ගෙවලට රහසින් ගියා" ආදි වශයෙන් කියන්න පුළුවන් හැම නරකක්ම නියෝජ්‍ය කථානායකතුමාගෙ පිට උඩ පටවයි තව ටික කින්. එදා නියෝජ්‍ය කථානායකතුමා මැද කොළඹ තුන්වැනි ගරු මන්ත්‍රීතුමාට පක්ෂව තීරණය දුන්න නම් උන්නැහෙගෙ අකාරාදියෙ වචන නැති වෙනව නියෝජ්‍ය කථානායකතුමා වර්ණනා කරන්න, එතුමාට ප්‍රසංශා කරන්න. මැද කොළඹ තුන්වැනි ගරු මන්ත්‍රීතුමා (පී. ජී. බී. කෙනමන් මයා.) තවත් අදහසක් ප්‍රකාශ කළා. එතුමා කියන්නේ මෙහෙමයි:

"May I submit that the real question would be this: it is perfectly correct that it would be totally out of order for any hon. Member to refer to the non-summary inquiry that is now in progress in the matter of the persons who are alleged to have conspired to overthrow the Government. That is a matter for your guidance of the Debate"—[OFFICIAL REPORT, 24th September 1966; Vol. 70 c. 734.]

මා ඉංග්‍රීසියෙන් කිව්වේ උන්නැහේට තේරෙන්නයි. දැන් සිංහලෙනුත් කියන්නම්. එහි සිංහල අදහස මේකයි: "නියම ප්‍රශ්නය නම් මෙහෙමයි. කිසිම මන්ත්‍රීවරයෙක් කුමන්ත්‍රණ නඩුව ගැන හෝ ඒ විභාගයට අදාල යම් දෙයක් ගැන හෝ කියනවා නම් එය නීතියට විරුද්ධයි කියා මා මේ අවස්ථාවේදී කියන්න සතුටුයි. ඒ සම්බන්ධ විවාදය පාලනය කරන්නෙ තමුන්නාන්සේයි." එහෙමයි කියා තිබෙන්නෙ. එතුමාගේ ඒ අදහස මාත් පිළිගන්නව.

කෙනමන් මයා.

(திரு. கெனமன்)

(Mr. Keuneman)

Why not go on with the rest of what I said?

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

නියෝජ්‍ය කථානායකතුමාත් පිළිගෙන තිබෙන්නේ අන්න ඒ අදහසමයි. නියෝජ්‍ය කථානායකතුමාගේ තීරණයේ කියා තිබෙන්නෙත් මෙන්න මෙහෙමයි:

"The Motion before the House does not restrict itself to the inquest proceedings, but it refers to a case that is already pending as paragraph (2) of the Motion states that 'Dodampe Mudalali was killed while he was being interrogated by the Special Branch of the C.I.D. at the C.I.D. headquarters in connection with the investigation into the alleged attempt to overthrow the Government'"—[OFFICIAL REPORT, 24th September, 1966; Vol. 70 c. 754.]

ඒ විශ්වාස භංග යෝජනාවේම මෙන්න මේ වචන ඇතුළත් වී තිබෙනව. එනම්, "දොඩම්පෙ මුදලාලිගේ මරණය ඇති වුණේ කුමන්ත්‍රණ නඩුවේ විභාගය සම්බන්ධව ප්‍රශ්න අසන විටයි." ඒ විධියට ඒ යෝජනාවේ තිබෙනව. ඉතින් ගරු නියෝජ්‍ය කථානායකතුමා කල්පනා කළා, පොලිස් පරීක්ෂණ අවසාන වී ඒ විභාගය දැන් උසාවියට ගොස් තිබෙන නිසා උසාවියේ තිබෙන ඒ විභාගය ගැන යම් කථාවක්, යම් විවාදයක් හෝ යම් යෝජනාවක් මේ පාර්ලිමේන්තුවේදී සාකච්ඡා කරනවා නම් එය අර ස්ථාවර නියෝගයට විරුද්ධයි කියා.

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

කොයි ස්ථාවර නියෝගය යටතෙද?

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

96 (vi).

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.

(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)

(Mr. F. R. Dias Bandaranaike)

But that is not about Motions.

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

මා කීවේ මැද කොළඹ තුන්වැනි ගරු මන්ත්‍රීතුමා කී කරුණු අනුව, ඒවා පිළිගෙන නියෝජ්‍ය කථානායකතුමා තීරණය දී තිබෙන බවයි. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් මැද කොළඹ තුන්වැනි ගරු මන්ත්‍රීතුමා කී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ජේ. ආර්. ජයවර්ධන]

අදහස් පිළිගෙන මේ යෝජනාව කුමන් තුණ නඩුවට අදාලයි කියා කල්පනා කිරීම වැරදියි කියා තමුන්නාන්සේලාට කියන්න පුළුවන්. එමෙන්ම, ගරු නියෝජ්‍ය කථානායකතුමා ඒ විධියට කල්පනා කර එවැනි තීරණයක් ගැනීම හරියි කියලත් තවත් කෙනෙකුට කියන්න පුළුවන්. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) හිනා වෙන්නේ ඇයි? ඔය දෙකින් කොයි එක හරිද වැරදිද කියා අපට තීරණයකට බහින්නට බැහැ.

මම එය නැවත වරක් කියන්නම්. මෑද කොළඹ තුන්වැනි ගරු මන්ත්‍රීතුමා කිව්ව යම් දෙයක් කුමන් තුණ නඩුවට අදාල වෙනවා නම්, ඒ ගැන මේ ස්ථානයේදී කථා කිරීමට බැරි ය කියල. එය හරිද? එමෙන්ම මේ යෝජනාව එයට අදාල වෙනවාය කියලත් කියනව. එහෙම නම් පක්ෂපාතකමක් නැහැනෙ. මෑද කොළඹ තුන්වැනි ගරු මන්ත්‍රීතුමා නියෝජ්‍ය කථානායකතුමාගේ කටට තින්දුව දුන්න. එතුමත් එය හොඳට හිතට අරගෙන ඒ අදහස අනුව තීන්දුවක් දුන්න.

මේක බිඳ දමන්න බැරි නිසා දොම්පෙ මුදලිතුමා [බාධාකිරීම්] දොම්පෙ ගරු මන්ත්‍රීතුමා (ඒ්ෆ්ප්. ආර්. ඩයස් බණ්ඩාර නායක මයා.) මොකද කළේ? කිසි දවසක නොකියවූ පුස්කාපු පොත් 10 ක් විතර අරගෙන මෙහාට ඇවිත් කතා කළා. මම දන්නෙ නැහැ ඒව "එකවුන්ටිස්" පොත්ද, නීති පොත්ද කියන්ට. එතුම ඒව ඇරියෙවත් නැහැ. නමුත් පොත්පත් හුඟක් උස්සගෙන ඇවිත් කතා කරමින් කියනව, නියෝජ්‍ය කථානායකතුමා මිනිත්තු 5කින් මේ පොත් ඔක්කොම කියවල තීරණයක් දුන්නාය කියා. "ඒක මිනිත්තු හතර පහකින් දුන් තීරණයක් නොවෙයි; දින හතර පහකට ඉස්සෙල්ල ලියාපු තීරණ යක්" යන ආකාරයටයි, කිව්වෙ. උන්නැහෙට ඒ වෙනුවෙන් ඉදිරිපත් කරන්ට සාක්ෂි නැහැ. ඒව ඇත්තද නැත්තද කියා ඔප්පු කරලත් නැහැ. නියෝජ්‍ය කථානායකතුමාගෙ සම්ඵෝතාව කොත රම් උසස් වුවත් ඒක කරන්ට බැරි දෙයක් හැටියටයි දොම්පෙ ගරු මන්ත්‍රීතුමා හිතුවෙ? පස්සෙද? ඊට ඉස්සෙල්ල උන් තුමා කල්පනා කරන්නෙ. ඒකත් වැරදි අදහසක්.

1966 සැප්තැම්බර් 24 වන දින හැන්සාඩ් වාර්තාවෙ තිබෙන පරිදි නියෝජ්‍ය කථානායකතුමා මෙන්න මෙසේ කියා තිබෙනව:

"MR. DEPUTY SPEAKER:

I must thank the hon. Members who participated in this—I will not say Debate—discussion, to give me assistance to make my Order. I must inform hon. Members that I have studied this matter, made my own notes, and even written down most of the authorities you have cited, but I have not made up my mind. That is why I wanted your assistance. All that I am concerned with, as the hon. Member for Dompe stated, is in arriving at a correct decision. I may make a mistake but I can assure you that whatever decision I shall arrive at will not be influenced by anybody and that that decision will be without fear or favour."—[OFFICIAL REPORT, 24th September 1966; Vol. 70, cc. 749-50.]

"මේක වාදයක් හැටියට පිළිගැනීමත් හරි නැහැ; නීති ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම වාදයක් වුවමනා නැහැ; නමුත් මට ආධාරයක් වශයෙන් මම තමුන් නාන්සෙලට මේ ගැන සාකච්ඡා කරන්න ඉඩ දුන්න. මම මේ අන්දමට තමුන් නාන්සෙලගෙ ආධාර ඉල්ලන්නෙ මේ පිළිබඳව තීරණයකට බහින්නයි. මම මේ ගැන පුද්ගලික ලෙසද කල්පනා කර තිබෙනව. මම මේ ගැන නොයෙකුත් කරුණු සටහන් කරගෙන තියෙනව. මම මේ සඳහා උපයෝගි වන පොත් පත් බලා තියෙනව." යන ආකාරයට එතුම කියා සිටිනව. එතුම මේ සඳහා ඉනිමගක් නැග්ගද, රාජ නීතිඥයකු සමු වුණාද, ඇටෝර්නි ජනරාල්ගෙන් ඇසුවද, මෙහි සිටින නීතිඥ ලේකම් මහත්වරු දෙදෙනා සමු වුණාද කියන්ට අපි දන්නෙ නැහැ. නමුත් උන්නැහෙ ඒව හංගන්නෙ නැහැ. "මම මේ පිළිබඳව බොහොම පොත් පත් බලා තිබෙනව; මම මේ ගැන කරුණු සොයා බලා තිබෙනව; මම තමුන්නාන්සෙලගෙ ආධාර ඉල්ලා සිටින්නෙ මේ පිළිබඳව තීරණයකට බසින්ට විතරයි" යනුවෙන් එතුම කියනව.

ඒකෙ තියෙන වරද මොකක්ද? එතුමා පොත් පත් බැලිය යුත්තෙ මෙම සාකච්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

නැහෙට කරුණු සටහන් කරගන්න බැරි ද? ඊට ඉස්සෙල්ල උන්නැහෙ එසේ සටහන් කරගෙන තියෙනවා. වගකීමක් තිබෙන අසුනක වාඩි වෙන එතුමට න්‍යාය පත්‍රයෙ සඳහන් වන යෝජනා සහ නීති පිළිබඳව අනිකුත් පණ්ඩිතවරු නීති ප්‍රශ්න ඉදිරිපත් කරන්ට වුවමනා නැහැ. උන්නැහෙත් පණ්ඩිතයෙක්. උන්නැහෙටත් පුළුවනි මේක නීතියට ඇතුළත් වෙනවද නැද්ද කියා බලන්න. අපට සහ තමුන්නාන්සෙලට කල්පනා වුණා වාගෙ උන්නැහෙගෙ කල්පනාව ටත් මේ උසස් අදහස් පැමිණෙන්ට ඇති. එතුමගෙ කල්පනාවට භාජන වෙන්ට ඇති, මේක නීති ප්‍රශ්නයට අදාළ නැද්ද යන කාරණය. එතුම මේ ගැන අපට වඩා කල්පනා කරනවා. එතුම කිසිවක් හංගන්නෙ නැහැ. "මම සොයා බැලුව; මම මේ සඳහා පොත් පත් කියවා බැලුව; තමුන්නාන්සෙට මේ ගැන කතා කරන්ට මම ඉඩ දුන්නෙ නියම තීරණයකට බැසීම සඳහායි" කියන දෙය එතුම කියනවා.

නමුත් දොම්පෙ ගරු මන්ත්‍රීතුමා ඇවිත් එතුම ගැන වෙනත් ආකාරයකට සඳහන් කරනවා. "එතුම සම්පූර්ණයෙන්ම පක්ෂපාතයි; එතුම එක පැත්තකට බරවයි ක්‍රියා කර තිබෙන්නෙ; එතුම මිනිත්තු පහෙන් කොහොමද මේ පොත් පත් සියල්ලම කියවා බැලුවෙ" යනුවෙන් උන්නැහෙ ප්‍රශ්න කරනවා. එම චෝදනාව කිසි විටෙක ඔප්පු කරන්ට බැහැ. මේ ගැන කල්පනා කළේ මේ ථීති ප්‍රශ්නය ඉදිරිපත් කළාට පසුව නොවේය කියා නියෝජ්‍ය කථානායකතුමා ප්‍රකාශ කරනවා. මේ පොත්පත් බැලුවෙ, මේ තීන්දුව පිළියෙළ කර ගත්තෙ, ඊට හුඟක් ඉස්සරින්ය කියා එතුමා කියනවා. නමුත් එම තීන්දුව හරිද වැරදිද කියා එතුමා තුළ සැකයක් තිබුණාය, ඒ නිසා තමුන්නාන්සේලාගේ අදහස් විමසුවාය කියා එතුමා වැඩිදුරටත් සඳහන් කරනවා. ඒ අනුව මේ තීන්දුව ථීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්ට ප්‍රථමයෙන් එතුමා පිළියෙළ කරගෙන තිබුණ බව පෙනී යනවා. එමනිසා එතුමාට විරුද්ධව ඉදිරිපත් කළ චෝදනා දෙක තුන එතැනින්ම අහෝසි වෙනවා.

ගරු කථානායකතුමනි, දීර්ඝ කථාවක් අවශ්‍යය කියා මා සිතන්නෙ නැහැ. අප කොපමණ කථා කළත් අර පොඩිඅප්පු හාමි මහතාගේ මරණය පිළිබඳව ඉදිරිපත් කළ යෝජනාව කුමන්ත්‍රණ නඩුවට අදාළද නැද්ද යන ප්‍රශ්නයේදී විරුද්ධ පක්ෂය හැමදාම වෙන විධියකටයි කල්පනා කරන්නෙ. මා කොපමණ කථා කළත් මගේ අදහස් මැද කොළඹ තුන්වන ගරු මන්ත්‍රීතුමාවත් (කෙනමන් මයා.) දොම්පේ ගරු මන්ත්‍රීතුමාවත් (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) පිළිගන්නෙ නැහැ. ඒ ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් කොන්ක්‍රීට් මෙන් සවි වී අවසානයි. නියෝජ්‍ය කථානායකතුමාටයි, තීන්දුවක් දෙන්න බලයක් තිබුණෙ. ඒ අනුව එතුමා තීන්දුවක් දී අවසානයි.

ඊට වඩා වැදගත් අදහස් උසාවිවලින් ඉදිරිපත් වෙනවා. ඊට වඩා වැදගත් තීරණ අපට ලැබෙනවා. 1962 කුමන්ත්‍රණ නඩුව සම්බන්ධයෙන් රාජාධිකරණය තීරණයක් දුන්නා. ඒ නඩුව සම්බන්ධයෙන් තමුන්නාන්සේලා ඉදිරිපත් කළ නීති සම්පූර්ණයෙන්ම අපේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධය කියා රාජාධිකරණය තීන්දු කළා. නමුත් රාජාධිකරණය දුන් ඒ තීන්දුව හරිය කියා මැද කොළඹ තුන්වන ගරු මන්ත්‍රීතුමාටත්, දොම්පේ ගරු මන්ත්‍රීතුමාටත් අප කොපමණ කිව්වත් එතුමන්ලා එය පිළිගන්නෙ නැහැ. දොම්පේ ගරු මන්ත්‍රීතුමා එදා ඉදිරිපත් කළ ඒ නීති වැරදිය කියා රාජාධිකරණය කොපමණ කිව්වත් ඒ ගරු මන්ත්‍රීතුමා එය පිළිගන්නෙ නැහැ. ඒ අදහස් කොන්ක්‍රීට් මෙන් සවි වී අවසානයි.

ඒ වාගේම අපට කිසිම කෙනෙකුට මඩ ගැසීමට වුවමනාවක් නැහැ. නියෝජ්‍ය කථානායකතුමා කෙලින් වැඩ කරන කෙනෙක්. එතුමා අපෙන් කිසිවක් බලා පොරොත්තු වෙන්නෙත් නැහැ. එදා ඉදිරිපත් කළ යෝජනාව කුමන්ත්‍රණ නඩුවට අදාළ නොවේය කියා එතුමා කල්පනා කළා නම් ඒ ගැන සාකච්ඡා කරන්ට එතුමා ඉඩ දෙනවා. එය කුමන්ත්‍රණ නඩුවට අදාළය කියා එතුමා කල්පනා කළා නම් ඒ ගැන සාකච්ඡා වීම වැළැක්වීමට එතුමාට යුතුකමක් තිබෙනවා. ඒ අනුව කල්පනා කළ නියෝජ්‍ය කථානායකතුමා එම යෝජනාව සාකච්ඡාවීම නැවැත්තුවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ජේ. ආර්. ජයවර්ධන]

ඊළඟට ප්‍රශ්න කළා එසේ නම් ඇයි එම යෝජනාව නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න ඉඩ දුන්නේ කියා. ඒක ගැන මම දන්නෙ නැහැ. ඇත්ත වශයෙන්ම එම යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළු කිරීමත් වැරදිය කියා මම කල්පනා කරනවා. එවැනි අවස්ථාවලදී කථානායතුමා හෝ නියෝජ්‍ය කථානායකතුමා හෝ නීතිඥ උපදෙස් ගැනීම යුතුයි. එම යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසුද නැද්ද යන්න පිළිබඳවත් සැකයක් තිබෙනවාය කියා නියෝජ්‍ය කථානායකතුමා පක්ෂ නායකයින්ගේ රැස්වීමකදී ප්‍රකාශ කළ බව මට මතකයි. කෙසේ හෝ එම යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළු වුණා. නමුත් අප රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කළත් නොකළත් එවැනි යෝජනාවක් ගැන සාකච්ඡාවක් කිරීමට ඉඩ නො දෙන්න එතුමාට යුතුකමක් තිබෙනවා. ඒ ආණ්ඩු පක්ෂයේ වාසියටවත් විරුද්ධ පක්ෂයේ වාසියටවත් නොවෙයි. මේ ප්‍රශ්නය මේ සභාවෙන් පිට මතු වන ප්‍රශ්නයක්. කුමන්ත්‍රණ නඩුවක් තිබෙනව.

1962 දීත් කුමන්ත්‍රණ නඩුවක් තිබුණ. ඒ කුමන්ත්‍රණ නඩුව සම්බන්ධයෙන් මේ ගරු සභාවේදී සාකච්ඡා කිරීමට සම්පූර්ණයෙන්ම ඉඩ දුන්නාය කියා දොම්පේ ගරු මන්ත්‍රීතුමා කිව්වා. ඒක සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. නමුත් එතුමා මේ ගරු සභාවට එදා ඉදිරිපත් කළ ධවල පත්‍රිකාව නැතිනම් "වයිට් පේපර්" එක ගැන නම් සාකච්ඡා කළා. ඒවාගේම එදා විශේෂ නීති ගෙනාව. රාජාධිකරණයේ තීන්දුවේ හැටියට කියනවා නම්, විත්ති කාරයින් වැරදිකාරයින් කරන්නට, එල්ලුම් ගහට යැවීමට නියම කරන්නට විශේෂ නීති ගෙනාව. අපි කිව්ව ඒක වැරදිය කියා. නමුත් නාන්සේලා එදා ධවල පත්‍රිකාව ඉදිරිපත් කළ නිසා, විශේෂ නීති ඉදිරිපත් කළ නිසා, අපි එදා ඒවා ගැන සාකච්ඡා කළා. ඇත්ත වශයෙන්ම අපි ඒ ගැන සාකච්ඡා කරන්ට බලාපොරොත්තු වුණේ නැහැ. අපි එසේ සාකච්ඡා කරන්නට ඉදිරිපත් වුණා නම් කථානායකතුමා එය වළක්වනවා ඇති.

බණ්ඩාරනායක ඝාතනය ගැනත් අපි සාකච්ඡා කළේ නඩුව දමන්න පළුම යෙනුයි. අගමැති ඝාතනය ගැන කරුණු විභාග කරගෙන යන අවස්ථාවේදී එවකට සිටි මාතලේ ගරු මන්ත්‍රීතුමාත් වර්තමාන යටියන්තොට මන්ත්‍රීතුමා වන එවකට රුවන්වැල්ලේ ගරු මන්ත්‍රීතුමාත් මෙම ගරු සභාවේදී ඒ පිළිබඳව කථා කළා. මගේ කල්පනාවේ හැටියට නම් එදා ඒ පිළිබඳව සාකච්ඡා කිරීම වැරදියි. නඩුවක් පවරන බව දන්නවා නම් ඒ නඩුව පවරන්නට ප්‍රථමයෙන් ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේ සාකච්ඡා පැවැත්වීම බ්‍රිතාන්‍ය නීතිය අනුව වැරදියි. එහෙත් එදා ඒ ගැන සාකච්ඡා වුණා. කෙසේ වෙතත් නඩුවක් පැවරුවාට පසුව නම් සාකච්ඡාවක් පැවැත්වීමට බැහැ.

1962 දී ඇති වුණු කුමන්ත්‍රණය ගැන සාකච්ඡා වුණේ ආණ්ඩුවෙන් ධවල පත්‍රිකාවක් ඉදිරිපත් කළ නිසයි; ඒ වගේම අලුත් නීතියක් ඉදිරිපත් කළ නිසයි. එසේ වුවත් විභාගය ගැන සාකච්ඡාවක් ඇති වුණේ නැහැ. දොම්පේ ගරු මන්ත්‍රීතුමා විසින් මතක් කරන ලද නිසා 1962 දී ඇති වූ කුමන්ත්‍රණ නඩුව ගැන වචනයක් දෙකක් කියන්නට ඕනෑ. ඒ කුමන්ත්‍රණ නඩුව ගැන සුප්‍රීම් උසාවියෙන් දුන් තීන්දුවෙහි මෙසේ සඳහන් වෙනවා. ඒ තීන්දුව ලැබුණේ 1965 අප්‍රේල් මාසයේ 6 වැනිදායි. මා මේ කියවන්නේ New Law Reports නම් වාර්තාවෙනුයි:

New Law Reports, vol. 67, page 247 :

"Although the police also played a part, it is apparent that Mr. Bandaranaike largely controlled the course of the inquiry."

මෙතැන "බණ්ඩාරනායක" යනුවෙන් සඳහන් කර ඇත්තේ එවකට සිටි මුදල් ඇමතිතුමාටයි.

"There was no legal basis for much that was done including the arrest of the fourth defendant and John Pulle that night."

අප ඒවා ගැන පාර්ලිමේන්තුවේදී විරුද්ධ වුණා.

"But in times of extreme urgency the State may be compelled by necessity to disregard for a time the ordinary safeguards of liberty in defence of liberty itself and to substitute for the careful and deliberate procedure of the law a machinery more drastic and speedy in order to cope with the urgent matter."

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

එදා ඒ කුමන්ත්‍රණය පිළිබඳව සැක කරනු ලැබූ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම ආදිය සම්බන්ධයෙන් බණ්ඩාර නායක මහතා ආණ්ඩුවේ ඇමතිවරයකු හැටියට නීතියට විරුද්ධව ක්‍රියා කළත් රාජ්‍යයක් පෙරළීමේ ක්‍රියාවක යෙදුණු ඒ හදිසි අවස්ථාවේදී ඒ අන්දමට කටයුතු කිරීමෙහි වරදක් නැති බව සුප්‍රීම් උසාවිය කියා තිබෙනවා. බණ්ඩාරනායක මහතා මුදල් ඇමතිවරයා වශයෙන් ඒ කුමන්ත්‍රණය පිළිබඳ විභාගය තමන් අතට ගෙන ක්‍රියා කළ පිළිවෙළ ගැන අප එදා විරුද්ධත්වය ප්‍රකාශ කළා. එදා අරලියගහ මන්දිරය පොලිස් ස්ථානයක් බවට පරිවර්තනය කර ගෙන තිබුණා. සැකකාරයන් ගෙන ආවේ ඇමති මණ්ඩලය ඉදිරිපිටටයි. සැකකාරයන්ගෙන් ප්‍රශ්න ඇසුවේද ඇමතිවරුනුයි. ඇමතිවරුන් ලැස්ති වෙලයි, ඒ අය හිරේට දැම්මේ. ඒ වගේම ඇමතිවරුනුයි, ඒ අය නිදහස් කෙළේ. කැබිනට් මණ්ඩලය නීති ගෙනවා. "උඹයි, උඹයි, උඹයි වැරදිකාරයෝ. උඹයි, උඹයි, උඹයි එල්ලුම් ගහට යනවා" කියා නීති ගෙනාවේ ඇමතිවරුනුයි. වාසනාවකට මෙන් ප්‍රිවි කවුන්සලය ඒ නීති අහෝසි කළා. කෙසේ වුවද එදා සිටි මුදල් ඇමතිතුමා නීතියට විරුද්ධව ක්‍රියා කළත් රාජ්‍යයට යම් හානියක් සිදුවන්නට යනවා නම්, යම් යම් උදවිය රාජද්‍රෝහී ක්‍රියාවක යෙදෙනවා නම් එබඳු හදිසි අවස්ථාවකදී නීතිය පැත්තකට දමා රජය අතට බලය ගැනීම වරදකැයි නොකියන බව සුප්‍රීම් උසාවිය සඳහන් කර තිබෙනවා.

එෆ්ජ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මහතාගේ නිර්භීතභාවය නිසා 1962 දී රජය පෙරළීමේ තැත වැරදුණා යයි සිතා එදා එතුමා ක්‍රියා කළ ආකාරය ගැන අපි ඒ මහතාට ප්‍රශංසා කරමු. හොඳයි, ඇයි අප සම්බන්ධවත් ඒ විධියට හිතන්නට බැරි? ඇයි අපත් ඒ මිම්මෙන් මනින්නේ නැත්තේ? 1962 දී සුදුසු යයි සලකා යම්කිසි ක්‍රමයක් අනුගමනය කළා නම් 1965 දී ඒ ක්‍රමය අනුගමනය කිරීම වැරදිද? 1962 දී රජය පෙරළීමේ උත්සාහයක් තිබුණා. 1965 දීත් රජය රෙළිමේ උත්සාහයක් තිබුණා. 1962 දී මෙන් 1965 දීද ඇමති මණ්ඩලය ඉදිරිපිටට දොම්පේ මුදලාලිත් උඩුගමත් කැඳවා ප්‍රශ්න කළා නම්, හිර භාරයට ගත්තා නම්, නිදහස් කළා නම් මොකද කියන්නේ? දොම්පේ මන්ත්‍රීතුමාට එවැනි වැඩ පිළිවෙළක් හොඳ නම් මට ඒක නරක ද? ඒකට උත්තරයක් දෙන්න.

රත්නායක මයා.
(திரு. ரத்னயக்க)
(Mr. Ratnayake)
එතකොට ගැහුවෙ නැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ගැහුවෙ නැහැ? තමුන්නාන්සෙ මේ පොත කියෙව්වද? ගැහුවෙ නැහැ, ලයිට් දැම්මා ඇහැට. මාස දෙකහමාරක් හිරේ හිටියා කිසිම පුද්ගලයකු දකින්නෙ නැතුව. බුද්ධරක්ඛිත එල්ලන්න නීතියක් ගෙනාවා මේ පාර්ලිමේන්තුවට. ඒ විධියේ ආණ්ඩුවක් තමයි, මේ විරුද්ධ පාර්ශ්වයෙන් ගෙනිච්චෙ. ඒ නීතිය තියෙනව, ගරු සී. පී. ද සිල්වා ඇමතිතුමාගෙ මේ ලාච්චුවෙ. පාර්ලිමේන්තුවට ඒ විධියෙ නීතියක් ගෙනාවා. නීතියෙන් මරන්න හැදුව. ඒක තමුන්නාන්සේලාට හොඳයි. අපට වැරදියි. මම කියන්නෙ නැහැ, එහෙම කරනවාය කියා.

මම කියන්න හැදුවෙ මේකයි. 1965 ජනවාරි මාසයේදී රජය පෙරළන්න කුමන්ත්‍රණයක් ඇති වුනාය කියා කල්පනා වුණා. ඒ ගැන විභාගය අපි අපේ අතට ගත්තෙ නැහැ. පොලීසියෙන් විභාග කළා. එක ඇමතිවරයෙක්වත් වාඩි වෙලා සාක්ෂි ඇහුවෙ නැහැ. පොලිසිය ඒ ගැන විභාග කරල දැන් නඩුව උසාවියට ඉදිරිපත් කර තිබෙනව. දොඩම්පෙ මුදලාලි තමුන්නාන්සෙල දැන් රහතන් වහන්සෙ කෙනකු හැටියට සලකනව. ඤානසීහ හාමුදුරුවන්ගෙන් අහන්න ඕනෑ, දොඩම්පෙ මුදලාලි ගැන. මුළු ගමම පොලිසියට ප්‍රශංසා කරනව, ඒ මනුෂ්‍යයා මැරුණාය කියා. [බාධා කිරීමක්] මැරුවාය කියා නොවෙයි, මැරුණාය කියා. ඇයි? තක්කඩියෙක් නිසා. [බාධා කිරීමක්] කව්ද ඒ කිව්ව. කව්ද ඒ කිව්වෙ?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
මම කියනව, ඒ කියලා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
තක්කඩිය කියන වචනය නරකද?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
නැහැ, තක්කඩිය වුනත් මරන්න අසිති යක් නැහැ. තමුන්නාන්සෙලාට.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
තක්කඩිය මරණ මිනිහ ඊට වඩා තක්කඩියා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
මැරුවය කිව්වෙ නැහැ. මැරුණු එක ගැන ඒ ගමේ මිනිස්සු සන්තෝෂයි කිව්ව.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
ඔය අනුව නම් හුඟක් හරිය එල්ලුම් ගහට යන්න ඕනෑ ඔය පැත්තෙ ඉන්න මිනිස්සු.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
තමුන්නාන්සෙගෙ දේශපාලන ප්‍රතිපත්තිය මැරීමයි.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
තමුන්නාන්සෙලා බලන්නෙ පුළුවන් නම් අපිව මරන්නයි.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
ඒ fපැසිස්ට් ක්‍රමය.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඒ ගැන අපි දෙන්න වාද වෙන්න වුවමනා නැහැ. විප්ලවය කියන්නෙ අහිංසක එකක්ද? එහෙම නැත්නම් ලේ වගුරුවන එකක්ද?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
මගේ පොත් කියවන්න.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
තමුන්නාන්සෙගෙ පොත් කියවන්න වුවමනා නැහැ, මම ලෙනින්ගෙ පොත් කිහිපයක් තියෙනවා.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
මම ලියල තියෙන පොත් කියවන්න.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඒව පුච්චල දමන්න ඕනෑ.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
තමුන්නාන්සෙ දේශපාලන හෝඩිය ඉගෙන ගන්න ඕනෑ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
මාක්ස් වාදය ගැන සාකච්ඡා කරන්න නොවෙයි, මම ලෑස්ති වෙන්නෙ දැන්. දොඩම්පෙ මුදලාලි මැරුණාය කියා, මැරුවාය කියා නොවෙයි, මැරුණාය කියා—සිංහල වචන දැන ගන්න—මුළු ගමම පොලීසියට ප්‍රශංසා කරනවා. ඇයි? උන්නැහේ තාක් කාලයෙක් නිසා; උන්නැහේ මැරවර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෙක් නිසා; උන්නැහේ බෝම්බ හදන නිසා. ඒවා මම කියන දේ නොවෙයි, ගිහිල්ලා හේන්පිටගෙදර ඤානසීහ හාමුදුරුවන්ගෙන් අහන්න. ඕවා ඔක්කොම එළියට එනව, සාකච්ඡා ඇති වුනා නම්.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

On a point of Order, he has just now mentioned one of the accused in the case. Whether that has any relation to the Debate or not, it should be ruled out of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I made a Ruling in the morning at the commencement of this Debate that no reference should be made to that case and all hon. Members who spoke have abided by that Order, and I would like the Hon. Minister of State too to abide by that Order.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මම පිළිගන්නව ඒක. මම වුවමනාවෙන්ම ඒක කිව්වෙ, නඩුවට අදාළ දේ කීම වැරදි බව පෙන්වන්න. තමුන්නාන්සෙල නැගිටල කියන්න, හරි නැහැ, කියා. මම පිළිගන්නව. මම මෙහාට එන්න ඉස්සෙල්ල කල්පනා කළා, ඔක කියනවය කියා. හදිසියෙන් කිව්ව දෙයක් නොවෙයි.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That is worse. He has deliberately defied your Order.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මම ඒක කිව්වෙ නීති ප්‍රශ්නයක් නංවසිද කියා බලන්න. තමුන්නාන්සෙගෙ තීරණය බලන්න. ඒකට මැද කොළඹ ගරු මන්ත්‍රීතුමා මාළුව වගේ නැගිබිඳ නැගිබිඳ නීති ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. තීරණයක් දුන්න, මා පිළිගන්නව. අන්න ඒකයි, ඒ යෝජනාව ගෙනාවම අපිත් කිව්වෙ. ඒක සම්පූර්ණයෙන් හරි. ඒ නඩුව ගැන කථා කිරීම වැරදියි. කිසිම විත්තිකරුවෙක් හෝ සාක්ෂිකරුවෙක් හෝ ගැන කථා කිරීම වැරදියි. නීති ප්‍රශ්නය ඉදිරිපත් කළාම තමුන්නාන්සෙ තීරණය දුන්නම මා කිව්වෙ නැහැ තමුන්නාන්සෙ පක්ෂපාතයි කියා. මා කිව්වෙ නැහැ තමුන්නාන්සේ වංකයි කියා. ඇයි එහෙම නම් තීරණයක් දුනන්ම අනික් පැත්තෙන් එහෙම කථා කරන්නෙ?

එතකොට 1962 කුමන්ත්‍රණයෙදි එහෙමයි ක්‍රියා කළේ. ඒව වැරදියි කියා අපි කිව්ව නිසා 1965 කුමන්ත්‍රණයෙදි අපි එහෙම ක්‍රියා කළේ නැහැ. එහෙම කෙරුව නම් ඒත් හරි. කැබිනට් මණ්ඩලයෙ වාඩි වෙලා මේ උදවිය ඔක්කොටම එන්ට කියල මේ උදවියගෙ සාක්ෂි අරගෙන මේ උදවිය හිරේ දමන්ට කටයුතු කළා නම් ඒත් හරි. දැන් විරුද්ධ පක්ෂය අපෙන් අහනව, මොනවද තමුසෙල කළේ කියා. අර මිනිහ හිරේ දැම්ම, මේ මිනිහ හිරේ දැම්ම, පොලීසියට මෙහෙමෙ කරන්ට ඉඩ දුන්න ආදි වශයෙන් කියනව. මම කියන්නෙ නැහැ, යමෙකුට පොලීසියෙන් ගැහැව්ව නම් ඒක හරි කියා. මම කියන්නෙ නැහැ, දොඩම්පෙ මුදලාලි තල්ලු කෙරුව නම් හරි කියා. ඒ විභාගය ගැන මේ ස්ථානයේ සාකච්ඡාවක් කිරීම වැරදිය කියා මා කියන්නෙ නැහැ. මම කියන්නෙ කුමන්ත්‍රණ නඩුවට අදාළ කරුණක් ගැන සාකච්ඡාවක් කිරීම වැරදියි කියලයි. මගේ තර්කය අන්න ඒකයි. කුමන්ත්‍රණ නඩුවට මේ යෝජනාව අදාළ නම් එය මෙතැන සාකච්ඡා කිරීම වැරදියි. මැද කොළඹ තුන්වෙනි මන්ත්‍රීතුමයි, නීති ප්‍රශ්නය ඉදිරිපත් කළේ මේ වෙලාවෙ. එහෙම නම් අපි මොකද නියෝජ්‍ය කථානායකතුමාට බණින්නෙ?

අපට මෙහිදී කල්පනා කරන්ට තිබෙන්නෙ එක ප්‍රශ්නයක් පමණයි: පොඩි අප්පුහාමි ගැන ඉදිරිපත් කළ යෝජනාව 1965 කුමණ්ත්‍රණ විභාගයට අදාළද කියන එකයි. ඒ ගැන අපි ගහ ගන්ට ඕනෑ නැහැ. තමුන්නාන්සෙල කියනව, අදාළ නැහැ කියල; අපි කියනව අදාළයි කියල. අපි දෙපැත්තම කියනව, අදාළ නම් මෙතැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ජේ. ආර්. ජයවර්ධන]

සාකච්ඡා කිරීම වැරදියි කියල. එච්චරයි. නියෝජ්‍ය කථානායකතුමා තීරණයක් දුන්න, ඒක අදාළයි කියා. ඉතින් එතැනින් අපි නවත්වන්ට ඕනෑ. ඒකට උන්නැහේ වංක මිනිහෙක්ය, මිනිත්තු 5 කින් මේව ඔක්කොම ලිව්වය, පොත් 50 ක් බැලුවය, ඉනිමගක් නැගල ගියාය, ආදිවශයෙන් දොම්පෙ මන්ත්‍රීතුමා සඳහන් කළා. දොම්පෙ මන්ත්‍රීතුමා මොනව හිතනවදැයි මා දන්නෙ නැහැ. මෙතැන ඇවිත් බොහොම නරක විධියට අපේ නියෝජ්‍ය කථානායතුමා ගැන කථා කළා. මා බොහොම සන්තෝෂයි, දකුණු කොළඹ වාමාංශික මන්ත්‍රීතුමා—මා දකුණු කොළඹ දක්ෂිණාංශික මන්ත්‍රීතුමා—අපේ නියෝජ්‍ය කථානායකතුමාට බොහොම ප්‍රශංසා කළා. අන්න එහෙම තමයි, කොළඹ මන්ත්‍රීවරු කථා කරන්නෙ. උන්නැහෙගෙ වංකකම ගැන, උන්නැහෙගෙ සමර්ථකම ගැන, උන්නැහෙගෙ පක්ෂපාතකම් ගැන කථා කිරීම මෙතැනට අදාළ නැහැ. තීරණය හරිද, වැරදිද කියන එකයි ප්‍රශ්නය. තමුන්නාන්සෙල කියනව වැරදියි කියල; අපි කියනව හරි කියල. එතැනින් අපි වාදය නවත්වන්ට ඕනෑ. එහෙත් පිටිසර පළාතකින් ආව පුද්ගලයකු වගේ නියෝජ්‍ය කථානායකතුමාට බැණීම දොම්පෙ ගරු මන්ත්‍රීතුමා වගේ නීතිඥයකුට යුතු වැඩක් නොවෙයි.

ටී. බී. එම්. හේරත් මයා. (වලපනේ)
(திரு. ரி. பி. எம். ஹேரத்—வளப்பனே)
(Mr. T. B. M. Herath—Walapane)

පිටිසර පළාත්වලින් එන අයට මොන වද අඩු?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

දොම්පෙ ගරු මන්ත්‍රීතුමාගෙ එක සිරිතක් තිබෙනව. උන්නැහේ යම් පුද්ගලයකුට බැනල, බැනල අවසාන වුණාට පසු, ඒ පුද්ගලයා උත්තර දෙන්ට නැගිට්ටාම පැනල දුවනව. ඒ පුද්ගලයා මේ පැත්තෙ ඉන්න කොටත් එහෙමයි. ඒ පැත්තට ගියාට පසුත් එහෙමයි. බොහොම ලොකුවට කථා කරනව, අපි වරදක් කරන්නෙ නැහැ කියා. එහෙත්, ඒ කෙලින් කථා කරන පුද්ගලයාගෙන් මා අහන්ට කැමතියි, උන්නැහේ සමග කැබිනට් මණ්ඩලයේ හිටපු ඇමතිවරයකුට සම්බන්ධ fපයිල් විරුද්ධ පක්ෂයට ලබා දුන්නෙ කවුද කියා. ගිරිදර මෝලෙ fපයිල් විරුද්ධ පක්ෂයට ලබා දුන්නෙ කවුද? දොම්පෙ මන්ත්‍රීතුමායි. ඔන්න ඔහොමයි, කෙළින් කථා කරන පුද්ගලයාගෙ හැටි. කෘෂිකර්ම ඇමතිතුමා හැටියට තමන් ළඟ තිබුණ fපයිල්, තමන්ගෙ කැබිනට් මණ්ඩලයෙ ඉන්න තවත් ඇමතිවරයෙක් පිළිබඳ fපයිල්, කෙළින්ම භාර දුන්න. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරු
(கௌரவ அங்கத்தவர்கள்)
(Hon. Members)

කාටද භාර දුන්නෙ? [බාධාකිරීම්]

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

විරුද්ධ පක්ෂයට. [බාධාකිරීම්] එහෙම පුද්ගලයෙක් කෙළින් කථා කරන්නෙ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

ඇයි එදා නොකිව්වෙ? [බාධාකිරීම්]

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

එදා කිව්වත්, අද කිව්වත් ඇත්ත ඇත්තයි, නැත්ත නැත්තයි. මම මීට වඩා කථා කරන්ට බලාපොරොත්තු වන්නෙ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

18 මාසයකට පස්සෙයි කියන්නෙ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

තවත් උදවිය මේ විවාදයට සහභාගි වීමට බලාපොරොත්තු වන නිසා මම මීට වඩා කථා කිරීම යුතු නැහැ. මම තමුන්නාන්සෙට මතක් කරන්ට කැමතියි. මේ යෝජනාවට අපි පක්ෂ වන්නෙ නැති බව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.47

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னகோன்)
(Mr. M. Tennakoon)

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය කථානායකතුමාට විරුද්ධව ඉදිරිපත් කර තිබෙන මේ විශ්වාස භංග යෝජනාවෙදි අපි නියෝජ්‍ය කථානායකතුමාට විරුද්ධව කථා කරන විට කථා කරන්නෙ, හලාවත මන්ත්‍රීතුමාටවත් ෂර්ලි කොරයා මහත්මයටවත් විරුද්ධව නොවෙයි. නියෝජ්‍ය කථානායකතුමා හැටියට එදා මේ ගරු සභාවෙදි ගත්ත තීන්දුව ඉතා වැරදි තීන්දුවක්ය යන කියමන ස්ථිර වී ඇති නිසයි, අපි නියෝජ්‍ය කථානායකතුමාට විරුද්ධව කථා කරන්නෙ.

ඒ වාගේම ගරු කථානායකතුමනි, රාජ්‍ය ඇමතිතුමාගෙන් අද ඔවැනි කථාවක් අහන්ට අපි බලාපොරොත්තු වුණේ නැහැ. අපි එතුමාගෙන් අහන්ට ඕනෑ, ඔය කාරණය සම්බන්ධව රාජ්‍ය ඇමතිතුමා මන්ත්‍රී මණ්ඩලයෙන් පිටස්තරව කළ ප්‍රකාශ මොනවද කියා. නියෝජ්‍ය කථානායකතුමා ගෙ තීන්දුවට විරුද්ධත්වය දක්වීමක් වශයෙන් පාර්ලිමේන්තු රැස්වීම් වර්ජනය කිරීමට තරම් තීරණයක් එදා විරුද්ධ පක්ෂය ගත්ත. පාර්ලිමේන්තු රැස්වීම් වර්ජනය කිරීමට තීරණය කළේ එදා විශ්වාස භංග යෝජනාවට නියෝජ්‍ය කථානායකතුමා අවස්ථාව සලසා නොදුන් නිසාය කියා විරුද්ධ පක්ෂය ප්‍රසිද්ධ ප්‍රකාශනයක් නිකුත් කළා. නමුත් රාජ්‍ය ඇමතිතුමා අතුරු මැතිවරණ කාලෙ ඒ කොට්ඨාශවලට ගිහින් කිව්වෙ මොකක්ද? "නින්දගම් පනතින් බේරෙන්ට විරුද්ධ පක්ෂය පාර්ලිමේන්තු රැස්වීම් වර්ජනය කරනව; අද පාර්ලිමේන්තුවට එන්නෙ නැහැ, නින්දගම් පනතට මූණ දෙන්ට බැරි නිසා" කියා එතුමා අතුරු මැතිවරණ රැස්වීම්වල කිව්වාය කියා ප්‍රවෘත්ති පත්‍රවල පළ වී තිබුණා.

අද දවසෙ රාජ්‍ය ඇමතිතුමා පුදුම දෙයක් කියනව. රාජ්‍ය ඇමතිතුමා කියනව, දෙඩම්පෙ මුදලාලි මැරීම සාධාරණය කියල.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
කොහෙද?

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னகோன்)
(Mr. M. Tennakoon)

ඔව්, දොඩම්පෙ මුදලාලි මැරීම සාධාරණය කියල එම පළාත්වාසින් සන්තෝෂ වෙනව කියල රාජ්‍ය ඇමතිතුමා කිව්ව. [බාධාකිරීමක්] ඒ අය පොලිසියට ප්‍රශංසා කරනවලු. ගම්මු එහෙම කියනව කියල රාජ්‍ය ඇමතිතුමා මෙතැනදි කිව්ව. පුදුම කථාවක්.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඔනෑ එකක් කියන්න.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னகோன்)
(Mr. M. Tennakoon)
ටිකක් වදිනකොට ඊදෙනව.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
නැහැ, නැහැ. ඕන එකක් කියන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණා කර කථා කරන්න. වැඩි වේලා වක් නැහැ.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னகோன்)
(Mr. M. Tennakoon)
එකක් මහජනයා ඉදිරියෙ කියනව; පාර්ලිමේන්තුවෙ තව එකක් කියනව. ඒ කෙසේ වෙතත් අපි කණගාටු වෙනව, ඒ අවස්ථාවේදි නියෝජ්‍ය කථානායකතුමා ගත්ත තීන්දුව ගැන.

නියෝජ්‍ය කථානායකතුමා කොහෙන් කරුණු රැස් කර ගත්තත්. ඒ කරුණු ඉතාම කෙටි කාලයක් තුලදී රැස්කර ගත්තාය කියා දොම්පෙ ගරු මන්ත්‍රීතුමා කියන්න යෙදුණා. රාජ්‍ය ඇමතිතුමා ඊට පිළිතුරු වශයෙන් කිව්වෙ, නියෝජ්‍ය කථානායකතුමා ඒ කරුණු සියල්ලම රැස් කර ගත්තෙ කාගෙන්වත් උදව්වක් උපකාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

යක් අරගෙන නොවේය, ඒ සියල්ලම උඩට හෝ නැග බලා ගන්නට එතුමාට පුළුවන්කම තිබුණය කියායි. නියෝජ්‍ය කථානායකතුමා එක් දහස් අට සිය ගණන් වල බ්‍රිතාන්‍යය පාර්ලිමේන්තු වාර්තා සොයන්නත් ගිහින් තිබෙනව. එතුමා තීන්දුව දීමේදී මුලින්ම කිව්වෙ 1904 බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු විවාදයකදී එහි කථානායකතුමා විසින් දුන් තීන්දුවක් ගැනයි.

රාජ්‍ය අමතිතුමා චෝදනා කළා දොම්පෙ මන්ත්‍රීතුමා පොත් රාශියක් ගෙනැවිත් තබා ගත්ත මිසක් කියෙව්වෙ නැත කියා. නමුත් මම විශ්වාස කරනව, ඒ පොත්වල ඇති අවශ්‍ය කොටස් කියවා පෙන්වන්නට මට මේ අවස්ථාවේදී පුළුවන්ය කියා. මෙය බොහොම ලෙහෙසියි. වැඩි වෙලාවක් යන වැඩක් නොවෙයි. 1904 බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තාවෙ 138 වෙනි කාණ්ඩයෙ 778 වෙනි තීරුවෙ ඒ තීන්දුව සම්බන්ධයෙන් පළ වී ඇති කොටස මම කියවන්න කැමතියි. ඒ තීන්දුව අවසාන කර තිබෙන්නෙ මෙහෙමයි:

"I cannot therefore treat this as a matter of urgency."

මෙය හදිසි කාරණයක් නොවන නිසා මේ ගැන සාකච්ඡා කිරීමට ඉඩ දෙන්න බැරි බවයි එසින් කියන්නෙ. I cannot therefore treat this as a matter of urgency." එතකොට ඒ තීන්දුව අනුව මෙහිදීත් තීන්දුව දීමෙන් පෙනෙනව, මේකත් හදිසි කාරණාවක් යයි සලකන්නට පුළුවන්කමක් නැතැයි තීරණය කර ඇති බව.

ඊ ළඟට නියෝජ්‍ය කථානායකතුමා 1934/35 හැන්සාඩ් වාතී පෙරළා බලා තිබෙනව. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු විවාදවල 299 වෙනි කාණ්ඩයෙ 204 වෙනි තීරුවෙ මොකක්ද කියා තිබෙන්නෙ? මෙන්න එදා තීන්දුව:

"It is not therefore a matter that can be raised under Standing Order 8."

ඒ පාර්ලිමේන්තුවෙ ස්ථාවර නියෝග වල 8 වෙනි ස්ථාවර නියෝගය යටතේ ඒ කාරණය සාකච්ඡාවට ගන්න බැරියයි එදා තීන්දුවක් දී තිබෙනව. ඒ අවස්ථාවෙදි ඒ යෝජනාවට ඉඩ දී නැත්තේ 8 වෙනි ස්ථාවර නියෝගය යටතේ එයට අවසර දීමට බැරි නිසාලු.—"It is not therefore a matter that can be raised under Standing Order 8." ඒ විධියටයි, ඒ තීන්දුව අවසන් කරන්නෙ. 8 වෙනි ස්ථාවර නියෝගය යටතේ ඒ කාරණය ගන්න බැරි නිසා ඒ යෝජනාවට ඉඩ දෙන්නෙ නැත කියන එකයි එසින් කියන්නෙ.

1898 පාර්ලිමේන්තු විවාද (හැන්සාඩ්) වාර්තා පොතේ 64 වැනි කොටසේ 868 වැනි පිටුවේ සඳහන් වන්නේ එක් අවස්ථාවක මැතිවරණයක් පවත්වා ඒ මැතිවරණයේ ප්‍රතිඵල අනුව නඩුවක් සම්බන්ධව පැමිණිලි කරන්න දවස් 21ක් තිබියදී එම කාරණය ගැන කථා කරන්න ඉඩ දෙන්න බැහැ කියා තිබෙන බවයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ඒක හරිද වැරදිද?

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)

ඒක හරි, නමුත් මෙතන තියෙන්නෙ ඒක නොවෙයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Please do not interrupt him because his time is limited.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

He has done a lot of research.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

He had six weeks to do it.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)

එහෙත් මෙතන සිදු වී තිබෙන්නෙ කුමක්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමා පර්යේෂණ කළා නම් ඒ සඳහා එතුමා උපයෝගි කර ගත් පොත් ටික සොයා ගන්න එක පමණයි අපට කරන්න තියෙන්නෙ. පර්යේෂණ කර අවසන් වී එතුමා එදා කිව්වෙ උසාවියකට ඉදිරිපත් කර තිබෙන වය කියන එකයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඒක හරිද වැරදිද?

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)

එපමණයි මා ඒ ගැන කියන්නෙ. එදා නියෝජ්‍ය කථානායකතුමා දුන් තීරණය අසාධාරණය කියා අප කල්පනා කරන නිසයි මෙය ඉදිරිපත් කළේ. එදා කී පරිදි එය විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ තිබුණු නිසා නොවන බව ඔප්පු කරන්නයි අපට වුවමනා කරන්නේ.

මේ යෝජනාවෙන් කෑල්ලක් අස් කළොත් මෙය කුමන්ත්‍රණ නඩුවට කිසිසේත් සම්බන්ධ කරන්න බැරි බව අපට කියන්න පුළුවනි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayawardene)
කෑල්ලක් අස් කළොත්?

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)
වචන කිහිපයක් අස් කළොත් පමණයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
කොහොමද වචන කීපයක් අස් කරන්නෙ?

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)

රහස් පොලීසියේ විශේෂ අංශය මගින් රහස් පොලීස් මධ්‍යස්ථානයේදී ප්‍රශ්න කරමින් සිටින අතර දෙම්පෙ මුදලාලි මරා දමන ලද හෙයින්ද——

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)
දෙඩම්පේ මුදලාලිද දෙම්පෙ මුදලාලිද?

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)

මට කියන්න වුවමනා කළේ මෙයයි: එදා මේ විශ්වාස භංග යෝජනාව සම්පූර්ණයෙන්ම ඉදිරිපත් වුණේ පොලීසිය කළ යම් යම් අකටයුතු සම්බන්ධව පොලීස් දෙපාර්තමේන්තුව ගැන යම් විවාදයක් කිරීමට පමණයි. එසේ නැතිව යම් පුද්ගලයෙකුට හෝ විනිශ්චයකාර මණ්ඩලයකට ඉදිරිපත් කර තිබුණු යම් කාරණයක් ගැන නොවෙයි. එම නිසා අපට ඒ අවස්ථාවේදී ඒ යෝජනාව ඉදිරිපත් කරන්නටත් සාකච්ඡාවට ගන්නටත් ඉඩ නොදීම ගැන අප කනගාටු වෙනව. එදා කළ ඒ අකටයුතු වැඩ කොටස නිසා අද පොලීසියේ හිතුවක්කාරකම්වලට ආණ්ඩුවෙන් උදවු ලැබෙනවාය යන හැඟීමක් පොලීස් දෙපාර්තමේන්තුවේ අයට හිතා ගැනීමට පුළුවන්කමක් ලැබී තිබෙනව.

එම්. සිවසිතම්පරම් මයා.
(திரு. எம். சிவசிதம்பரம்)
(Mr. M. Sivasithamparam)
නැගී සිටියේය——
எழுந்தார்——
rose——

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
නැගී සිටියේය——
எழுந்தார்.——
rose——

